අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2023

පටුන

පිටු අංකය

1. හැඳින්වීම 01

2. දැක්ම සහ මෙහෙවර 02

3. සභාපතිගේ සමාලෝචනය 03

4. මණ්ඩලයේ බලතල 04

5. මණ්ඩලයේ තොරතුරු සැකැස්ම 05

6. මණ්ඩලයේ සංයුතිය 06

7. මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය 07

8. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත කාලීන ප්‍රවණතා 12

9. සංස්ථා පාලනය 14

10. මූල්‍ය හා කාර්යසාධනය විශ්ලේෂණය 15

11. ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය 16

12. කාර්ය මණ්ඩල පුහුණු වාර්තාව 110

13. විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව 112

14. ආදායම් ප්‍රකාශය 114

15. ශේෂ පත්‍රය 115

16. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 117

17. විගණකාධිපති වාර්තාව 123

18. පසුගිය වර්ෂ 10ක වැදගත් මූල්‍යමය තොරතුරු 133

19. තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ සාරාංශය 135

ඇමුණුම I - ගිණුම්කරණ සටහන් 136

01. හැඳින්වීම



අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන අන්තරායදයක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර මෙම පනත 1986 අංක 41 හා 1990 අංක 21 දරන පනත්වලින් සංශෝධනය වී ඇත. මෙම මණ්ඩලය මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ඖෂධ අයුතු ලෙස භාවිතා කරන්නන්ට අදාළව වැළැක්වීමේ හා පාලනය කිරීමේ, ප්‍රතිකාර කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම හා සමාලෝචනය කිරීම හා එම ප්‍රතිපත්තියට අදාළව අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම භාර ප්‍රධාන ජාතික ආයතනය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වේ.

දැක්ම

"මත්ද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න සහ සුරක්ෂිත ජාතියක් ගොඩනැගීම"

මෙහෙවර

"අදාල සියලු ආයතන, ප්‍රජාව සහ පුද්ගලයින් බල ගැන්වීමෙන් ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ සාමකාමී සමාජයක් සහතික කිරීමට නායකත්වය ලබා දීම"

03. සභාපතිගේ සමාලෝචනය



2023 වර්ෂය ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධයෙන් සාර්ථක ඉදිරි පියවර කිහිපයක් තබන ලද වර්ෂයක් ලෙස හැඳින්විය හැකිය. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සේවාවන් ප්‍රජා මට්ටම දක්වා ව්‍යාප්ත කිරීමට විවිධ වැඩසටහන් සහ උපායමාර්ග කිහිපයක් මෙම වසර තුළ ආරම්භ කර ඇත. ප්‍රධාන වශයෙන් මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාර සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කටයුතු කරන නිලධාරීන් සංඛ්‍යාව වැඩි කර එම නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කරමින් නිවාරණ සහ ප්‍රතිකාර සේවාවන් ප්‍රජාව වෙත සම්ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත. මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශක්තිමත් කිරීම සහ නිවාරණ සහ ප්‍රතිකාර සේවාවන් ප්‍රජාව වෙත සපයන ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත්කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු ස්ථාපිත කිරීම සහ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා අතිරේක ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම උදෙසා ස්වේච්ඡා සම්පත්දායක සංචිත ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන්වල පවත්නා සීමිත ධාරිතාව සහ සම්පත් සැළකිල්ලට ගනිමින් ප්‍රජාව පාදක කරගත් විකල්ප ප්‍රතිකාර අවස්ථාවන් නිර්මාණය කරමින් ප්‍රතිකාර සේවාවන් සඳහා ඇති ප්‍රවේශය තහවුරු කිරීමට පියවර ගෙන ඇත. ඊට සමගාමීව මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට අවශ්‍ය විද්‍යාත්මක සේවාවන් සහ තාක්ෂණික සහාය ලබාදෙමින් සැපයුම අවම කිරීමේ ප්‍රවේශය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා කටයුතු කර ඇත. නිවාරණ සහ ප්‍රතිකාර විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වෙනත් ජාතික හා ජාත්‍යන්තර ආයතනවල සහයෝගය යටතේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර, පෙර වසරවලට සාපේක්ෂව මෙම වසර තුළ ධාරිතා සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රමුඛ අවධානයක් යොමුකරමින් කටයුතු කර ඇත.

ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සැසි නියෝජනය කරමින් සාක්ෂි මත පදනම්වූ ප්‍රජා ප්‍රතිකාර ප්‍රවේශය සම්බන්ධයෙන් සහ එහි ඵලදායීතාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාවේ අවධානය යොමු කරමින් අවශ්‍ය නිර්දේශ සහ පර්යේෂණ දත්ත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති අතර ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන සම්මුතීන් ප්‍රකාරව ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සහ දත්ත යොමු කිරීම සිදුකර ඇත. 2023 වර්ෂය තුළ සේවාවන් ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර මත පදනම්ව 2024 වර්ෂය තුළ "මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මහජන සහභාගීත්වය" යන තේමාව ඔස්සේ පුළුල් මහජන සහභාගීත්වයක් ලබාගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමි.

ශාක්‍ය නානායක්කාර
සභාපති

04. මණ්ඩලයේ බලතල

1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ, 7වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය සතු බලතල පහත පරිදි වේ.

(අ) අන්තරායදායක ඖෂධ අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීමට සහ පාලනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, ඒ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සහ ඒ ප්‍රතිපත්තිය පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ නිර්දේශ කිරීම.

(ආ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම පිණිස සාධාරණව අවශ්‍ය විය හැකි තොරතුරු සහ විස්තර පුද්ගලයන්ගෙන්, සංවිධානවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින් සහ රාජ්‍ය සංස්ථාවලින් ඉල්ලා සිටීම.

එසේ වුවද මේ ඡේදයේ විධිවිධාන යටතේ ලබාගන්නා ලද යම් තොරතුරක් හෝ විස්තරයක් සාමාජිකයකු විසින් හෙළිදරව් කිරීම, අධිකරණයක් විසින් එසේ කරන ලෙස නියම කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක හෝ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් අනුව කටයුතු කිරීම සඳහා වූ අවස්ථාවක හෝ මිස කරනු නොලැබිය යුතුය.

(ඇ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දේශීය සහ විදේශීය ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග සහ ප්‍රදාන ලබා ගැනීම.

(ඈ) අන්තරායදායක ඖෂධ වැළැක්වීමෙහි සහ පාලනයෙහි නිරත නියෝජිතායතනවල කටයුතු ඒකාබද්ධ කිරීම.

(ඉ) ඖෂධවලට වහල් වූ තැනැත්තන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපන ක්‍රියාමාර්ග නංවාලීම සහ ඖෂධ අයුතු ලෙස භාවිත කිරීම හා වැළැක්වීමේ ජාතික අධ්‍යාපන වැඩ පිළිවෙලවල් ළමයින් සහ වැඩිහිටියන් සඳහා පවත්වා ගෙන යාම.

(ඊ) අන්තරායදායක ඖෂධ අයුතු ලෙස භාවිත කිරීමේ පැවැත්ම, හේතුසාධක සහ නීතිමය, වෛද්‍ය, සමාජ, සංස්කෘතික සහ ආර්ථික බලපෑම් පිළිබඳව පර්යේෂණාත්මක අධ්‍යයන භාරගැනීම හා පවත්වාගෙන යාම.

(උ) ඖෂධ පාලන කටයුතුවලට සම්බන්ධ ජාතික, ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර සංවිධාන සහ නියෝජිතායතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම.

05. මණ්ඩලයේ තොරතුරු සැකැස්ම

ආයතනයේ නම	:	අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
නෛතික වපුහය	:	1986 අංක 41 හා 1990 අංක 21 දරන පනත්වලින් සංශෝධිත 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

තොරතුරු ලබාගැනීම සඳහා

ලිපිනය	:	අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය
දුරකතන අංකය	:	011 2868794 - 6
ෆැක්ස්	:	011 2868791/2, 011 2869805
විද්‍යුත් තැපෑල	:	mail@nddcb.gov.lk
ජාල අඩවිය	:	www.nddcb.gov.lk
විද්‍යුත් ජාල	:	facebooknddcb.gov.lk
විගණනය	:	විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය
නිල බැංකුව	:	ලංකා බැංකුව

06. මණ්ඩලයේ සංයුතිය

1986 අංක 41 දරන පනතින් සංශෝධනය වූ 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 3(1) වගන්තිය පරිදි මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

අ. අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු, මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු එක් සාමාජිකයෙකුගෙන් සහ වෙනත් සාමාජිකයන් තිදෙනෙකුගෙන් ;

ආ. අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඇ. පොලිස්පතිවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඈ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඉ. ප්‍රධාන රේගු අයකැමිවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඊ. ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

උ. ආයුර්වේද කොමසාරිස්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

සහ

* භාණ්ඩාගාර නියෝජිතයෙකු ද මණ්ඩලයේ රැස්වීම සඳහා සහභාගී වේ.

මාණ්ඩලීය සාමාජිකයන්

01. ශාක්‍ය නානායක්කාර මහතා
සභාපති
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
383, කෝට්ටේ පාර,
රාජගිරිය

02. මහාචාර්ය අනුලා විජේසුන්දර මහත්මිය
142/2 ඒ,
විජයකුමාරතුංග මාවත,
කොළඹ 05
(පත්කළ සාමාජික)

07. ඒ. උදයපාල මහතා
ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ,
සමාජ ආරක්ෂණ ඒකකය
ශ්‍රී ලංකා රේගුව
40, කෙලින් වීදිය, කොළඹ 11
(නිල බලයෙන් පත් වූ සාමාජික)

08. සන්ධ්‍යා රාජපක්ෂ මහත්මිය
නියෝජ්‍ය රජයේ රස පරීක්ෂක
රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල
(නිල බලයෙන් පත් වූ සාමාජික)

03. නීතීඥ වරුණ ජයසුන්දර මහතා
නියෝජ්‍ය පොලිස්පති
අණදෙන නිලධාරි
විශේෂ කාර්ය බලකාය
කොළඹ 07
(පත්කළ සාමාජික)

04. සමන් දිසානායක මහතා
අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන)
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, බත්තරමුල්ල
(පත්කළ සාමාජික)

05. ප්‍රියන්ත වීරසූරිය මහතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
අපරාධ හා රථ වාහන
අපරාධ බුද්ධි විශ්ලේෂණ හා නිවාරණ
කොට්ඨාශය
අංක 145, ප්‍රධාන වීදිය, බත්තරමුල්ල
(නිල බලයෙන් පත් වූ සාමාජික)


06. වෛද්‍ය එස්. සී. වික්‍රමසිංහ මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
බෝ නොවන රෝග ඒකකය
සෞඛ්‍ය අමාත්‍යාංශය
කොළඹ 10
(නිල බලයෙන් පත් වූ සාමාජික)

09. ආචාර්ය ධම්මික අබේගුණවර්ධන මහතා
ආයුර්වේද කොමසාරිස් ජනරාල්
ආයුර්වේද දෙපාර්තමේන්තුව
පරණ කොට්ටාව පාර,
නාවින්න, මහරගම
(නිල බලයෙන් පත් වූ සාමාජික)

10. එස්. කේ. කුලතුංග මුදලි මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා)
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල
(නිල බලයෙන් පත් වූ සාමාජික)

11. ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙනවිය
භාණ්ඩාගාර නියෝජිත
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍යාංශය
කොළඹ 01

07. මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය



2023.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 374 හා තත්‍ය සේවක සංඛ්‍යාව 205 කි.

මණ්ඩලයේ විධායක කාර්ය මණ්ඩලය

අංකය	නම	තනතුර	අධ්‍යාපන සුදුසුකම්
1.	ශාක්‍ය නානායක්කාර මහතා	සභාපති 2022.10.12 වන දින පත් කර ඇත.	නීතීඥ, සොලිසිටර් (එංගලන්තය)
			මනෝ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය
			කම්කරු අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය
			ශාස්ත්‍රපති උපාධිය - කැළණිය විශ්වවිද්‍යාලය
2.	එස්.එම්.බී. නන්දා කුමාරිහාමි මහත්මිය	අධ්‍යක්ෂ (පර්යේෂණ)	දර්ශනපති උපාධිය (MPhil) සමාජ විද්‍යාව - කැළණිය විශ්වවිද්‍යාලය
		අධ්‍යක්ෂ ජනරාල් (රාජකාරී ඉටුකරන) 2023.04.13 දින සේවයෙන් විශ්‍රාම ගොස් ඇත.	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (MSSC) උපාධිය - කැළණිය විශ්වවිද්‍යාලය
			සමාජ විද්‍යාව හා මානව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
			උපදේශනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා පදනම් ආයතනය
3.	සකුණිකා ඩී. සුමතිපාල මහත්මිය	අධ්‍යක්ෂ පරිපාලන (වැඩ බලන) 2023.01.11 වන දින පත් කර ඇත.	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - මහජන ආරක්ෂක අමාත්‍යාංශය
4.	ඩී.එස්. සමරවික්‍රම මහතා	අධ්‍යක්ෂ මූල්‍ය (වැඩ බලන) 2023.01.02 වන දින පත් කර ඇත.	ප්‍රධාන ගණකාධිකාරී - මහජන ආරක්ෂක අමාත්‍යාංශය
5.	ඒ.එච්. ගයනි කේ. උපසිරි මෙය	මණ්ඩලීය ලේකම් නීති/නිලධාරී (වැඩ බලන) 2023.01.20 වන දින පත් කර ඇත.	නීති නිලධාරී - මහජන ආරක්ෂක අමාත්‍යාංශය

6.	ඩී.පී.එම්. ගමගේ මහත්මිය	අභ්‍යන්තර විගණක	සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
			විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
			AAT(SL) - ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ ශිල්පීය ආයතනය
7.	ඒ.ඩබ්.ඒ. කුමාරි මහත්මිය	සහකාර අධ්‍යක්ෂ - පරිපාලන	ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
			විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
			මත්ද්‍රව්‍ය දුර්භාවිත පිළිබඳ කළමනාකරණ ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය
8.	ප්‍රදීප් කුමාර කොහොලානේගෙදර මහතා	සහකාර අධ්‍යක්ෂ - නිවාරක අධ්‍යාපන හා පුහුණු	ජාත්‍යන්තර කටයුතු අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - උප්සලා විශ්වවිද්‍යාලය (ස්වීඩනය)
			ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
			උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDC) - කොළඹ විශ්වවිද්‍යාලය
			මත්ද්‍රව්‍ය උපදේශනය පිළිබඳ ජාත්‍යන්තර සහතිකය - එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව කොළඹ ක්‍රමය
9.	ජී.ආර්. ගුණවර්ධන මහතා	සහකාර අධ්‍යක්ෂ - නාමෝද්දිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කැළණිය විශ්වවිද්‍යාලය
			සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය - කැළණිය විශ්වවිද්‍යාලය
10.	ටී.කේ.ආර්. දිසානායක මහත්මිය	සහකාර අධ්‍යක්ෂ	රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය

11.	ඒ.ටී. දර්ශන මහතා	සහකාර අධ්‍යක්ෂ - පර්යේෂණ	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කැලණිය විශ්වවිද්‍යාලය
			සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
			මත්ද්‍රව්‍ය දූර්භාවිත පිළිබඳ කළමනාකරණ ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය
12.	කේ.වී. රංජිත් වික්‍රමසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ - විද්‍යාත්මක පර්යේෂණ (වැඩ බලන) 2023.07.04 වන දින පත්කර ඇත.	රසායනාගාර තාක්ෂණ පිළිබඳ ඩිප්ලෝමා/ රසායන විද්‍යා උපාධි පාඨමාලාව අංක 01 - ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය
			පරිගණක යෙදුම් පිළිබඳ ඩිප්ලෝමාව - සොලරීස් පරිගණක අධ්‍යාපන ආයතනය

08. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දූර්භාවිතය ආශ්‍රිත කාලීන ප්‍රවණතා


මෙම සාරාංශ වාර්තාව මගින් මත්ද්‍රව්‍ය ආශ්‍රිත ප්‍රවණතා, මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් සහ මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරිත්වය සඳහා ප්‍රතිකාර ලබන්නන් පිළිබඳ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරනු ලබයි. ඵලදායි උපායමාර්ග සංවර්ධනය කිරීම සඳහා මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් සහ ප්‍රතිකාර වලට ඇතුළත් කිරීම් අධ්‍යයනය කිරීම ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම සඳහා වැදගත් වේ.

නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද වැටලීම් සංඛ්‍යාව සහ අදාළ මත්ද්‍රව්‍ය ප්‍රමාණ පහත සාරාංශගත කර ඇත.

මත්ද්‍රව්‍ය වර්ගය	අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව	ප්‍රතිශතය (%)
හෙරොයින්	66,142	40.8
ගංජා	68,458	42.2
කොකේන්	118	0.1
හෂීස්	136	0.1
මෙතැම්පිටමින්	26,096	16.1
මනෝවර්තක ඖෂධ	1,138	0.7
එකතුව	162,088	100.0

(මූලාශ්‍රය : පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය - 2023)

2023 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 162,088 කි. එය 2022 වර්ෂය හා සසඳන කළ 6% ක වැඩිවීමකි.



(මූලාශ්‍රය : පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය - 2023)

මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම් සලකා බැලීමේදී වැඩිම අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බස්නාහිර පළාතෙනි. එය 94,760 කි. දිස්ත්‍රික්ක මට්ටමින් බලන කළ අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව 67,393 ක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.


2023 වර්ෂයේ මත්ද්‍රව්‍ය වැටලීම් වලදී අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණ පිළිබඳ සාරාංශය පහත ඉදිරිපත් කර ඇත.

මත්ද්‍රව්‍ය වර්ගය	අත්අඩංගුවට ගත් ප්‍රමාණය (kg)
හෙරොයින්	850.749
ගංජා	10,220.462
කොකේන්	25.546
හෂීස්	274.481
මෙතැම්පිටමින්	83.247

(මූලාශ්‍රය : පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය - 2023)

මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පුද්ගලයින් ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් සඳහා යොමු කිරීම හරහා මත්ද්‍රව්‍ය අනිසි භාවිතය හා සම්බන්ධ හානිය අවම කිරීමට ඵලදායී ප්‍රතිකාර ප්‍රවේශයන් වැදගත් වේ.

ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබයි. 2023 වර්ෂයේ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ සේවාලාභීන් 1,894 දෙනෙක් ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබාගෙන ඇත. එම සේවාලාභීන්ගෙන් 757 (40.0%) දෙනෙක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන්ද, 370 (19.5%) රාජ්‍ය නොවන සංවිධානවලින්ද, 762 (40.2%) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන්ද ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබාගෙන ඇති අතර එම සේවාලාභීන්ගෙන් බහුතරයක් (29.6%)ක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආයතනගතවූවන් ය.



(මූලාශ්‍රය : මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය - 2023)

ප්‍රතිකාර ලබාගත් පුද්ගලයන්ගෙන් 35%ක් අවුරුදු 30 හෝ ඊට වැඩි පුද්ගලයින් වෙති. 2022 වර්ෂය හා සැසඳීමේදී 2023 වර්ෂය තුළ ප්‍රතිකාර සඳහා යොමුවූ සේවාලාභීන් සංඛ්‍යාව 5% කින් අඩු වී ඇත.

09. සංස්ථා පාලනය

අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 6(3) වගන්තියට අනුව මණ්ඩලය අවම වශයෙන් මසකට එක් වරක් හෝ රැස් විය යුතුය.

අනු කමිටු

1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 8වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පවරනු ලැබිය හැකි බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යය ඉටු කිරීම භාර කරනු ලැබිය යුතු යම් අනුකාරක සහා මේ පනතේ කාර්ය සඳහා මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකිය.

මේ ආකාරයට පත්කරන ලද පහත අනු කමිටු 2023 වර්ෂයේදී ක්‍රියාත්මක විය.

1. 2008 අංක 1 දරන මාදක සහ මනෝවර්ථක ඖෂධ නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ අනුකමිටුව

2. 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ අනු කමිටුව

10. මූල්‍ය හා කාර්යසාධන විශ්ලේෂණය

	2023	2022	වෙනස	ප්‍රතිශතය	
රජයේ පුනරාවර්තන ප්‍රදාන	263,717,000.00	234,850,000.00	28,867,000.00	10%	වැඩිවීම
වෙනත් ආදායම් (සටහන 2)	25,135,091.38	9,634,530.52	15,500,560.86	61%	වැඩිවීම
මුළු වියදම	290,750,055.06	292,837,266.19	2,087,211.13	1%	අඩුවීම

11. ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය

11.1 නිවාරක, අධ්‍යාපන හා පුහුණු අංශය

විද්‍යාත්මක වූ නිවාරණ අධ්‍යාපනය ඔස්සේ දරුවන් හා යෞවනයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වළකාලීම, පළමු අත්දැකීම හැකිතාක් පමා කිරීම හා පුද්ගලයකු මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතාවයකින් වළක්වාලීමට කටයුතු කිරීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ සමස්ත වැඩසටහන්වල කේන්ද්‍රීය ඉලක්කයයි.

දරුවන්ගේ හා තරුණයින්ගේ පූර්ණ විභවත්වය මතුකරලමින් ඔවුන් හට සෞඛ්‍යමත් හා ස්වස්ථායී බවින් යුක්ත සමාජ පරිසරයක් තුළ, තම කාර්යයන් සමාජ ප්‍රගමනයට ඉවහල් වන පරිදි ඉෂ්ට කර ගනිමින් සංවර්ධන අවකාශ උදාකරලීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ උත්සාහයයි.

1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 7 (ඉ) වගන්තිය යටතේ පවරා දෙන ලද බලතල ප්‍රකාරව රට තුළ මෙකී කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාංශයේ නිවාරණ ප්‍රමිතීන් අනුගමනය කරමින් ප්‍රධාන දහරා හයක් (6) ඔස්සේ තම වැඩසටහන් හසුරවනු ලබයි.

01. පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය, අධ්‍යාපනය හා පුහුණුව.
02. තාරුණ්‍යය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය, අධ්‍යාපනය හා පුහුණුව.
03. පවුල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය, අධ්‍යාපනය හා පුහුණුව.
04. වැඩ බිම් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය, අධ්‍යාපනය හා පුහුණුව.
05. මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය, අධ්‍යාපනය හා පුහුණුව.
06. පරිසර පාදක මත්ද්‍රව්‍ය නිවාරණය, අධ්‍යාපනය හා පුහුණුව සමඟින් මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිපත්ති සම්පාදනය.

ඉහත සඳහන් කරන ලද දහරාවන් හය රට තුළ සාධනය කරගනු වස් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව එය වසර පහක ඒකාබද්ධ සැලසුමකට ද යටත් කර ඇත. මේ සියලු කාර්යයන් එක්සත් ජාතීන්ගේ සංවිධානය 2030 වසර දක්වා ඉදිරිපත් කරන ලද තිරසර සංවර්ධන ඉලක්ක ද සමඟින් සම්මිශ්‍රනය කර ගෝලීය ප්‍රමිතීන්ට අනුගතව සැපයීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ වගකීමයි. ඒ අනුව තිරසර සංවර්ධන ඉලක්ක 3.5 (මත්ද්‍රව්‍ය හා හානිකර මධ්‍යසාර භාවිතය වළක්වාලීම සහ ප්‍රතිකාරය), තිරසර සංවර්ධන ඉලක්ක 5.1 (සියලුම කාන්තාවන් සහ ගැහැණු දරුවන් වෙත සිදුවන සෑම ආකාරයකම වෙනස්කම් පිටුදැකීම), හා ඉලක්ක 6.b (වෙනස්කම් වලින් තොරව සැමට නීතිය සමානව ක්‍රියාවේ යෙදවීම) යන තිරසර සංවර්ධන ඉලක්ක වෙත ද අනුගත වී ඇත.

ඉහත දහරා හය ඔස්සේම ක්‍රියාත්මක වැඩසටහන් උප විෂය 32ක් තුළ බෙදා දක්වා ඇති අතර මෙම වාර්ෂික වාර්තාව තුළ ඒවා සංක්ෂිප්තව සහ එක එල්ලේ වටහා ගත හැකි ආකාරයට හකුළුවා දක්වා ඇත. 2023 වර්ෂය, ඉකුත් වර්ෂයන් හා සසඳන කළ තරමක සාමකාමී හා රට තුළ පැවති

වාතාවරණයන් යහපත් වූ තත්ත්වයක් පැවතීම මත ඉලක්කගත වැඩසටහන් හා ඉලක්කගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව ද අභිබවා යාමක් සිදු වූ වර්ෂයකි. කෙසේ වුව ද ප්‍රමුඛ කාර්යය සාධක දර්ශකය සාධනය කර ගැනීම අතින් 2023 වර්ෂය තුළ අනුෂාංගික උපවිෂය දහරා බහුතරයක 100% කට වඩා වැඩි අගයක් වාර්තා කර ගැනීමට හැකි වීම සතුටට කරුණකි.

11.1.1 පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය අධ්‍යාපනය හා පුහුණුව

මෙම වර්ෂය තුළ ද පාසල් දරුවන්ගේ මෙතැම්ෆෙටමයින් භාවිතය, ගංජා හා දුම් නොනඟින දුම්කොළ භාවිතය පිළිබඳ අර්බුදය ඉදිරියට පැමිණිය ද සාර්ථකව ඒවා වළක්වාලීමටත්, ගුණාත්මක හා ප්‍රමාණාත්මක අධ්‍යාපනයක් තුළින් දරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා ඒ හා සබැඳි ආකල්පමය වෙනසක් වෙනුවෙන් කටයුතු කිරීමටත් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයට හැකි විය. මත්ද්‍රව්‍ය පිළිබඳව දරුවන් තුළ වූ ප්‍රතිරූපය බිඳ හෙලීම, එය ශූන්‍ය හෝ ඍණ ප්‍රතිරූපයක් දක්වා පරිවර්තනය කරලීම, මත්ද්‍රව්‍ය කර්මාන්තය මේ වෙනුවෙන් ක්‍රියා කරන ස්වභාවය අවබෝධ කර ගනිමින් ක්‍රියාකාරකම් දියත් කිරීම, මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ කායික, මානසික, සමාජයීය හා ප්‍රජා දැනුවත් භාවයන් ඉහළ දැමීම, අධ්‍යාපනික ඉලක්ක සාධනයට ඉන් ඇති කරන බාධාවන් වැනි බොහෝ කරුණු මෙන්ම, නිවාරකයෙකු ලෙස පාසල් දරුවන් ක්‍රියා කළ යුත්තේ කෙසේ ද? යන කරුණු සමාජගතකරණයේ දී නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය ඉදිරියට පැමිණි වර්ෂයක් ලෙස 2023 දැක්විය හැක.

11.1.1.1 පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය අධ්‍යාපනය හා පුහුණු වැඩසටහන්

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ රජයේ පාසල් 10,156ක් පවතින අතර ඉන් 396ක් ජාතික මට්ටමින් ද 9,750ක් පළාත් පාසල් යන වර්ගීකරණය තුළ ද ක්‍රියාත්මක වෙයි. මෙම පාසල් තුළ අධ්‍යාපනය ලබන දරුවන් සංඛ්‍යාව මිලියන 4.2ක් වන අතර ගුරුවරුන් සංඛ්‍යාව 235,924කි. පිරිවෙන් පාසල් ද ඊට අයත් වන අතර 104ක් වූ පුද්ගලික පාසල් තුළ ද සිසුහු 127,968දෙනෙක් අධ්‍යාපනය ලබති.

ඊට අතිරේකව 1 AB පාසල් ලෙස 1,011ක්, 1C පන්තියේ පාසල් 1,941ක් දෙවන මාදිලියේ පාසැල් 3,226ක් හා තුන්වන මාදිලියේ පාසල් 3,968ක් ද වෙයි. තවදුරටත් පිරිමි විද්‍යාල ලෙස පාසල් 146ක්, කාන්තා විද්‍යාල ලෙස පාසල් 240ක් හා මිශ්‍ර පාසල් ලෙස පාසල් 9,760ක් ද වර්ගීකරණයට ලක්වෙයි.

පාසල් වැඩසටහන් ලෙස නිවාරණ අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීමේ දී සිසුන් ගේ සංවර්ධන අවධිය තීරණාත්මක වූවකි. ඒ අනුව රජයේ පාසල්වල ශ්‍රේණියට අනුගතව වර්ග කළහොත් එම පාසල් වසර 1-5 අතර පාසල් 3,983ක් ද, වසර 1-8 දක්වා පාසල් 75ක් ද, වසර 1-11 අතර පාසල් 3,206ක් ද, වසර 1-13 අතර පාසල් 1,975ක් ද, වසර 6-11 අතර පාසල් 20ක් ද, වසර 6-13 අතර පාසල් 977ක් ද වෙයි.

නිවාරණ අධ්‍යාපනය විද්‍යාත්මක පදනමකින් ක්‍රියාත්මක කිරීමේ දී සෑම පාසල් දරුවෙකුම එක ලෙස වැදගත් වන නමුත් වැඩසටහන් වල තීව්‍ර බව 6වන ශ්‍රේණියේ සිට ඉහළට ඉතා වැදගත් වෙයි. පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ හා අධ්‍යාපන වැඩසටහන් වල ඉලක්කය වූයේ :

01. මත්ද්‍රව්‍ය සම්බන්ධව පාසල් දරුවන් තුළ ගොඩනැගෙන ධනාත්මක ප්‍රතිරූපය සෘණාත්මක හෝ ශූන්‍ය ප්‍රතිරූපයක් බවට පත් කරමින් මත්ද්‍රව්‍ය තුළ ඇති හිස් බව දැකීමට අවශ්‍ය සංජානනික වෙනස ඇති කිරීම.

02. මෙම සංජානනික වෙනස ඔස්සේ පාසල් දරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වැළැක්වීම හා ඔවුන් සමපදස්ත අධ්‍යාපන හා නිවාරණවේදීන් ලෙස කටයුතු කිරීමට යොමු කිරීම.

03. පාසල් පරිසරය හා පන්ති කාමරය පූර්ණ ඉගෙනුම් හා කුසලතා ආකල්ප වර්ධනයට අවශ්‍ය පරිසරයක් බවට පත් කර ගැනීම වැනි කරුණුවේ.

මේ අනුව 2023 වර්ෂය තුළ පාසල් නිවාරණ අධ්‍යාපන වැඩසටහන් 600ක් සැලසුම් කරන ලද අතර ඒ අගය 998 දක්වා වර්ධනය විය. එය අපේක්ෂිත ඉලක්කවල 166.33%ක වර්ධනයකි. ඒ අනුව මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ අධ්‍යාපනය නතුකරගත් ශිෂ්‍ය සංඛ්‍යාව 172,672ක් විය. වසර පහක ප්‍රගති සමාලෝචනය විශ්ලේෂණය කරන කළ මෑත කාලයේ ඉහළම ප්‍රගතිය 2023 වර්ෂය තුළ සටහන්ව ඇත.

පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	500	500	500	500	600
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	390	79	239	763	998
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	78%	15.8%	47.8%	152.6%	166.33%
ඇස්තමේන්තුගත ශිෂ්‍ය සංඛ්‍යාව	130,000	130,000	130,000	200,000	140,000
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව	79,863	15,665	39,837	129,848	172,672
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	61.43%	12.05%	30.64%	64.92%	123.34%

(11.1.1.1 වගුව)

11.1.1.2 ජාත්‍යන්තර පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය අධ්‍යාපනය හා පුහුණුව

ශ්‍රී ලංකාව තුළ පුද්ගලික අංශය විසින් මෙහෙයවන පාසල් 104ක් තුළ සිසුන් 127,968 දෙනෙකු අධ්‍යාපනය හදාරන අතර, ඔවුන් මුහුණ දෙන සූක්ෂම පරිසර ආකෘතියේ පාසල් පද්ධතිය සාමාන්‍ය පාසල් පරිසර පද්ධතියෙන් තරමක් වෙනස් බවක් ගනියි. ඒ නිසාවෙන් පුද්ගලික හා ජාත්‍යන්තර පාසල් සිසුන් වෙත මත්ද්‍රව්‍ය නිවාරණය හා අධ්‍යාපනය පිළිබඳ පණිවිඩය තරමක වෙනස් ආකෘතියකින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලද අතර මෙහි ගුණාත්මක ප්‍රවර්ධනය දරුවන්ගේ මත්ද්‍රව්‍ය සම්බන්ධ ධනාත්මක ආකල්ප හා ප්‍රතිරූප නිශේධනය කිරීමට අතිරේකව, මත්ද්‍රව්‍ය භාවිතයේ දිගු කාලීන, මධ්‍ය කාලීන හා කෙටි කාලීන කායික, මානසික, සමාජයීය සංවර්ධනයන් හා සම්බන්ධ කෙරෙයි. 2023 වර්ෂය තුළ මෙලෙස අධ්‍යාපනය ලද ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව 20ක් වන අතර එය අපේක්ෂිත ඉලක්කය වූ 10යක අගය අභිබවා යාමකි. මෙලෙසින් මත්ද්‍රව්‍ය සම්බන්ධ ධන

ප්‍රතිරූපයන් සෘණ හෝ ශූන්‍ය ලෙස වෙනසකට ලක් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 4,856ක් වූ අතර එය අපේක්ෂිත අගය වූ 2000ක ප්‍රමාණය ඉක්මවා යාමකි.

ජාත්‍යන්තර පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය අධ්‍යාපනය හා පුහුණුව 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	10	10	10	10	10
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	9	0	3	12	20
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	90%	0%	30%	120%	200%
ඇස්තමේන්තුගත ශිෂ්‍ය සංඛ්‍යාව	2,000	2,000	2,000	2,000	2,000
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව	1443	0	183	2,166	4,856
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	72.15%	0%	9.15%	108.3%	248.80%

(11.1.1.2 වගුව)





11.1.1.3 දෙමාපිය කුසලතා ප්‍රවර්ධන වැඩසටහන්

දරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සන්දර්භය තුළ දරුවන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලියේ ප්‍රභවය පවුල වන අතර දෙවනුව එය පාසල වෙත පරිවර්තනය වෙයි. දෙමාපියන් හා භාරකරුවන් දරුවන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලියේ පුරෝගාමියෝ වෙති. දරුවන් පාසල තුළ හා පාසලින් පරිබාහිරව වැඩිම කාලයක් දිවි ගෙවන්නේ දෙමාපියන් හා තම පවුල තුළයි. මත්ද්‍රව්‍ය භාවිතය හා එහි ධනාත්මක සාධක සහිත, කරදරකාරී හා දරුවන් නොසළකන මෙන්ම අපයෝජනය ද ඉහළ පවුල් පරිසරයන් ඉහළ අවදානම් සහිත දෙමාපිය-දූ දරු සම්බන්ධතා ලෙස හඳුනාගනී. මේ තත්ත්වයන් වෙනස් කර දෙමව්පියන් මත්ද්‍රව්‍යයෙන් තොර කුසලතා පූර්ණ භාරකරුවන් බවට පත්කිරීම දෙමාපිය කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් වල අරමුණයි. 2023 වර්ෂය තුළ සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව 200ක් වුවත්, වැඩසටහන් 209ක් සිදුකර එය 104.50%ක ප්‍රතිශතයකට ගෙන ඒමට සමත් වූ අතර ආකල්පමය වෙනසක් සිදු වූ දෙමාපිය සංඛ්‍යාව 31,458ක් ලෙස ගණන් බලා ඇත.

දෙමාපිය කුසලතා සංවර්ධන වැඩසටහන් 2019-2023					
වර්ෂය	2019	2020	2021	2022	2023
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	200	200	200	200	200
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	121	0	117	104	209
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	60.5%	0%	58.5%	52%	104.50%
ඇස්තමේන්තුගත දෙමාපිය සංඛ්‍යාව	22,000	22,000	22,000	22,000	22,000
සහභාගී වූ දෙමාපිය සංඛ්‍යාව	14,652	0	3,187	14,448	31,458
සහභාගී වූ දෙමාපිය සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	66.66%	0	14.5%	65.67%	142.99%

(11.1.1.3 වගුව)

11.1.1.4 ගුරුවරුන් පුහුණු කරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන්

උපදේශනය, කායික සෞඛ්‍ය හා මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් උනන්දුවක් ඇති ගුරුවරුන් දරුවන් තුළ ඇති මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව වන ආකල්ප වෙනස් කිරීමේ පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම ද 2023 වර්ෂය පුරාවටම සිදුවිය. මෙය පාසල් විෂය මාලාව තුළ හා අඛණ්ඩව වැඩසටහන් මාලාවක් ලෙස පන්ති කාමර මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම පසුගිය වර්ෂවලට සාපේක්ෂව 255%ක ප්‍රතිශතයක් අත්කර ගැනීම කැපී පෙනෙන්නක් විය. ඊට හේතුව පාසල් තුළ ඇති වූ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ඉහළ ඉල්ලුම වෙත අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ද සිදුවූ ආකල්පමය හා ප්‍රතිපත්තිමය වෙනස්කම් ය.

ගුරුවරුන් පුහුණු කරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන් 2019-2023					
වර්ෂය	2019	2020	2021	2022	2023
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	30	30	30	30	20
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	07	06	06	18	51
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	23.33%	20%	20%	60%	255%
ඇස්තමේන්තුගත ගුරුවරුන් සංඛ්‍යාව	1,000	1,000	1,000	1,000	1,050
සහභාගී වූ ගුරුවරුන් සංඛ්‍යාව	772	268	390	969	2613
සහභාගී වූ ගුරුවරුන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	77.2%	26.8%	39%	24.23%	248.86%

(11.1.1.4 වගුව)

11.1.1.5 පාසල් ගුරුවරුන්ගේ මත්ද්‍රව්‍ය නිවාරණය හා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන්

පවුල හැරුණු කොට සූක්ෂම පරිසරය තුළ දරුවන්ගේ මූලික සමාජානුයෝජනයේ දෙවන වැදගත්ම සංස්ථාව වන්නේ පාසලයි. මත්ද්‍රව්‍ය, මධ්‍යසාර හා දුම්කොල යන කරුණුවලදී ඇතැම් ගුරුවරුන් ඒ කෙරේ ඇති ආකල්පමය කැමැත්ත විශාල ලෙස දකින්නට ඇති බව පර්යේෂණ තුළින් තහවුරු වී ඇත. දරුවන්ගේ මූලික සමාජානුයෝජකයින් ලෙස, ගුරුවරුන්ගේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පවතින

ධනාත්මක ප්‍රතිරූපය වෙනස් කරමින් ඔවුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් මෙම උප විෂය දහරාව මඟින් දියත් කරයි. ශික්ෂා පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනට සමගාමීව 2023 වර්ෂය තුළ ගුරුවරුන් වෙනුවෙන් වූ නිවාරණ අධ්‍යාපන වැඩසටහන් 30ක් සැලසුම්කර වැඩසටහන් 34ක් ක්‍රියාවට නංවන ලදි. එය 113.33%ක වර්ධනයක් වන අතර ඊට දිවයින පුරා ගුරුවරුන් 1,974ක් සම්බන්ධ වී ඇත. මෙම වැඩසටහන් මාලාව 2021 වර්ෂයේ සිට "ශික්ෂා" වැඩසටහනට සමගාමීව අලුතින් ප්‍රතිනිර්මාණය වූවක් හෙයින් එම දත්ත පහත වගුව තුළ සාරාංශ කර ඇත.

පාසල් ගුරුවරුන්ගේ මත්ද්‍රව්‍ය නිවාරණය හා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	-	-	30	30	30
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	-	-	19	18	34
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	63.33%	60%	113.33%
ඇස්තමේන්තුගත ගුරුවරුන් සංඛ්‍යාව	-	-	1,000	1,000	1,200
සහභාගී වූ ගුරුවරුන් සංඛ්‍යාව	-	-	793	1,136	1974
සහභාගී වූ ගුරුවරුන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	79.3%	113.6%	164.50%

(11.1.1.5 වගුව)

11.1.1.6 දහම් පාසල් සිසුන් දැනුවත් කිරීම

දහම් පාසල් සාමාන්‍යයෙන් සතියේ ඉරිදා දිනයන් පදනම් කරගනිමින් ආගමික හා ආධ්‍යාත්මික පදනමකින් රට තුළ ක්‍රියාත්මක වන පාසල් ව්‍යුහයකි. මෙය දරුවන් සූක්ෂම පරිසරය තුළ ඒකරාශී වන තවත් සංවිධාන ව්‍යුහයකි. දරුවන්ගේ ආකල්ප, හා මතවාදයන් පිළිබඳ ළමාවිය හා යෞවනය තුළ සිදුවන යම් ආකාරයක හැඩගැස්වීමකට දහම් විද්‍යාල ප්‍රබල දායකත්වයක් සපයයි. මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ අධ්‍යාපනය තවදුරටත් ප්‍රචලිත කරලීමට මෙම අධ්‍යාපන ජාලය ප්‍රබල දහරාවක් ලෙස 2023 වර්ෂය පුරාවටම නිවාරක අධ්‍යාපන හා පුනුණු අංශය ප්‍රයෝජනයට ගෙන ඇත.


දහම් පාසල් සිසුන් දැනුවත් කිරීම 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	30	-	100	100	100
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	45	-	58	40	78
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	150%	-	58%	40%	78%
ඇස්තමේන්තුගත ශිෂ්‍ය සංඛ්‍යාව	6,000	-	10,000	10,000	5,000
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව	7,050	-	1,955	4,234	8,418
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	128.18%	-	19.55%	21.17%	168.36%

(11.1.1.6 වගුව)


11.1.1.7 පසුගිය වසර 5ක කාලය තුළ (2019 - 2023) පාසල් පාදක මත්ද්‍රව්‍ය අධ්‍යාපනය හා පුහුණු වැඩසටහන් පැවැත්වූ ආකාරය විශ්ලේෂණාත්මකව

	වැඩසටහන	2019		2020		2021		2022		2023	
		වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව
1	සිසුන් දැනුවත්කිරීම්	390	79,863	79	15,665	239	39,837	763	129,848	998	172,672
2	ගුරු පුහුණුව	07	772	06	268	06	390	18	969	51	2,613
3	ගුරු අධ්‍යාපන වැඩසටහන්	-	-	-	-	19	793	18	1,136	34	1,974
4	දෙමාපිය වැඩසටහන්	121	14,652	02	94	117	3,187	104	14,448	209	31,458
5	දහම් පාසල්	45	7,691	-	-	58	1,955	40	4,234	78	8,418
6	ජාත්‍යන්තර පාසල්	09	1,443	-	-	03	183	12	2,166	20	4856

(11.1.1.7 වගුව)



(11.1.1.1 ප්‍රස්තාරය)



(11.1.1.2 ප්‍රස්තාරය)

11.1.2 තාරුණ්‍යය පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

තාරුණ්‍යය යනු මැදි ළමා වියෙන් අනතුරුව එළඹෙන සංවර්ධන අවධියයි. මෙම සංවර්ධන අවධිය තුළ යෞවනයින්ගේ මස්තිෂ්ක ක්‍රියාකාරීත්වය ඉතාමත් ඉහළින් සිදුවන අතර ඔවුන් සංවේදන වෙත ඉහළ නැඹුරුවක් දක්වයි. ඔවුන් සතු තොරතුරු ඒකරාශී කරමින් යතාර්ථවාදී චින්තනයට ප්‍රවිශ්ට වීම වෙනුවෙන් විධිමත් නිවාරක විද්‍යාත්මක දැනුමකට මග පෑදීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ වගකීමයි. ඒ වෙනුවෙන් පදනම් වූ වැඩසටහන් ත්‍රිත්වයක් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය ක්‍රියාවට නංවන ලදි.

11.1.2.1 තරුණ ප්‍රජාවන් වෙත නිවාරණ අධ්‍යාපනය ලඟා කරවීමේ වැඩසටහන්

මෙහිදී පොදුවේ තාරුණ්‍ය පදනම් කරගත් නිවාරණ අධ්‍යාපනය ඉලක්ක කරයි. තරුණ ප්‍රජාව තුළ අවදානම්කාරී චර්යාවන් ලෙස මත්ද්‍රව්‍ය අත්හදා බැලීම සඳහා කැමැත්ත හා එහි ධන ප්‍රතිරූපය සෘණ ප්‍රතිරූපයක් බවට පෙරළීමත්, ඔවුන්ගේ පළමු භාවිතය හැකිතාක් පමා කරලීමත්, දැනටමත් යම්කිසි තරුණයෙකු මත්ද්‍රව්‍ය අත්හදා බලා ඇත්නම් එය අක්‍රමතාවයක් තෙක් වර්ධනය වීම වළක්වාලීමත් මෙම වැඩසටහන් වල ප්‍රධාන ඉලක්කයයි.

තරුණ ප්‍රජාව දැනුවත් කිරීම 2019-2023					
වර්ෂය	2019	2020	2021	2022	2023
ඇස්තමේන්තුගත වැඩසටහන් ගණන	150	150	150	150	150
පවත්වන ලද වැඩසටහන් ගණන	135	71	170	173	221
පවත්වන ලද ප්‍රමාණය අපේක්ෂිත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	90%	47.33%	113.3%	115.33%	147.33%
ඇස්තමේන්තුගත ශිෂ්‍ය සංඛ්‍යාව	22,000	22,000	22,000	12,000	12,000
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව	14 652	8396	7 991	10 301	21 414
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	66.66%	38.16%	36.3%	85.84%	178.45%

(11.1.2.1 වගුව)

11.1.2.2 විශ්වවිද්‍යාල පදනම් කරගත් නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

පසු යොවුන් වියේ දරුවන් හා වැඩිහිටි සමයට පා තබන බොහෝ යෞවනයන්ගේ විධිමත් අධ්‍යාපන දහරාවේ අවසන් නැවතුම විශ්වවිද්‍යාල පද්ධතියයි. කෙසේ වුවද වර්තමානයේ විශ්වවිද්‍යාල සිසුන්ගේ මත්ද්‍රව්‍ය පිළිබඳ ආකල්ප ඉතාමත් ධනාත්මක මුහුණුවරකට පත්වීම තුළ ගංජා, උත්තේජක ද්‍රව්‍ය මෙන්ම නීතිගත මත්ද්‍රව්‍යවල ඉහළ භාවිතයන් විශ්වවිද්‍යාල සිසුන් තුළ වර්ධනය වනු දැකිය හැක. මේ තත්ත්වයට සෘජු ඇමතුමක් විශ්වවිද්‍යාල පදනම් කරගත් නිවාරණ අධ්‍යාපනය තුළින් අපේක්ෂිත ය. පසුගිය වසර පහ තුළ එහි හැසිරීම පහත වගුව තුළින් විශ්ලේෂණය වෙයි.

විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීම 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තුගත වැඩසටහන් ගණන	10	20	20	20	10
පවත්වන ලද වැඩසටහන් ගණන	20	1	14	7	33
පවත්වන ලද ප්‍රමාණය අපේක්ෂිත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	200%	5%	70%	35%	330%
ඇස්තමේන්තු ගත ශිෂ්‍ය සංඛ්‍යාව	3,000	4,000	4,000	12,000	3,000
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව	3 209	57	952	1 552	5 857
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	106.96%	1.43%	23.8%	12.93%	195.23%

(11.1.2.2 වගුව)

11.1.2.3 තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන්

තරුණ ප්‍රජාවට තම සම වයසේ මිතුරන් හට වඩාත් සමීපව ආමන්ත්‍රණය කිරීමේ හැකියාව ඇති බැවින් මත්ද්‍රව්‍ය නිවාරණ අභ්‍යාසලාභීන් ලෙස ඔවුන් පුහුණු කිරීමේ අරමුණින් 2023 වර්ෂයේදී නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය තරුණ ප්‍රජා පුහුණු වැඩසටහන් 21ක් පවත්වන ලද අතර පසුගිය වර්ෂ පහ තුළ එහි විකාශනය පහත වගුව තුළ පෙන්නුම් කර ඇත.


තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන් 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තුගත වැඩසටහන් සංඛ්‍යාව	30	30	30	30	20
පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	20	11	7	18	21
පවත්වන ලද ප්‍රමාණය අපේක්ෂිත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	66.66%	36.6%	23.3%	60%	105%
ඇස්තමේන්තු ගත ශිෂ්‍ය සංඛ්‍යාව	1,000	1,000	1,000	4,000	2,000
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව	995	475	298	1,283	1,520
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	99.5%	47.5%	29.8%	32.08%	76%

(11.1.2.3 වගුව)


11.1.2.4 පසුගිය වසර 5ක කාලය තුළ (2019 - 2023) තරුණයය පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පැවැත්වූ ආකාරය විශ්ලේෂණාත්මකව

	වැඩසටහන	2019		2020		2021		2022		2023	
		වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව
1	තරුණ ප්‍රජාව දැනුවත් කිරීම්	135	13,373	71	8,396	170	7,991	173	10,301	221	21,414
2	විශ්ව විද්‍යාල සිසුන්	20	3,209	-	-	14	952	07	1,552	33	5,857
3	පුහුණු වැඩසටහන්	20	995	11	475	07	298	18	1,283	21	1,520

(11.1.2.4 වගුව)



(11.1.2.1 ප්‍රස්තාරය)



(11.1.2.2 ප්‍රස්තාරය)

11.1.3 පවුල් පාදක කරගත් මත්ද්‍රව්‍ය නිවාරණය අධ්‍යාපනය හා පුහුණුව

පවුල යනු පුද්ගලයා සූක්ෂම පරිසරය තුළ ගනුදෙනු කිරීමේදී ඔහුට හෝ ඇයට ඉතාම සමීපතම සමාජානුයෝජන ආයතනයකි. මෙම ආයතනය මත්ද්‍රව්‍ය භාවිතය හා ඉන් වැළකීමේ සමාජානුයෝජන ක්‍රියාවලියට පූර්ණ යොමුවක් සිදුකිරීම හෝ නොකිරීම වෙනුවෙන් සුවිශේෂී වැදගත්කමක් දරයි. එහිදී පුද්ගලයෙකුගේ පවුල් පරිසරය, අවදානම් පාරිසරික සාධකවලින් නිර්මාණය වේ නම් එම අවදානම් සාධක අවම කරමින් ආරක්ෂක සාධක ඉහළ නැංවීම පවුල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණයේ දී ඉලක්ක කරයි.

11.1.3.1 පවුල පදනම් කරගත් නිවාරණ වැඩසටහන්

පවුල පදනම් කරගත් නිවාරණ වැඩසටහන් යනු විශ්වීය නිවාරණය මෙන්ම තෝරාගත් නිවාරණ ප්‍රවේශවලට අනුකූලව පවුල්වල ඇති අවධානම් පාරිසරික සාධක අවම කර ගනිමින් ආරක්ෂක සාධක වර්ධනය කිරීම වෙනුවෙන් සූදානම් කළ විධිමත් විද්‍යාත්මක භාවිතයක් සහිත වැඩසටහන් මාලාවකි. මේ යටතේ 2023 වර්ෂය තුළ වැඩසටහන් 150ක් සැලසුම්කර තිබූ අතර ඉන් වැඩසටහන් 79ක් එනම් 52.67%ක ප්‍රමාණයක් සාර්ථකව නිම කළ අතර ඊට සම්බන්ධ වූ දෙමාපිය සංඛ්‍යාව හා ඉන් කුසලතා අත්කරගත් සංඛ්‍යාව 4,069 කි.

පවුල් පාදක කරගත් නිවාරණ අධ්‍යාපන වැඩසටහන් 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	200	200	200	200	150
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	121	27	42	100	79
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	60.5%	13.5%	21%	50%	52.67%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	22,000	22,000	22,000	22,000	10,000
සහභාගී වූ සංඛ්‍යාව	14,652	2,591	1,725	6,458	4,069
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	66.66%	11.77%	7.8%	29.35%	40.69%

(11.1.3.1 වගුව)

11.1.3.2 පවුල් පාදක කෙටි මැදිහත්වීම් සහ අනෙකුත් සේවාවන් වෙත යොමු කරලීම

පවුල් පාදක ප්‍රවේශයන් තුළ දී ඇතැම් පවුල් මේ වන විටත් මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සහිත සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර ඒ පිළිබඳව කෙටි මැදිහත්වීම් හෝ අවශ්‍ය මැදිහත්කරණයන් සිදුකර ඒ පවුල්වලට අදාළ සේවාවන් ලබාදීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සිදු කරයි. මේ යටතේ ඇතැම් සාමාජිකයින් වෙත උපදේශන සේවා සපයන අතර ඇතැම් කෙටි මැදිහත්වීම් ඔස්සේ ඔවුන්ගේ භාවිතාවන්ගෙන් නිදහස්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරයි. ඇතැම් පවුල් වලට අවශ්‍ය යොමු කිරීම් හෝ ප්‍රතිකාර සේවාවන් සොයා දීම ද අධ්‍යාපන අංශය ඉටු කළ තවත් සේවාවකි. මේ අතරින් 2023 වර්ෂය තුළ වැඩසටහන් 200ක් සැලසුම් කළ අතර සේවා අවශ්‍යතා ඊට

වඩා පුළුල් වී වැඩසටහන් 310ක් තරම් ඉහළ අගයක සේවයක් ලබාදීමට හැකි විය. එසේම සැලසුම් කළ ප්‍රතිලාභීන්ගේ අගය ඉහළ ගොස් තිබීමද කැපී පෙනෙයි.


පවුල් පාදක කෙටි මැදිහත්වීම් සහ අනෙකුත් සේවාවන් වෙත යොමු කිරීම					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	100	100	100	100	200
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	86	79	138	190	310
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	86%	79%	138%	190%	155%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	500	1,000	1,000	1,000	1,000
සහභාගී වූ සංඛ්‍යාව	1,001	359	187	553	1419
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	200.2%	35.9%	18.7%	55.3%	141.90%

(11.1.3.2 වගුව)


11.1.3.3 පසුගිය වසර 5ක කාලය තුළ (2019 -2023) පවුල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන පැවැත්වූ ආකාරය විශ්ලේෂණාත්මකව

		2019		2020		2021		2022		2023	
	වැඩසටහන	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව
1	නිවාරණ වැඩසටහන්	-	-	27	475	42	1,725	100	6,458	79	4,069
2	උපදේශන වැඩසටහන්	86	1,001	79	359	138	187	190	553	310	1,419

(11.1.3.3 වගුව)



(11.1.3.1 ප්‍රස්තාරය)



(11.1.3.2 ප්‍රස්තාරය)

11.1.4 වැඩ බිම් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය, අධ්‍යාපනය හා පුහුණුව

සේවා ස්ථාන පදනම් කරගත් නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් කාණ්ඩ හයක් යටතේ නිවාරක අධ්‍යාපන අංශය ක්‍රියාත්මක කරයි.

01. රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්.
02. රාජ්‍ය නිලධාරීන් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන්.
03. සෞඛ්‍ය අංශයේ නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්.
04. නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් වෙනුවෙන් සිදුවන නිවාරණ අධ්‍යාපන වැඩසටහන්.
05. විශාල සේවා ස්ථාන පදනම් කරගත් පුද්ගලික අංශයේ නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්.
06. වැවිලි අංශය ඉලක්ක කර ගත් නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්.

11.1.4.1 රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්

ශ්‍රී ලාංකීය රාජ්‍ය අංශය සේවකයින් මිලියන 1.5කින් සමන්විත වූවකි. මෙම නිලධාරීන් කටයුතු කරන රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, මණ්ඩල මෙන්ම සංස්ථාවන් තුළින් මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය ආයතන තුළින් ඔවුන් හා ඔවුන්ගේ පවුල්වල මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් සෞඛ්‍යමත් ජනතාවක් ලෙස සමාජයේ පූර්ණ විභව්‍යතා සහිත පිරිසක් ලෙස ජීවිත ගත කිරීමට අවශ්‍ය පදනම මෙම නිවාරක අධ්‍යාපන වැඩසටහන්වල ඉලක්කයයි. මේ යටතේ මත්ද්‍රව්‍ය පිළිබඳ රාජ්‍ය සේවකයින්ගේ ආකල්ප හා දැනුම වෙනස් කොට, ඒ පිළිබඳව ඔවුන් තුළ පවතින ප්‍රතිරූපයන් වෙනස් කරමින්, ආරක්ෂණවාදී පුද්ගලයින් ලෙස සෞඛ්‍යමත් සහ ස්වස්ථායී රාජ්‍ය සේවා පරිසරයක් නිර්මාණය කරලීම මෙම වැඩසටහන්වල අපේක්ෂාවයි. මේ අයුරින් 2023 වර්ෂයේ වැඩසටහන් 150 ක් සැලසුම් කළ අතර ඉන් 111ක් සම්පූර්ණ කිරීමට හැකි විය. මෙම නිවාරණ කුසලතාව නතු කර ගත් සේවක සංඛ්‍යාව 11,421කි. එය අපේක්ෂිත ඉලක්කය 142.76%කින් වර්ධනය වීමකි.

රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	150	150	150	150	150
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	147	74	149	45	111
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	98%	49.33%	99.33%	30%	74%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	12,000	12,000	12,000	8,000	8,000
සහභාගී වූ සංඛ්‍යාව	11,260	4,260	8,736	3,979	11,421
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	93.83%	35.5%	72.8%	49.74%	142.76%

(11.1.4.1 වගුව)

11.1.4.2 රාජ්‍ය නිලධාරීන් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන්

රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අති විශාල සේවක සංඛ්‍යාවක් වෙත මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩය රැගෙන යාමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සතු ධාරිතාවය ප්‍රමාණවත් නොවන නිසා රාජ්‍ය සේවකයින් අතුරින් මෙම විෂය පිළිබඳව උනන්දුවක් සහිත නිලධාරීන් තෝරාගෙන ඔවුන් පුහුණුකරුවන් ලෙස පුහුණුවට ලක් කර අදාළ ආකල්පමය වෙනස ඇති කරලීමට යොදා ගැනීම මෙම වැඩසටහන් මාලාවේ අරමුණයි. මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ඇති ධන ප්‍රතිරූපය ඍණ ප්‍රතිරූපයක් තෙක් පරිවර්තනය කිරීමට අවශ්‍ය ආකල්පමය වෙනස සිදු කරන තාක්ෂණික කුසලතාවය ලබාදීම මෙම වැඩසටහන්වල අරමුණයි. 2023 වර්ෂය තුළ රාජ්‍ය සේවකයින් නිවාරක අධ්‍යාපනවේදීන් ලෙස පුහුණු කිරීම් 50ක් සිදු කිරීමට බලාපොරොත්තු වූ අතර නිමාකළ සංඛ්‍යාව 48කි. මෙලෙස පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව 2,932ක් වූ අතර එය 97.73%ක සාර්ථකත්වයකි.

රාජ්‍ය නිලධාරීන් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන් 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	-	-	50	50	50
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	-	-	51	44	48
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	-	-	102%	88%	96%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	-	-	3,000	3,000	3,000
සහභාගී වූ සංඛ්‍යාව	-	-	2,474	1,598	2,932
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	-	-	82.5%	53.27%	97.73%

(11.1.4.2 වගුව)

11.1.4.3 සෞඛ්‍ය අංශයේ නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා යනු වසංගතවේදී විද්‍යාත්මක දහරාවට අයත් ප්‍රධාන විෂය දහරාවක් වන අතර සෞඛ්‍ය ක්ෂේත්‍රය නිවාරණ අධ්‍යාපන පණිවිඩය ජනගත කරලීමේ මූලික ආයතනික ව්‍යුහයයි. වෛද්‍යවරු, හෙද වෘත්තිකයින් මෙන්ම සාත්තු සේවක සේවිකාවන්ට අතිරේකව දේශීය වෛද්‍ය අංශවල ප්‍රජා සෞඛ්‍ය සේවාවන් ද ප්‍රධාන වශයෙන් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය වෙතින් මත්ද්‍රව්‍ය නිවාරණය හා අධ්‍යාපනය පිළිබඳ පුහුණුවට ලක්වේ. මෙලෙස සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ සිදුවන පුහුණුවෙහි ප්‍රතිලාභ සෞඛ්‍ය සේවය තුළ මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන ධාරිතා සංවර්ධනයට මෙන්ම රෝගීන්ගේ සුභසාධනය හා සෞඛ්‍ය සේවා ප්‍රවර්ධනයට ද හේතුවක් වනු ඇත. මේ වෙනුවෙන් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය 2023 වර්ෂය තුළ සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව 20ක් වුව ද වසර අවසානයේ එය 40ක් දක්වා වර්ධනය කිරීමට හැකි විය. එහි ප්‍රගතිය 200% ක් වූ අතර මත්ද්‍රව්‍ය නිවාරණය සහ අධ්‍යාපනය පිළිබඳ නිපුණතාව නතුකරගත් සංඛ්‍යාව 3,165 දෙනෙක් ලෙස ගණන් බලා ඇත. එය 158.25%ක වර්ධනයකි.

සෞඛ්‍ය අංශයේ නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	20	20	20	20	20
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	26	13	5	45	40
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	130%	65%	25%	225%	200%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	2,000	2,000	2,000	2,000	2,000
සහභාගී වූ සංඛ්‍යාව	1,780	618	182	2,164	3,165
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	89%	30.9%	9.1%	108.2%	158.25%

(11.1.4.3 වගුව)

11.1.4.4 නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් වෙනුවෙන් සිදුවන නිවාරණ අධ්‍යාපන වැඩසටහන්

ශ්‍රී ලංකා පොලිසිය, විශේෂ කාර්යය බලකාය, ත්‍රිවිධ හමුදාව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය, සුරාබදු දෙපාර්තමේන්තුව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, යන ආයතන විසින් ශ්‍රී ලංකාව තුළට මත්ද්‍රව්‍ය රැගෙන ඒමත්, ශ්‍රී ලංකා භූමිය තුළ මත්ද්‍රව්‍ය බෙදා හැරීමත් යන අංශ දෙකම පාලනය කරනු ලබයි. මත්ද්‍රව්‍ය සැපයුම පාලනය කිරීමට කටයුතු කරන මෙම ආයතන තුළ විශාල පිරිසක් සේවයේ නිරත වන අතර ඔවුන් තුළ මත්ද්‍රව්‍ය භාවිතය මෙන්ම නීති විරෝධී ජාවාරමට උපකාර කරන අවස්ථා ද ඇතැම් විට වාර්තා වේ. මෙම තත්ත්වය පාලනය කරමින්, නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් මත්ද්‍රව්‍ය නිවාරණය, අධ්‍යාපනය හා පුහුණුවට ලක්කිරීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අශයේ කාර්යයන් අතර ප්‍රමුඛ වෙයි. 2023 වර්ෂය තුළ එබඳු වැඩසටහන් 55ක් සම්පූර්ණයෙන්ම කිරීම සැලසුම් කළ අතර 58ක ඉලක්කයක් සපුරා ගෙන ඇත. එය 105.45%ක ප්‍රවර්ධනයකි. එසේම මෙම පණිවිඩය සම්ප්‍රේෂණය කරගත් නිලධාරීන් සංඛ්‍යාව 8,422 කි.

නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් වෙනුවෙන් සිදුවන නිවාරණ අධ්‍යාපන වැඩසටහන් 2019-2023					
වර්ෂය	2019	2020	2021	2022	2023
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	55	55	55	55	55
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	57	16	32	32	58
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	103.63%	29.09%	58.2%	58.2%	105.45%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	11,000	11,000	11,000	12,000	12,000
සහභාගී වූ සංඛ්‍යාව	8,672	2,504	3,797	4,896	8,422
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	78.83%	22.76%	34.5%	40.8%	70.18%

(11.1.4.4 වගුව)

11.1.4.5 විශාල සේවා ස්ථාන පදනම් කරගත් පුද්ගලික අංශයේ නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

මත්ද්‍රව්‍ය නිවාරණය යන විද්‍යාත්මක විෂය පථය තුළ විශාල සේවා ස්ථාන පදනම් කරගෙන සිදුකරන නිවාරණ වැඩසටහන් යනු, වැඩ බිමක සේවකයා පමණක් ඉලක්ක කරගන්නා වූ වැඩසටහන් නොවන අතර ඒවා පවුල් පාදක නිවාරණ ප්‍රවේශය හා මත්ද්‍රව්‍ය ප්‍රතිපත්ති පාදක පාරිසරික නිවාරණය යන ක්ෂේත්‍ර ද ස්පර්ශ කරන්නා වූ වැඩසටහන් ව්‍යුහයකි. එහිදී මත්ද්‍රව්‍යයෙන් නිදහස් වැඩ පරිසරයක් නිර්මාණය කර ගැනීම වෙනුවෙන් වැඩබිම් ආශ්‍රිත නිවාරණ ප්‍රතිපත්තිය අතිශය තීරණාත්මක වෙයි. ඊට අතිරේකව වැඩබිමට අයත් සෑම සේවකයෙකු වෙතම නිවාරණය සම්බන්ධ ආකල්ප වෙනසක් ද, තවදුරටත් අවදානම් සේවකයින් වෙත විශේෂිත නිවාරණ වැඩසටහන් මෙන්ම දැනටමත් භාවිතයේ යෙදෙන සේවකයන් වෙත අවශ්‍ය කරන කෙටි මැදිහත්වීම් සහ යොමු කිරීම් අවශ්‍ය වන්නේ නම් එම සේවාවන් ද ව්‍යාප්ත කිරීම 2023 වර්ෂය පුරාවටම සුපුරුදු පරිදි දියත් කෙරිණ. 2023 වර්ෂය තුළ වැඩසටහන් 40ක් ඉලක්ක කළ අතර එය අවසන්වූයේ වැඩසටහන් 70ක් සිදු කරමිනි. මෙම වැඩසටහන් වල ප්‍රතිලාභීන්ගේ ප්‍රතිශතය 162.14%ලෙස ඉහළ යාම ද විශේෂත්වයකි.

විශාල සේවා ස්ථාන පදනම් කරගත් පුද්ගලික අංශයේ නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් 2019-2023					
වර්ෂය	2019	2020	2021	2022	2023
ඇස්තමේන්තු ගත වැඩසටහන් ප්‍රමාණය	40	40	40	40	40
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	95	18	21	59	70
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	237.5%	45%	52.5%	147.5%	175%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	1,000	6,000	6,000	8,000	8,000
සහභාගී වූ සංඛ්‍යාව	20,173	7,630	5,674	15,095	12,971
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	2017.3%	127.16%	94.6%	188.69%	162.14%

(11.1.4.5 වගුව)

11.1.4.6 වැවිලි අංශය ඉලක්ක කර ගත් නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

තේ, පොල්, රබර් යන වැවිලි බෝග පදනම් කර ජීවත්වන ජනතාව තරමක් සුවිශේෂී ජන කණ්ඩායමක් වන අතර ඔවුන්ගේ ජීවන තත්ත්වයන් ද සාපේක්ෂව පහළ මට්ටමක පවතියි. ඔවුන් ඉතාම අහිතකර, දේශීයව නිෂ්පාදනය කරන මද්‍යසාරවලට ඇති නැඹුරුව ද ඉහළ අතර ගංජා වැනි මත්ද්‍රව්‍ය භාවිතයේ ද ප්‍රවණතාවයක් ඇත. ඔවුන්ගේ ආකල්ප වෙනසක් ඇති කර මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් පුරවැසියන් ලෙස සෞඛ්‍යමත් හා ස්වස්ථායී බවට පත් කිරීම මෙම වැඩසටහන්වල අරමුණයි. සැලසුම් කල වැඩසටහන් 10න් 9ක් අවසන් කළ අතර තවදුරටත් වැඩසටහන් සංඛ්‍යාව ව්‍යාප්ත කළ යුතු අංශයක් ලෙස 2023 වාර්තා විසින් හඳුනාගැනීමක් ද සිදු කරන ලදි.

වැවිලි අංශය ඉලක්ක කර ගත් නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් 2019-2023					
වර්ෂය	2019	2020	2021	2022	2023
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	20	20	20	20	10
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	24	03	-	03	09
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	120%	15%	-	15%	90%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	2,000	2,000	2,000	2,000	1,000
සහභාගී වූ සංඛ්‍යාව	1,148	140	-	152	367
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	72.4%	7%	-	7.6%	36.70%


(11.1.4.6 වගුව)

11.1.4.7 පසුගිය වසර 5ක කාලය තුළ (2019 - 2023) වැඩ බිම් පාදක මත්ද්‍රව්‍ය නිවාරණය, අධ්‍යාපනය හා පුහුණුව පැවැත්වූ ආකාරය විශ්ලේෂණාත්මකව


	වැඩසටහන	2019		2020		2021		2022		2023	
		වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව
1	නිලධාරීන් දැනුවත් කිරීම	147	11,260	74	4,260	149	8,736	45	3,979	111	11,421
2	නිලධාරීන් පුහුණු කිරීම	-	-	-	-	51	2,474	44	1,598	48	2,932
3	සෞඛ්‍ය අංශය	26	1,780	13	618	05	182	45	2,164	40	3,165
4	නීතිය බලගැන්වීමේ ආයතන	57	8,672	16	2,504	32	3,797	32	4,896	58	8,422

5	විශාල වැඩබිම්	95	20,173	18	7,630	21	5,674	59	15,095	70	12,971
6	වතු ප්‍රජාව	24	1,448	03	140	-	-	03	152	9	367

(11.1.4.7 වගුව)



(11.1.4.1 ප්‍රස්තාරය)



(11.1.4.2 ප්‍රස්තාරය)

11.1.5 මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය අධ්‍යාපනය හා පුහුණුව

මාධ්‍ය පාදක නිවාරණ අධ්‍යාපන හා පුහුණුව ප්‍රධාන දහරා කිහිපයක් තුළ විහිදී යන්නකි.
ඒ අතර :

01. මුද්‍රිත මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය.
02. ගුවන් විදුලි මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය.
03. රූපවාහිනී මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය.
04. මාධ්‍ය වෘත්තිකයින්ගේ මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපනය ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන්.
05. සමාජ මාධ්‍ය පදනම් කරගත් මත්ද්‍රව්‍ය නිවාරණය.







11.1.5.1 මුද්‍රිත මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය

පසුගිය වර්ෂයේ දී පුවත්පත් ක්ෂේත්‍රය තුළ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයට ළඟාවීමට හැකි වූයේ 16.64% ක පමණ ප්‍රතිශතයකට පමණි. මෙහිදී පුවත් පත් සම්බන්ධ අධීක්ෂණය හා ඇගයුම් 2024 වර්ෂය තුළ තවදුරටත් පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට මෙම ප්‍රතිඵල හේතුවක් වී ඇත.

මුද්‍රිත මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	-	-	160	12	12
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	-	-	44	18	2
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	-	-	27.5%	150%	16.64%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	-	-	900,000	50,000	50,000
සහභාගී වූ සංඛ්‍යාව	-	-	461,500	263,000	11,500
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	-	-	51.27%	526%	23%

(11.1.5.1 වගුව)

11.1.5.2 ගුවන් විදුලි මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය

2023 වර්ෂය පුරාවටම මත්ද්‍රව්‍ය නිවාරණය හා අධ්‍යාපනයේ දී ගුවන් විදුලි නාලිකා රාශියක් නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය සමඟ අත්වැල් බැඳ ගති. මෙහිදී දමිළ මෙන්ම ඉංග්‍රීසි ගුවන් විදුලි නාලිකා ද කැපී පෙනුණි. මේ තුළින් විශාල ශ්‍රාවක පිරිසක් වෙත තරඟකාරී ගුවන් කාලයක් තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සේම රසවින්දනය ද සම්මිශ්‍රිතව මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපනය තුළින් ප්‍රේක්ෂක ආකල්ප වෙනසකට ලක් කිරීමට හැකිවීම සුවිශේෂී වූවකි. මෙම වැඩසටහන්වල ප්‍රගතිය 112.90%ක් වූ අතර ඇස්තමේන්තු කළ ග්‍රාහකයන්ගේ වර්ධනය ප්‍රතිශතයක් ලෙස 123.33%කි.

ගුවන් විදුලි මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	-	-	120	15	31

සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	-	-	109	25	35
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	-	-	90.8%	166.67%	112.90%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	-	-	1,200,000	150,000	285,000
සහභාගී වූ සංඛ්‍යාව	-	-	948,660	189,500	351,500
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	-	-	82.10%	126.33%	123.33%

(11.1.5.2 වගුව)

11.1.5.3 රූපවාහිනී මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය

ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය අංශය හා පුද්ගලික අංශය සතුව සිංහල, දමිළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ක්‍රියාත්මක වන දේශීය රූපවාහිනී නාලිකා රැසක් ඇති අතර ඇතැම් ඒවා ෂටලයන් මාධ්‍ය කරගත් දේශීය නාලිකාවන් ය. මේ නාලිකා ඔස්සේ මත්ද්‍රව්‍ය නිවාරණය හා අධ්‍යාපනය වෙනුවෙන් සැලකිය යුතු ගුවන් කාලයක් වෙන් කරවා ගැනීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයට හැකියාව ලැබිණ. සම්බන්ධ වූ ප්‍රමුඛ වැඩසටහන් ලෙස "ආදරණීය ජීවිත - සියත, සිරස ටීවී - නැගිටිමු ශ්‍රී ලංකා, ස්වාධීන රූපවාහිනී - මෙහෙවර" වැනි වැඩසටහන් සේම විඳ්දනාත්මක වැඩසටහන් වැනි වැඩසටහන් රාශියක් දක්වන්නට පුළුවන. අපේක්ෂිත ඉලක්ක අභිබවා යමින් 2023 වර්ෂය තුළ සැලසුම්කළ ප්‍රතිශතය 128%කින් ඉහළ නංවා ගැනීමට හැකිවුණු අතර මෙහි ප්‍රේක්ෂක සංඛ්‍යාව ඇස්තමේන්තු කිරීමට ද අපහසු කරුණකි. මෙහිදී මෙම සෑම වැඩසටහනක්ම නැවත නැවත නැරඹීමේ පහසුව ෆේස්බුක් සහ යූ - ටියුබ් ඔස්සේ ද ඇති නිසා මෙහි පණිවිඩය සම්ප්‍රේෂිත සංඛ්‍යාව දළ වශයෙන් ඇස්තමේන්තු කිරීමේ දී 152.88% ක ප්‍රතිශතයක් 2023 වර්ෂය පුරා පෙන්වයි.


රූපවාහිනී මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණය 2019-2023					
වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	-	-	150	25	50
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	-	-	117	98	64
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	-	-	78%	392%	128%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	-	-	1,000,000	250,000	520,000
සහභාගී වූ සංඛ්‍යාව	-	-	948,192	1,162,000	795,000
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	-	-	94.80%	464.80%	152.88%

(11.1.5.3 වගුව)


11.1.5.4 පසුගිය වසර 4ක කාලය තුළ (2020 - 2023) මුද්‍රිත, ගුවන් විදුලි, රූපවාහිනී මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පැවැත්වූ ආකාරය විශ්ලේෂණාත්මකව

	වැඩසටහන	2020		2021		2022		2023	
		වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව
1	පුවත්පත් සහ මුද්‍රිත මාධ්‍ය	-	-	44	461,500	18	263,000	2	11,500
2	ගුවන් විදුලිය	-	-	109	984,660	25	189,500	35	351,500
3	රූපවාහිනී මාධ්‍ය	-	-	117	948,192	98	1,162,000	64	795,000

(11.1.5.4 වගුව)



(11.1.5.1 ප්‍රස්තාරය)



(11.1.5.2 ප්‍රස්තාරය)

11.1.5.5 මාධ්‍ය වෘත්තිකයින්ගේ මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපනය ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන්

මාධ්‍ය විසින් මත්ද්‍රව්‍ය සම්බන්ධ තොරතුරු හා අවස්ථාවන් වාර්තාකරණය කිරීම හේතුවෙන් මත්ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිරූපය ශ්‍රාවකයන් හා ප්‍රේක්ෂකයන් තුළ ප්‍රවර්ධනය වීම ඇතැම් විටක නොවැළැක්විය හැක්කකි. එහිදී මත්ද්‍රව්‍ය පිළිබඳ ඇතිවන ධනාත්මක ප්‍රතිරූපය මාධ්‍ය විසින් විශාල ග්‍රාහකයන්

ප්‍රමාණයකට රැගෙන යාම තුළ ඇති ආකර්ෂණය සංජානනය වීම නොවැළැක්විය හැක්කකි. මේ නිසාවෙන් මත්ද්‍රව්‍ය වාර්තාකරණයේ දී මාධ්‍ය විසින් කළ යුතු හා නොකළ යුතු දේ පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ පුහුණු වැඩමුළු දෙකක් 2023 වසර තුළ සැලසුම්කර ක්‍රියාවට නැංවූ අතර එයට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වාර්තාකරණයේ නිරත 60 දෙනකු සම්බන්ධ කර ගැනුණි.

11.1.5.6 සමාජ මාධ්‍ය පදනම් කරගත් මත්ද්‍රව්‍ය නිවාරණය

මෙම දහරාව තුළ ෆේස්බුක් හා යූ ටියුබ් යන මාධ්‍ය මගින් තුන් ආකාරයකින් කටයුතු කළ අතර "Art of Living" සහ "මවං" යන ෆෙස්බුක් පිටු යොදා ගනිමින් නිවාරක පණිවිඩය සමාජගත කිරීම 2023 වර්ෂ පුරා සිදු කළ අතර එහි නව ප්‍රගමනයන් පිළිබඳව 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක වීමට අපේක්ෂිතයි. එමෙන්ම "ටෝක් විත් කවුන්සලර්" යන යූටියුබ් චැනලය ඔස්සේ වීඩියෝ නිර්මාණය කර සමාජගත කිරීම තවදුරටත් ඉහළ නැංවීම ද 2024 වර්ෂය තුළ අපේක්ෂිතයි.

11.1.6 පරිසර පාදක මත්ද්‍රව්‍ය නිවාරණය අධ්‍යාපනය හා පුහුණුව

ප්‍රධාන උප විෂය දහරා 8ක් මීට ඇතුළත් අතර ජාත්‍යන්තර දින සැමරුම් 3ක් ද ඊට අන්තර්ගත කර ඇත.

11.1.6.1 ප්‍රජාව බලාත්මක කිරීමේ මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපනය උදෙසා කළ වැඩසටහන්

සමස්තයක් ලෙස පරිසර පාදක නිවාරණ අධ්‍යාපනික වැඩසටහන් වල ඵලදායී සාධකය මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිපත්ති බලාත්මක කිරීම හා ප්‍රජා පාදක නිවාරණය බලගැන්වීමයි. මෙහිදී සෘජුවම ප්‍රජාව තුළ ඇති අවදානම් කණ්ඩායම් ඉලක්ක වන අතර ප්‍රජාව වෙතින් එන ඉල්ලීම්ද ඊට අනුරූපී වෙයි. මේ ආකාරයේ ප්‍රජා වැඩසටහන් 300ක් 2023 වර්ෂය තුළ සැලසුම් කළ අතර වැඩසටහන් 309ක් සිදු කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් විය. එය සැලසුම් ගත සංඛ්‍යාව හා සසඳන විට 103%ක ප්‍රතිශතයකි. සෞඛ්‍යමත් මෙන්ම ස්වස්ථායී බවින් යුත් ප්‍රජාවක් බිහිකිරීම හා මත්ද්‍රව්‍ය පිළිබඳව ඇති ආකර්ෂණය විකර්ෂණය වූ ජනතාවක් ඇති කර ගැනීම ප්‍රජාව බලාත්මක කිරීමේ මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන වැඩසටහන් වල ප්‍රධාන පරමාර්ථයයි.

ප්‍රජාව බලාත්මක කිරීමේ මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපනය උදෙසා කළ වැඩසටහන් 2019-2023

වර්ෂය	2019	2020	2021	2022	2023
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	300	300	300	300	300
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	548	66	93	215	309
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	182.66%	22%	31%	71.67%	103%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	42,000	42,000	42,000	42,000	42,000
සහභාගී වූ සංඛ්‍යාව	53,052	6,392	11,841	28,214	32,689
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	126.31%	15.21%	28.2%	67.18%	77.83%

(11.1.6.1 වගුව)

11.1.6.2 ප්‍රජා බල ගැන්වීමේ නිවාරක අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

ප්‍රජාව ප්‍රජාවට ශක්තියක් වනු වස් ප්‍රජා නායකයින් පුහුණුවට ලක් කර ඔවුන් හරහා නිවාරණ වැඩසටහන් මෙහෙයවීම මෙහි අපේක්ෂාවයි. එබඳු වැඩසටහන් 5ක් 2023 වර්ෂයේ සැලසුම් කළ අතර වැඩසටහන් 8ක් සාර්ථකව නිම කරමින් පුහුණු කරුවන් 511දෙනෙකු නිවාරණ ක්ෂේත්‍රයට එක් කිරීමට 2023 වර්ෂයේ හැකියාව ලැබිණ.

ප්‍රජා බල ගැන්වීමේ නිවාරක අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් 2019 - 2023					
වර්ෂය	2019	2020	2021	2022	2023
ඇස්තමේන්තු ගත වැඩසටහන් සංඛ්‍යාව	-	-	20	20	5
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	-	-	5	1	8
සම්පූර්ණ කරන ලද වැඩසටහන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	-	-	20%	5%	160%
ඇස්තමේන්තු ගත සංඛ්‍යාව	-	-	1,000	1,000	250
සහභාගී වූ සංඛ්‍යාව	-	-	210	50	511
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස	-	-	21%	5%	204.40%

(11.1.6.2 වගුව)

11.1.6.3 මහජන ප්‍රදර්ශන ඇසුරින් මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපනය ලබාදීම

මෙයද විශාල ජනතාවක් වෙත එක්වර ළඟා වීමේ පහසු ක්‍රමයක් වන අතර නිවාරක අධ්‍යාපනය වැඩි පිරිසක් වෙත සම්ප්‍රේෂණය කිරීමේ පුළුල් වැඩසටහන් ක්‍රමයකි. මත්ද්‍රව්‍ය භාවිතයේ අහිතකර ප්‍රතිඵල දක්වන පෝස්ටර් හා පුවරු ප්‍රදර්ශනය කරමින් ජනතාව එක් වරම දැනුවත් කරලීමේ වැඩසටහන් සැලසුම් කරමින් 28,500 ක පමණ ජනතාවක් වෙත මෙම පණිවිඩ ලබාදීමට 2023 වර්ෂය තුළ හැකියාව ලැබුණු අතර එය අපේක්ෂිත ඉලක්කය 142.5% කින් වර්ධනය කර ගැනීමකි.

11.1.6.4 ලෝක කාන්තා දිනයට සමගාමීව පැවැත්වෙන කාන්තාව සවිබල ගැන්වීමේ නිවාරක අධ්‍යාපන වැඩසටහන්

කාන්තාව අවදානම් කණ්ඩායම්වල ප්‍රධාන ඉලක්කය වන බැවින් ඔවුන් බලාත්මක කිරීම ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන් සැලසුම් කිරීමේ ප්‍රධාන අරමුණයි. වසර පුරාම කාන්තාවන් ඉලක්ක වන වැඩසටහන් පැවැත්වෙන නමුත් ලෝක කාන්තා දිනයට සමගාමීව සුවිශේෂී වැඩසටහන් දහයක් නිර්මාණය කර ඔවුන් ඇමතීම ඉලක්ක කරන අතර, මෙවර වැඩසටහන් 13 ක් පවත්වා 1,030ක පිරිසක් වෙත ළඟාවීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් වී ඇත. එහි ප්‍රගතිය 103%ක අගයකට පත්ව ඇත.

11.1.6.5 ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී හා නීති විරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ දිනය

ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී හා නීති විරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ දිනය, සෑම වසරකම ජූනි 26 වැනි දිනට උත්සවාකාරයෙන් හා අර්ථපූර්ණව සැමරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සැලසුම් කරන අතර, මෙවර එහි ප්‍රධාන වැඩසටහන කොළඹ ගලධාරි හෝටලයේ දී නීතිය බලාත්මක කරන සියලු ආයතන, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රධාන

පාර්ශවකරුවන් හා මාධ්‍ය ආයතන රැසක නිලධාරින්ගේ සහභාගීත්වයෙන් දවස මුළුල්ලේ ම පවත්වන්නට යෙදුණි. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යතුමන් හා වත්මන් පොලිස්පතිතුමන් සම්බන්ධ වූ අතර ඊට අතිරේකව ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී ඒකාබද්ධ දේශන වැඩමුළුවක් ද පවත්වන්නට යෙදින. මේ වෙනුවෙන් කොළඹ ක්‍රමය කාර්යාංශය සම්පූර්ණ මූල්‍ය දායකත්වය සපයන ලදී.





11.1.6.6 ලෝක ළමා දින සැමරුම හා මත්ද්‍රව්‍ය නිවාරණය

ප්‍රධාන උත්සවය ඔක්තෝබර් පළමුවන දින දෙහිවල සත්වෝද්‍යාන පරිශ්‍රයේ දී පවත්වන්නට යෙදුණි. දරුවන් ඉලක්ක කර ගනිමින් දැනුම, වින්දනය හා උත්සවකාරී සැමරුම්වලින් සමන්විතවූ එම සැමරුම් උත්සවය සඳහා ‘‘කොරියන් ෆ්‍රෙන්ඩ්ස් ඔෆ් හෝප්ස් ඉන්ටනැෂනල්’’ ආයතනයේ පූර්ණ මූල්‍ය දායකත්වය එක් කරන ලදි. ඊට සමගාමීව දිවයින පුරා තවත් වැඩසටහන් හයක් සූදානම් කර ක්‍රියාවට නංවන ලද අතර දරුවන් 4,314ක් ඊට සම්බන්ධ වූ බව ඇස්තමේන්තු කර ඇත. මෙම වැඩසටහන් වලදී නැටුම්, ගැයුම්, වැයුම්, කුසලතා ඉදිරිපත් කිරීම්, නාට්‍ය හා චිත්‍ර තරඟ ආදිය තුළින් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ අවබෝධය දරුවන් වෙත ලබාදෙන ලදි.





11.1.6.7 එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) මඟින් දියත් කෙරෙන ශක්තිමත් පවුල වැඩසටහනට සම්බන්ධ වී එම වැඩසටහන රටපුරා දියත් කිරීමේ පාරිසරික වැඩසටහන් සිදුකිරීම.

“Strong Family” වැඩසටහන සාර්ථක අයුරින් කළුතර, කඩුවෙල හා කැලණිය යන ප්‍රදේශ තුළ ක්‍රියාත්මක කළ අතර ඊට ‘‘කොරියන් ෆ්‍රෙන්ඩ්ස් ඔෆ් හෝප්ස් ඉන්ටනැෂනල්’’ ආයතනයේ මූල්‍ය දායකත්වය සපයන ලදි. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාංශයෙ හි ප්‍රධාන තේමාවක් වූ ශක්තිමත් පවුල සංකල්පය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සිදුවන අතර ජාත්‍යන්තරය තුළ සාර්ථකව තහවුරු වෙමින් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ පණිවිඩය පවුල් අතරට ගෙන යාමට හැකියාව නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයට උදාවී ඇත.





11.1.6.8 ප්‍රතිපත්ති සම්පාදනයට දායකත්වය සැපයීම

ප්‍රධාන වශයෙන් ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වැඩසටහන් සඳහා දායක වීමට මෙන්ම ජාත්‍යන්තර වශයෙන් එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය හා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සංවිධානය කළ වැඩසටහන් වලට දායකත්වය දීමට ද නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයට හැකි විය.

11.1.6.9 ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූල්‍ය දායකත්වයෙන් යුතුව සිදු කළ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්

ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූල්‍ය දායකත්වයෙන් යුතුව ධාරිතා සංවර්ධන 5 දින නේවාසික වැඩසටහන් දෙකක් 2023 වර්ෂය තුළ සංවිධානය විය. ඊට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සෑම අංශයක්ම නියෝජනය කරමින් නිළධාරීන් 68ක පිරිසක් සම්බන්ධ වූ අතර මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාර හා පුනරුත්ථාපනය යන සෑම ක්ෂේත්‍රයකම නිපුණතාවය වර්ධනය කර ගැනීමට ඉතාමත් ඵලදායි මෙහෙවරක් ඉටු කරන ලද මෙම පස්දින නේවාසික වැඩසටහන් කොළඹ ගලධාරි හෝටලේදී පැවැත්විණි.

11.1.6.10 මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පාඨමාලාව

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සංවිධානය කර පවත්වන මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පාඨමාලාවේ පාඨමාලා 5 ක් 2023 වර්ෂය අවසන් වනවිට සාර්ථකව නිමාවට පත්කරණ ලදි. මේ මගින් මත්ද්‍රව්‍ය නිවාරණ සත්දින පාඨමාලාව හැදෑරූ සංඛ්‍යාව 111 දෙනෙකු වූ අතර ඉන් මහා භාණ්ඩාගාරයට යවන ලද මුදල රු.2,175,000.00 කි. මේ අනුව සාර්ථක ව්‍යවසායකයකු හා දැනුම බෙදා දෙන්නෙකු ලෙස ද නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය තමන්ගේ කාර්යය මැනවින් සමාජ ගත කරමින් සිටියි.









නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ 2022/23 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	2022	2023
භෞතික ප්‍රගතිය	91.52%	122.48%
මූල්‍ය ප්‍රගතිය	31.52%	43.67%

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ 2022 වර්ෂයේ භෞතික ප්‍රගතිය 91.52%ක් වූ අතර 2023 වර්ෂයේ භෞතික ප්‍රගතිය 122.48%ක් වේ. එමෙන්ම 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය 31.52%ක් වූ අතර 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය 43.67%ක් වේ. නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයෙහි භෞතික ප්‍රගතිය 2022 වර්ෂයට වඩා 2023 වර්ෂය තුළ 30.91%කින් වර්ධනයක් පෙන්නුම් කිරීමට පහත කරුණු හේතු විය.

- රට විවෘතව පැවතීම හා පාසල් පද්ධතිය අඛණ්ඩව විවෘතව පැවතීම
- ආර්ථික වශයෙන් රට යම් දුරකට ස්වාධීන වීම හා අනෙකුත් සේවාවන් විවෘත වීම
- මත්ද්‍රව්‍ය ගැටලුව ඉදිරියට පැමිණීම හා ප්‍රවෘත්තික ප්‍රමුඛතාකරණයට ලක් කිරීම තුළ ආයතනවල මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම
- පුහුණුකරුවන් පුහුණු කරමින් නිවාරක අධ්‍යාපනවේදීන් ලෙස ක්ෂේත්‍රයට එකතු කිරීම
- නීතිය බලාත්මක කිරීමේ ආයතන හා සෞඛ්‍ය අංශයේ කාර්යයභාරය තුළ මත්ද්‍රව්‍ය නිවාරණය ගැටළුකරණය වීම යන හේතු මත මෙහි භෞතික ප්‍රගතිය ඉහළ ගිය අතර මූල්‍ය වශයෙන් බාහිර ආයතනයන් වෙතින් මූල්‍ය ප්‍රදාන ලැබීම මෙන්ම අනෙක් ආධාර උපකාර ලැබීම මත මූල්‍ය පිරිවැය අවම කර ගත හැකි වීම ඉහත වර්ධනයන්ට හේතු විය.

11.2 බාහිරසේවා ඒකකය

11.2.1 හැඳින්වීම සහ බාහිරසේවා ඒකකයේ කාර්යභාරය

මත්ද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම අවම කරමින් අවදානම් කණ්ඩායම් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වළක්වා ගැනීම, මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් හට භාවිතයෙන් ඉවත්වීමට අවශ්‍ය සහය දැක්වීම සහ ඒ සඳහා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම, ප්‍රතිකාර අවස්ථා සලසා දෙමින් භාවිත කරන්නන් හා පවුල්වල සාමාජිකයින් වෙත උපදේශන සේවා හා පසුරුකවරණ කටයුතු සිදු කිරීම සහ එම සමස්ත ක්‍රියාවලිය ඔස්සේ සේවාලාභීන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා බාහිරසේවා ඒකකය කටයුතු කරනු ලබයි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මත්ද්‍රව්‍ය නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය, ග්‍රාම නිලධාරී සහ ප්‍රජා මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම සඳහා අදාළ පරිපාලන ව්‍යුහයන්, ප්‍රජා සහ සිවිල් ක්‍රියාකාරී සංවිධාන බලගැන්වීම සහ අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබාදීමේ දී බාහිරසේවා නිලධාරීන් නියෝජිතයින් සහ සම්බන්ධීකාරකවරුන් වශයෙන් කටයුතු කරනු ලබයි.

ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා, ළඟාවීමට අපහසු සහ සේවාවන් වෙත ප්‍රවේශවීමට අවස්ථාව නොමැති පුද්ගලයින් සහ කණ්ඩායම් අදාළ සේවාවන් වෙත ප්‍රවේශ වීම තහවුරු කිරීම සඳහා බාහිරසේවා නිලධාරීන් විසින් මත්ද්‍රව්‍ය භාවිතකරන පුද්ගලයින් හඳුනා ගැනීමේ සිට මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්වීම දක්වා අවශ්‍ය මැදිහත්වීම් සිදු කරනු ලබයි. ඊට අමතරව මානසික වෛද්‍ය සායන සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවාවන් සමග සම්බන්ධීකරණය මෙන්ම විවිධ පරිපාලන ව්‍යුහයන්ට අදාළව මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු සක්‍රීය කරමින් රාජ්‍ය ආයතනික ව්‍යුහය මෙන්ම රාජ්‍ය නොවන පාර්ශව, සිවිල් සහ ස්වේච්ඡා සංවිධාන මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා බලගැන්වීම ද සිදුකරනු ලබයි.

11.2.2 2023 වර්ෂය තුළ හඳුනාගත් ප්‍රමුඛතාගත ක්ෂේත්‍ර

I. මත්ද්‍රව්‍ය නිවාරණ සහ ප්‍රතිකාර සේවාවන් ප්‍රාදේශීය මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම සහ ඒ සඳහා ප්‍රාදේශීය ව්‍යුහයන් ශක්තිමත් කිරීම.

II. ආයතනගත ප්‍රතිකාර ආකෘතිය වෙනුවට ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

III. මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාර සම්බන්ධයෙන් මානව සම්පත් සංවර්ධනය

ඉහත ප්‍රමුඛතාගත ක්ෂේත්‍ර 03 යටතේ බාහිරසේවා අංශය 2023 වර්ෂය තුළ සිය වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව සේවාවන් ව්‍යාප්ත කිරීම සහ මානව සම්පත් සංවර්ධනය හරහා ප්‍රගතියක් අත්කරගෙන ඇත.

11.2.3 ප්‍රමුඛතාගත ක්ෂේත්‍රවලට අදාළ කාර්යසාධනය

11.2.3.1 මත්ද්‍රව්‍ය නිවාරණ සහ ප්‍රතිකාර සේවාවන් ප්‍රාදේශීය මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම සහ ඒ සඳහා ප්‍රාදේශීය ව්‍යුහයන් ශක්තිමත් කිරීම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සහ තාක්ෂණික දායකත්වය මත ක්‍රියාත්මක කරනු ලබන මත්ද්‍රව්‍ය නිවාරණ සහ ප්‍රතිකාර සේවාවන් ප්‍රාදේශීය මට්ටම දක්වා ව්‍යාප්ත කිරීමේ සහ සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ප්‍රධාන ප්‍රවේශ 03 ක් අනුගමනය කර ඇත. එනම්,

I. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාරය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන නිලධාරීන් අනුයුක්ත කිරීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණ සහ ප්‍රතිකාර වැඩසටහන් සඳහා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම යටතේ 2023.12.31 වන දිනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 228 ක් සඳහා සංවර්ධන නිලධාරීන් 289 දෙනෙක් මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුයුක්ත කර ඇත.

II. ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව සක්‍රීය කිරීම

ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාරයට අදාළව ගත යුතු පියවර සහ ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සහ දිස්ත්‍රික්ක මට්ටමින් කටයුතු කරන සියලු ආයතන සහ නිලධාරීන්ගේ අවධානය යොමු කරමින් සාකච්ඡා කිරීම, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවක් ස්ථාපිත කර එම කමිටුව ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මාසිකව රැස්වීම කළ යුතුය.

එම කමිටු රැස්වීම තුළ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නව ප්‍රවණතා, වසම් මට්ටමින් පවතින අවදානම් සාධක, මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය, හඳුනාගෙන ඇති අවදානම් කණ්ඩායම් සහ ඒ වෙනුවෙන් කළ හැකි මැදිහත්වීම්, අන්තර් ආයතනික සහයෝගීතාවය ශක්තිමත් කිරීම සහ ආයතන අතර සම්බන්ධීකරණය අඛණ්ඩව පවත්වාගෙන යාම, නව වැඩසටහන් පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම සහ සාකච්ඡාවට භාජනය කිරීම, ඉදිරි සැලසුම් සහ ප්‍රගතිය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම මෙන්ම ඒ මත පදනම්ව අවශ්‍ය තීරණ ගැනීම සිදුකරනු ලබයි.

මෙහි පළමු අදියර ලෙස බදුල්ල, රත්නපුර, කළුතර, කෑගල්ල යන දිස්ත්‍රික්කයන්වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක සම්පත්දායක සංචිත පිහිටුවා ඇත. පළාත් දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු ස්ථාපිත කිරීමට සහ සක්‍රීය ලෙස එම කමිටු පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික දායකත්වය සහ අවශ්‍ය බලගැන්වීම බාහිරසේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් විසින් සිදුකර ඇත.

III. ප්‍රාදේශීය මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා ස්වේච්ඡා සම්පත්දායක සංචිත ස්ථාපිත කිරීම.

මත්ද්‍රව්‍ය නිවාරණ සහ ප්‍රතිකාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී තාක්ෂණික දැනුම සහිත නිලධාරීන්ගේ සම්පත්දායකත්වය වඩාත් පහසුවෙන් ලබා ගැනීමට සහ ඒ සඳහා අවශ්‍ය භෞතික හා මූල්‍ය සම්පත් අදාළ ප්‍රදේශය තුළින්ම සපයා ගැනීමට ඇති හැකියාව තහවුරු කිරීමේ අරමුණින්

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සුදුසු පුද්ගලයින්ගෙන් සමන්විත සම්පත්දායක සංචිත ස්ථාපිත කිරීම ආරම්භ කර ඇත.

11.2.3.2 ආයතනගත ප්‍රතිකාර ආකෘතිය වෙනුවට ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් වීම සඳහා අවශ්‍ය ප්‍රතිකාරාත්මක මැදිහත්වීම් සහ උපකාරී සේවාවන් ඔවුන් ජීවත්වන පරිසරය තුළින්ම ලබා දෙමින් සහයෝගී පරිසරයක් ගොඩනැඟීම හරහා මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්වීමටත් ප්‍රීතිමත් හා ඵලදායී පූර්ණ ජීවිතයක් ගත කිරීමටත් උපකාරී වන ප්‍රතිකාර ආකෘතියක් වශයෙන් ප්‍රජා පාදක ප්‍රතිකාර ක්‍රමවේදය හඳුන්වාදිය හැකි ය. මෙම ක්‍රියාවලිය හරහා " පුද්ගලයා ජීවත්වන පරිසරයේ සිටිමින්ම මත්ද්‍රව්‍ය ගැටලුවෙන් නිදහස්වීම සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය කරවීම" අපේක්ෂා කරයි.

ස්වේච්ඡාවෙන්ම ප්‍රතිකාරය සඳහා ප්‍රජා මට්ටමින් ඉදිරිපත්වන පුද්ගලයින් මෙන්ම මත්ද්‍රව්‍ය සැපයුම අවම කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන වැටලීම් හරහා සියලු පොලිස් ස්ථාන මට්ටමින් අත්අඩංගුවට පත්වන විවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සඳහා අවශ්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පුහුණු වැඩසටහන්ද නිලධාරීන් වෙනුවෙන් ලබා දී ඇත.

11.2.3.3 මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාර සම්බන්ධයෙන් ධාරිතා සංවර්ධනය

- බාහිරසේවා නිලධාරීන් සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූල්‍යාධාර මත පවත්වන ලද දින 05 ක නේවාසික පුහුණු වැඩසටහන (මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාරය තුළ යොදාගත හැකි විවිධ ප්‍රවේශ සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදෙන ලදි).
- පිලිපීනයේ ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල භාවිත කරන සාක්ෂි මත පදනම් වූ නැවත භාවිතය වැළැක්වීමේ වැඩසටහන් පිළිබඳ මාර්ගගත පුහුණු සැසිය
- ව්‍යාපෘති යෝජනා ලිවීම පිළිබඳ පුහුණු වැඩසටහන
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා සම්බන්ධිත "Better work Sri Lanka" ව්‍යාපෘතිය විසින් සංවිධානය කරන ලද උපදේශන නිලධාරීන් සඳහා වන නේවාසික පුහුණු වැඩසටහන
- එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ කාර්යාලය විසින් පවත්වන ලද සවිමත් පවුල් පුහුණු පැකේජය සම්බන්ධ නේවාසික පුහුණු වැඩසටහන
- සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ආධාර මත සංවර්ධන නිලධාරීන් සඳහා ක්‍රියාත්මක කරන ලද දෙදින නේවාසික පුහුණු වැඩසටහන
- ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රජා පාදක ප්‍රතිකාරය සම්බන්ධ එක්දින පුහුණු වැඩසටහන් මාලාව (බාහිරසේවා නිලධාරීන් සඳහා සෑම මසකම එක් පුහුණු වැඩසටහනක් බැගින් පවත්වා ඇත)





11.2.4 බාහිරසේවා ඒකකයේ 2023 වර්ෂයට අදාළ අනෙකුත් වැඩසටහන් සම්බන්ධ කාර්යසාධනය

11.2.4.1 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් (විශේෂයෙන් හඳුනාගත් අංශ සඳහා)

වැඩසටහන් අංශය	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ ජංගම වැඩසටහන්	522	42,190
රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	244	13,666
සෞඛ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	30	275
නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	26	2,674
පාසල් සිසුන් සහ දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහන්	332	33,256
වැඩබිම් ක්ෂේත්‍රයේ සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන්	18	1,717
කාන්තාවන් බලගැන්වීමේ වැඩසටහන්	11	507
වතු අංශයේ සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන්	22	503
ප්‍රවාහන අංශයේ සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන්	52	3,426

(11.2.4.1 වගුව)

11.2.4.2 විශේෂ දින සහ අවස්ථාවන් පදනම් කරගනිමින් ක්‍රියාත්මක කරන ලද නිවාරණ වැඩසටහන්

- **ජාතික නිදහස් දින උළෙලට සමගාමීව පවත්වන ලද මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන - 2023**

බාහිරසේවා අංශය විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල නගරය කේන්ද්‍ර කර ගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා නාගරික ප්‍රජාව බලගැන්වීමේ අරමුණ ඇතිව මෙම ජංගම වැඩසටහන පෙබරවාරි 02 වන දින පවත්වන ලදි.

- **ජාත්‍යන්තර කන්තා දිනය - 2023**

මාර්තු 08 දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කාන්තාවන් ඉලක්ක කර ගනිමින් විවිධ වැඩසටහන් දිවයින පුරා සිටින බාහිරසේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් එක්ව සිදු කරන ලදි. කාන්තාවක් ලෙස තම පවුල් ඒකකය සහ ප්‍රජාව මත්ද්‍රව්‍ය ගැටලුවෙන් නිදහස් කර ගැනීමට කාන්තාවගේ කාර්යභාර්ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

- **ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දින වැඩසටහන - 2023**

මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව කෑගල්ල නගරයේ වැඩසටහන ජූනි මස 26 වන දින කෑගල්ල තැපැල් ශ්‍රවණාගාරයේ හා කෑගල්ල නගරය කේන්ද්‍ර කරගනිමින් පාසැල් 10 ක දෙමව්පියන් සහ සිසු සිසුවියන් සඳහා වැඩසටහන් මාලාවක් මෙන්ම කෑගල්ල බන්ධනාගාරයේ රැඳවියන් වෙනුවෙන් වැඩසටහනක් ද පවත්වන ලදි. මේ සඳහා සර්ව ආගමික නායකයින්, ප්‍රජාව, රාජ්‍ය නිලධාරීන්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ කෑගල්ල නගරයේ ව්‍යාපාරික ප්‍රජාව ආදී විශාල පිරිසක් සහභාගී විය.

ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දිනයට සමගාමීව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් විසින් මඩකලපුව, යාපනය, කොළඹ, මොරටුව සහ මහරගම යන ප්‍රදේශවල විවිධ වැඩසටහන් පවත්වන ලදි.

- **ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දින වැඩසටහන් - 2023**

ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව බාහිරසේවා නිලධාරීන් විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

11.2.4.3 විශේෂිත ආගමික උත්සව මුල්කර ගනිමින් සිදු කරන ලද ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්

අනු අංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන
I.	රත්නපුර	රත්නපුර සමන් දේවාල පෙරහැරට සමගාමීව සිදු කරන ලද වැඩසටහන
II.	යාපනය	නල්ලූර් කෝවිලේ වාර්ෂික මංගල්‍යයට සමගාමීව සිදු කරන ලද වැඩසටහන
III.		තෛපොංගල් උත්සවයට සමගාමීව සිදු කරන ලද වැඩසටහන
IV.		වල්ලිපුරම් හිංදු කෝවිල් උත්සවයට සමගාමීව සිදු කරන ලද වැඩසටහන
V.	මන්නාරම	මඩු දේවස්ථානයේ මඩු මංගල්‍යට සමගාමීව සිදු කරන ලද වැඩසටහන
VI.	මහනුවර	ශ්‍රී දළදා මාලිගාවේ ඇසළ පෙරහැරට සමගාමීව සිදු කරන ලද වැඩසටහන

VII.	මොණරාගල	කතරගම හා කුඩා කතරගම මහා දේවාල පෙරහැරට සමගාමීව සිදු කරන ලද වැඩසටහන
VIII.	අනුරාධපුර	වෙසක්, පොසොන් හා ඇසළ පොහොය නිමිත්තෙන් පෝස්ටර් හා අත්පත්‍රිකා බෙදා දෙමින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන
IX.	කොළඹ	බෙල්ලන්විල රජමහා විහාරයේ ඇසළ මහා පෙරහැරට සමගාමීව සිදු කරන ලද වැඩසටහන

(11.2.4.3 වගුව)

11.2.4.4 ප්‍රතිකාරාත්මක මැදිහත්වීම්

වැඩසටහන් කාණ්ඩය	පුද්ගලයින් සංඛ්‍යාව
මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් හඳුනා ගැනීම සහ එම පිරිස් ලැයිස්තුගත කිරීම	3,652
අනාවරණ පරීක්ෂාව මත පදනම්ව ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත හෝ ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහනට යොමු කිරීම	3,321
ප්‍රතිකාරලාභීන්ගේ පසුරැකවරණ කටයුතු සිදු කිරීම	5,482
මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ට සහ ඔවුන්ගේ පවුල් සඳහා උපදේශන සේවා සැපයීම	4,879
ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන යටතේ සේවාවන් සැපයීම	763

(11.2.4.4 වගුව)

11.2.4.5 මත්ද්‍රව්‍ය ආශ්‍රිත ගැටලු සහිත ළමුන් සඳහා වන උපදේශන මධ්‍යස්ථානය හා ගොඩවැදීමේ මධ්‍යස්ථාන ආරම්භ කිරීම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මත්ද්‍රව්‍ය ආශ්‍රිත ගැටලු සහිත ළමුන් සඳහා වන විශේෂ උපදේශන මධ්‍යස්ථානයක් කුරුණෑගල වයඹ පළාත් පරිවාස කාර්යාලයේදී ආරම්භ කරන ලදි. මෙහි උපදේශන කටයුතු බාහිරසේවා අංශයේ නිලධාරීන්, අධ්‍යාපන පුහුණු අංශයේ නිලධාරීන් සහ තෝරා ගත් සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ.

කුරුණෑගල රිදීගම රිදී විහාරය මූලික කර ගනිමින් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සඳහා උපදේශන හා ප්‍රතිකාර කටයුතු සඳහා ගොඩවැදීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත.

11.2.4.6 දිවයිනේ ප්‍රධාන නගර ආශ්‍රිත ඩිජිටල් තිර හරහා මත්ද්‍රව්‍ය නිවාරණ පණිවුඩ සහිත වීඩියෝපට ප්‍රචාරණය කිරීම

දිවයිනේ ප්‍රධාන නගර ආශ්‍රිතව වෙළඳ ප්‍රචාරණ දැන්වීම් සඳහා ස්ථාපිත කර ඇති ඩිජිටල් පුවරුවල මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩ සහිත කෙටි වීඩියෝපට නොමිලේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලදි.

දැනට මෙම වීඩියෝපට කිරුළපන, වත්තල, නුගේගොඩ, කිරිබත්ගොඩ, කුරුණෑගල සහ කෑගල්ල යන ප්‍රදේශවල ස්ථාපිත කර ඇති තෝරාගත් පුවරුවල ප්‍රචාරණය වේ.

11.2.4.7 මත්ද්‍රව්‍ය නිවාරණ පණිවුඩ ඇතුළත් ප්‍රදර්ශන කට්ටලයක් නිර්මාණය කිරීම

මහජන දින, විශේෂ දින මූලික කරගත් වැඩසටහන්, දැනුවත් කිරීමේ අධ්‍යාපනික ප්‍රදර්ශන, වෙළඳ ප්‍රදර්ශන වැනි අවස්ථාවල මත්ද්‍රව්‍ය නිවාරණ පණිවුඩ සමාජගත කිරීම සඳහා දෘෂ්‍ය ආධාරක භාවිත කරමින් දැනුවත් කිරීම් සිදුකිරීම සඳහා ඒ වෙනුවෙන් සකස් කරන ලද ප්‍රදර්ශන කට්ටලයක අවශ්‍යතාවයක් පැවති අතර ඒ සඳහා සාක්ෂිමත පදනම් වූ කරුණු ඇතුළත් ප්‍රදර්ශන පුවරුවලින් සමන්විත ප්‍රදර්ශන කට්ටලයක් සකස් කරන ලදි. මේ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වාර්ෂික ප්‍රතිපාදන හරහා සහ වෙනත් පරිත්‍යාගශීලීන්ගේ දායකත්වයෙන් ලබාගන්නා ලදි.

11.2.4.8 සවිමත් පවුල් වැඩසටහන

පවුල් බැඳීම් ශක්තිමත් කිරීම හරහා ගැටලු අවම සවිමත් පවුල් ඒකක බිහිකිරීමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් හඳුන්වා දී ඇති සවිමත් පවුල් පුහුණු පැකේජය ශ්‍රී ලාංකික සංදර්භය තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් පුහුණුව ලබාගත් බාහිරසේවා නිලධාරීන් විසින් විවිධ ප්‍රදේශවල අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදි. එම වැඩසටහන් හරහා ලද අත්දැකීම් සහ ප්‍රතිපෝෂණයන් එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය සමග හුවමාරු කර ගැනීමට නියමිත අතර මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් අදාළ පුහුණු පැකේජය ඵලදායී ලෙස යොදා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ද නිලධාරීන් අවධානය යොමු කරමින් ඇත.

11.2.2.9 බාහිරසේවා අත්පොත සකස් කිරීම

ප්‍රජාව පාදක කරගත් මත්ද්‍රව්‍ය නිවාරණ සහ ප්‍රතිකාර ක්‍රියාකාරකම් සිදු කිරීමේදී අවශ්‍ය වන න්‍යායාත්මක සහ ප්‍රායෝගික ප්‍රවේශයන් සම්බන්ධයෙන් නිලධාරීන්ට අවශ්‍ය දැනුම සහ මාර්ගෝපදේශ ලබාගැනීමට හැකිවන පරිදි සකස් කරන මාර්ගෝපදේශ අත්පොතක අවශ්‍යතාවය පැවති අතර එම අවශ්‍යතාවය පූර්ණය කරමින් භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත්කරන මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කරන ලදි. ඒ අනුව ආයතනයේ සහයෝගයෙන් එක්දින වැඩසටහනක් පවත්වා අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයට ඇතුළත්විය යුතු කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කර එකඟතාවයකට පැමිණෙන ලදි.

11.2.2.10 1927 දුරකථන මාර්ගික උපදේශන සේවාව

මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වී සිටින පුද්ගලයින්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට සිය කායික හා මානසික ගැටලු සහ අපහසුතා සම්බන්ධයෙන් උපදේශන සේවාවන් ලබා ගැනීමට හෝ වෙනත් අවශ්‍ය සේවාවක් සම්බන්ධ තොරතුරු ලබාගැනීම සඳහා මෙම දුරකථන මාර්ගික උපදේශන සේවාව ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම මූලික මට්ටමේ මැදිහත්වීම තුළ උපදේශන නිලධාරීන් විසින් සේවාලාභීන් වෙත හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත ප්‍රධාන අංශ 03 ක් යටතේ සේවාවන් සපයනු ලබයි.

- මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඇතිවන කායික හා මානසික සංකූලතාවයන් ඇතුළු විරමණ ලක්ෂණ මඟ හරවා ගැනීම සඳහා සේවාලාභීන් වෙත හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත අවශ්‍ය උපදෙස් සැපයීම.
- මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදීම සඳහා දැනට පවතින ප්‍රතිකාර සේවාවන් සම්බන්ධයෙන් හෝ වෙනත් මනෝ වෛද්‍ය විශේෂඥ සේවාවන් වෙත යොමුවීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු සැපයීම.
- මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් භාවිතයෙන් නිදහස් කර ගැනීම සඳහා ඉදිරි උපදේශන සැසි සැලසුම් කර ගැනීම, අවශ්‍ය ද්විතීය මට්ටමේ මැදිහත්වීම් සිදු කිරීම, භාවිතයෙන් නිදහස් කරගැනීම සහ පසුවිපරම් සිදු කිරීම.

2023 වර්ෂය තුළ දුරකථන මාර්ගික උපදේශන සේවාව හරහා සේවාවන් ලබාදීම සම්බන්ධ ප්‍රගතිය පහත ඉදිරිපත් කර ඇත.

1927 දුරකථන උපදේශන සේවාවට ලද ඇමතුම්වල ස්වභාවය අනුව ඉදිරි යොමු කිරීම්	
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා නිලධාරීන් වෙත	288
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත	105
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අධ්‍යාපන නිලධාරීන් වෙත	06
රජයේ රෝහල් ආශ්‍රිත සායන සඳහා	111
දුම්කොළ, මද්‍යසාර ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත හා 1948 ක්ෂණික ඇමතුම් අංකය වෙත	112
දුරකථන උපදේශනය	49
පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත	25
යොමු කිරීමකින් තොරව මූලික තොරතුරු සැපයීම	14,826
සමස්ත ඇමතුම් සංඛ්‍යාව	**15,522**

(11.2.2.10 වගුව)

බාහිරසේවා ඒකකයේ 2022/2023 වර්ෂයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	2022	2023
භෞතික ප්‍රගතිය	54%	87%
මූල්‍ය ප්‍රගතිය	42%	91%

2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළ වැඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාවක් සඳහා පුහුණු කරන ලද සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර ඇති අතර වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශවල දායකත්වය මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාර වැඩසටහන් සඳහා වැඩි වශයෙන් ලබා ගැනීමට හැකියාව ලැබී ඇත. එම තත්ත්වය තුළ 2022 වර්ෂයේ බාහිරසේවා ක්‍රියාකාරකම්වලට අදාළ භෞතික හා මූල්‍ය ප්‍රගතියට සාපේක්ෂව 2023 වර්ෂය තුළ සැළකිය යුතු මට්ටමින් ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීමට හැකියාව ලැබී ඇත.

11.3 ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය

මණ්ඩලයේ සේවාවන් අතර ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය ද සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනී. මෙම අංශය මඟින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා උපදේශන, ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබා දේ. මෙම වර්ෂයේදී ද මණ්ඩලයේ ස්ථාපිත පුනරුත්ථාපන මධ්‍යස්ථාන මඟින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නිසා විවිධ ප්‍රශ්නවලට මුහුණ දුන් පුද්ගලයින් එම ගැටලුවලින් මුදවා ගැනීම, ඔවුන් එයින් මුදවාගැනීමට උපකාරී වීමෙන් ඔවුන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට සහනයක් ලබා දීම, ඔවුන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම, අධ්‍යාත්මික සංවර්ධනය, පෞරුෂ සංවර්ධනය ආදී ගුණාත්මක වෙනස්කම් මඟින් ප්‍රතිකාර ක්‍රියාවලිය පෝෂණය කරන ලදී. එමෙන්ම දීප ව්‍යාප්ත මට්ටමින් ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය නිවාරණ සහ බාහිරසේවා ක්‍රියාකාරකම් මඟින් සිදුකරන ලද ප්‍රජාව දැනුවත් කිරීම ආශ්‍රිතව ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන් සඳහා අවශ්‍ය දායකත්වය ද මෙම අංශය මඟින් ලබාදෙන ලදී.

11.3.1 ප්‍රතිකාර වැඩසටහන සඳහා ඇතුළත් කරගැනීම

ඉහත වර්ගීකරණයට අනුව සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සේවාලාභීන් ඇතුළත් කරගත් අතර සුපුරුදු පරිදි මෙම වසරේ ද,

- සිය කැමැත්තෙන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුළත්වීම්
- භාරකරුවන්ගේ ඉල්ලීම් මත ඇතුළත් කිරීම්
- අධිකරණය සහ ප්‍රජා විශෝධන ආයතන මඟින් ඇතුළත් කිරීම්
- වෙනත් රාජ්‍ය ආයතන දැනුවත් කිරීම් මඟින් ඇතුළත් කිරීම්
- බාහිරසේවා මඟින් ඇතුළත් කරගැනීම් සිදුකරන ලදී.

ඉහත සියලු ඇතුළත් කිරීම් අපගේ පළපුරුදු උපදේශකවරුන්ගේ මැදිහත්වීම මත සිදුකල අතර පූර්ව උපදේශන සැසි, අනාවරණ පරීක්ෂණ උපයෝගී කර ගනිමින් සේවාලාභීන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත් කර ගන්නා ලදී.

ප්‍රතිකාර වැඩසටහන

නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුළත් කරගත් පසු සෑම මධ්‍යස්ථානයකම ඒ ඒ සේවාලාභියාට අනුරූප වන අයුරින් ප්‍රතිකාර සැලැස්මකට අනුව ප්‍රතිකාර සේවය ලබා දෙන ලදී. විශේෂයෙන්ම සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම මනෝ චිකිත්සක ප්‍රතිකාර ක්‍රමය උපයෝගි කරගනිමින් ඔවුන්ට අදාළ සේවාවන් සපයන ලදී. මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන්ගේ ගැටලු හඳුනාගැනීම, ගැටලු නිර්වචනය කරගැනීම හා ගැටලු විශ්ලේෂණය තුළින් ඔවුන්ට ගැලපෙන ප්‍රතිකාර සැලැස්ම නිර්මාණය කරයි. උපදේශකවරුන්, සහකාර උපදේශකවරුන්ගේ මැදිහත්වීම් යටතේ උපදේශන සහකාරවරුන්ගේ ද සහය ඇතිව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී පුද්ගල උපදේශනය, කණ්ඩායම් උපදේශනය, පවුල් උපදේශනය, වෘත්තීය මාර්ගෝපදේශනය ක්‍රියාවට නංවයි. එමෙන්ම ආත්ම අභිමානය ඇති කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම්, අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා වූ උපදේශනය, පරිසර රසවින්දනය ආශ්‍රිත ක්‍රියාකාරකම්, වින්දනාත්මක ගුණාංග සංවර්ධනය වැනි සේවාලාභියා සතු වූ විවිධ

ගුණාංගයන් දියුණු කරලීමේ අරමුණෙන් වූ ප්‍රතිකාර සැලැස්මක් උපයෝගී කරගැනීම මඟින් අදාළ සේවාවන් ලබාදෙන ලදි.

විශේෂිත වැඩසටහන්

ප්‍රතිකාර සහ දෛනික වැඩසටහනට අමතරව සෑම මධ්‍යස්ථානයකම සේවාලාභීන්ගේ රසවින්දනය සඳහා වසර තුළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක විය. රචනා, චිත්‍ර, මසකට වරක් පැවැත්වෙන පැදුරු සාජ්ජය වැනි සුවිශේෂී වැඩසටහන් මෙයට අයත් ය. ආගමික උත්සව, ක්‍රීඩා තරඟ, බැති ගී ප්‍රසංග, වසර අවසාන ප්‍රාසාංගික වැඩසටහන්, අභිප්‍රේරණ වැඩසටහන් ද ඒ අතර වේ.

ආදායම් උත්පාදනය

මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල මෙම වසරේ ද ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ග දෙකක් දක්නට ලැබිණි. නවදිගන්තය සහ මහනුවර මධ්‍යස්ථානවල පොල් වගාව තුළින් ලබාගන්නා ලද ආදායම් සහ මධ්‍යස්ථානවල ගෙවීම් පදනම මත ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ සේවාලාභීන්ගෙන් ලැබූ ආදායම් වශයෙනි.

උපදේශන සහ ප්‍රතිකාර සේවා සැපයීම

අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ ප්‍රධාන කාර්යාලය මඟින් උපදේශන සේවා, සේවාලාභීන් 1829 දෙනෙක් සඳහා සපයා ඇති අතර මධ්‍යස්ථාන නේවාසික ප්‍රතිකාරයට ඇතුලත් කරගත් සමස්ත සේවාලාභීන් සංඛ්‍යාව 757කි.

11.3.2 බස්නාහිර පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - තලංගම

මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 40කට නේවාසික ප්‍රතිකාරය ලබාදිය හැකිය. මධ්‍යස්ථානය මඟින් 2023 වසරේ සේවාලාභීන් 779 දෙනෙක් සඳහා උපදේශන කටයුතු සිදුකර තිබූ අතර ඉන් සේවාලාභීන් 93 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාර සේවාවන් ලබා දෙන ලදි.

උපදේශන/ නේවාසික ප්‍රතිකාර සේවාවන්	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	779
නේවාසික ප්‍රතිකාර	93

(11.3.2 වගුව)

මෙම වසරේ සිට සේවාලාභීන්ගේ නේවාසික ප්‍රතිකාර ධාරිතාව ඉහළ නැංවීම සඳහා තලංගම මධ්‍යස්ථානය නවීකරණය කරන ලදි. එමෙන්ම ජාතික මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණය පුහුණු කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන් මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලදි.

11.3.3 මධ්‍යම පළාත් (යොවුන්) ප්‍රතිකාර මධ්‍යස්ථානය - මහනුවර

මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 35 දෙනෙකුට එකවර සේවය ලබා දිය හැකිය. මෙම වසරේ මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 163 දෙනෙක් සඳහා උපදේශන කටයුතු ලබා දී තිබූ අතර ඉන්

සේවාලාභීන් 105 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාර සේවාවන් ලබා දෙන ලදි. මෙම මධ්‍යස්ථානය මඟින් අවුරුදු 21ට අඩු දරුවන් ඇතුළත් කර ගැනීම සිදු කරයි.

උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	163
නේවාසික ප්‍රතිකාර	105

(11.3.3 වගුව)

11.3.4 දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - ගාල්ල

මෙම මධ්‍යස්ථානය මඟින් ද එකවර සේවාලාභීන් 40කට සේවය සැපයිය හැකිය. ඒ අනුව දෙනිකව මෙම වසර තුළ සේවාලාභීන් 232 දෙනෙක් සඳහා උපදේශන කටයුතු ද සේවාලාභීන් 144 දෙනෙක් නේවාසික ප්‍රතිකාර කටයුතු සඳහා ද ඇතුලත් කරගෙන තිබුණි.

උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	232
නේවාසික ප්‍රතිකාර	144

(11.3.4 වගුව)

11.3.5 නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - නිට්ටඹුව

සේවාලාභීන් 100කට එකවර සේවය සැපයිය හැකිය. 2023 වසරේ උපදේශනය සැපයූ මුළු සේවාලාභීන් සංඛ්‍යාව 489කි. ඉන් සේවාලාභීන් 415 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාරය ලබා දී තිබුණි.

උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	489
නේවාසික ප්‍රතිකාර	415

(11.3.5 වගුව)


11.3.6 පසුරුකවරණ වැඩසටහන - 2023

එක් එක් මධ්‍යස්ථාන මඟින් 2023 වර්ෂය තුළ නේවාසිකව සිට බැහැර වූ සේවාලාභීන් සම්බන්ධව තොරතුරු පහතින් දක්වා ඇත. මෙහිදී සේවාලාභීන් මධ්‍යස්ථානයට ගෙන්වා ගැනීම, දුරකතන මාර්ගයෙන් තොරතුරු ලබාගැනීම, බාහිරසේවා වැනි ක්‍රම සේවාලාභීන්ගේ පසුරුකවරණය සිදු කිරීම සඳහා උපයෝගී කරගෙන ඇත.

පසුරුකවරණ වැඩසටහන සඳහා යොමු කර ගනු ලැබූ සේවාලාභීන් ප්‍රමාණය

මධ්‍යස්ථානය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
තලංගම													
පසුරුකවරණ	19	05	08	12	62	97	66	66	51	42	85	71	584
නිදහස් පිරිස	44	33	33	34	30	37	26	16	15	15	26	31	340
නුවර													
පසුරුකවරණ	26	28	27	26	22	35	77	32	66	26	57	17	439
නිදහස් පිරිස	23	26	22	21	18	27	55	26	47	25	36	17	343
ගාල්ල													
පසුරුකවරණ	65	43	90	104	116	45	53	72	90	94	166	180	1,118
නිදහස් පිරිස	24	13	34	39	45	29	10	30	31	42	47	50	394
නවදිගන්තය													
පසුරුකවරණ	112	111	170	23	35	53	64	86	83	112	164	132	1,145
නිදහස් පිරිස	35	44	49	17	18	22	53	46	55	69	73	25	506
මුළු එකතුව													**4,869**

(11.3.6 වගුව)



(11.3.6 ප්‍රස්තාරය)

ඉහත සඳහන් තොරතුරු අනුව 2023 වසරේ පසුරැකවරණ කටයුතු කළ සේවාලාභීන්ගෙන් තලංගම මධ්‍යස්ථානයේ 584ක් ද, ගාල්ල මධ්‍යස්ථානයේ 1118ක් ද, නවදිගන්ත මධ්‍යස්ථානයේ සේවාලාභීන් 1145ක් ද, නුවර මධ්‍යස්ථානයේ සේවාලාභීන් 439ක් ද වශයෙන් වන අතර මින් තලංගම මධ්‍යස්ථානයේ 340ක් ද, ගාල්ල මධ්‍යස්ථානයේ 394ක් ද, නවදිගන්ත මධ්‍යස්ථානයේ සේවාලාභීන් 506ක් ද, නුවර මධ්‍යස්ථානයේ සේවාලාභීන් 343ක් දෙනෙක් ද මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්ව සිටි බවට වාර්තා විය. මේ අනුව අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් පමණක් පුනරුත්ථාපනය වී නිදහස්වූවන්ගෙන් 1583ක් මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් වී ඇත.

ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයේ 2022/2023 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	2022	2023
භෞතික ප්‍රගතිය	67%	82%
මූල්‍ය ප්‍රගතිය	98%	82%

ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයේ 2022 වර්ෂයේ භෞතික ප්‍රගතිය 67% ක් සහ 2023 වර්ෂයේ භෞතික ප්‍රගතිය 82% වශයෙන් ද 2022 සහ 2023 වර්ෂවලදී මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 82% ක් සහ 82% ක් වශයෙන් ද දැකගත හැකි විය. පහත දැක්වෙන පොදු කරුණු මෙම විචල්‍යයන් සඳහා හේතු ලෙස දැක්විය හැකිය.

- ඉන්ධන අර්බුදය සහ ප්‍රවාහන අපහසුතා හේතුවෙන් පසුරැකවරණ කටයුතු සඳහා සේවාලාභීන් මධ්‍යස්ථාන වෙත ගෙන්වා ගැනීම අඩු වීම.

- වර්තමානයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල සිටිය යුතු කාර්ය මණ්ඩලයට වඩා අවම කාර්ය මණ්ඩලයකින් ප්‍රතිකාර ක්‍රියාවලිය පවත්වාගෙන යාමට සිදුව තිබීම.

11.4 නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත සහ 2010 අංක 1653/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ ප්‍රතිකාර වැඩසටහන පුළුල් කිරීම සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ එක් අංශයක් ලෙස නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය පිහිටුවා ඇති අතර, මෙම අංශය යටතේ, නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන දහයක්, සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන ප්‍රතිකාර මධ්‍යස්ථාන දෙකක්, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය මඟින් පාලනය වන ප්‍රතිකාර මධ්‍යස්ථාන තුනක් හා ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තවී ඇති පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 13ක් පවතින අතර, එම මධ්‍යස්ථානවල අධීක්ෂණ හා නියාමන කටයුතු සිදු කරනු ලබයි. එමෙන්ම මෙම පනත යටතේ නාමෝදිෂ්ඨ හෝ බලපත්‍ර ලබාගත් ප්‍රතිකාර මධ්‍යස්ථානවල මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ට ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම මෙම අංශය විසින් සපයනු ලබයි.

නම් කරන ලද ප්‍රතිකාර මධ්‍යස්ථාන

1	පල්ලේකැලේ	6	පල්ලන්සේන
2	වටරැක	7	කන්දෙවත්ත
3	තල්දෙන	8	මීතිරිගල
4	වීරවිල	9	අඹේපුස්ස
5	අනුරාධපුරය	10	කන්දකාඩු


ඉහත සඳහන් කල නාමෝදිෂ්ඨ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ රැඳවියන්ගේ මනෝ උපදේශන කටයුතු සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ උපදේශන නිලධාරීන් එම මධ්‍යස්ථාන තුළට අනුයුක්ත කර ඇත.

2023 වසරේ දී නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවල පවත්වන ලද ප්‍රතිකාර වැඩසටහන් සහ විමර්ශන වැඩසටහන්

වැඩසටහනේ නම	වර්ෂය තුළ සිදු කිරීමට නියමිත වැඩසටහන් ප්‍රමාණය	සිදු කරන ලද වැඩසටහන් ප්‍රමාණය	සහභාගි වූ සේවාලාභීන් ගණන
පුද්ගල උපදේශනය (බන්ධනාගාර)	1,200	990	990
කණ්ඩායම් උපදේශනය (බන්ධනාගාර)	225	219	1,050
පවුල් උපදේශනය (බන්ධනාගාර)	135	110	220
විශේෂ වැඩසටහන් (බන්ධනාගාර/ පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන)	04	04	740

නාමෝදිෂ්ඨ මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහන්	04	04	50
පෞද්ගලික ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහන්	04	03	75
නිවාරණ හා අධ්‍යාපන වැඩසටහන් (බන්ධනාගාර/ පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන)	210	198	895
පෞද්ගලික මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන විමර්ශනය	60	42	42
නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන (බන්ධනාගාර) විමර්ශනය	24	16	16
එකතුව	**1,866**	**1,586**	**4,078**

(11.4.1වගුව)



(11.4.1 ප්‍රස්තාරය)

නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා යොමු කරනු ලබන සේවාලාභීන් හට මත්ද්‍රව්‍යවලින් නිදහස්වීමට අවශ්‍ය සහය ලබාදීම, නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථානවලට අනුයුක්තව සේවය කරනු

ලබන උපදේශකවරුන්ගේ ප්‍රධාන වගකීම හා කාර්යභාරය වේ. එබැවින් උපදේශන නිලධාරීන් විසින් ඉහත සඳහන් වැඩසටහන් එම ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළ ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව ප්‍රතිකාර වැඩසටහන සම්පූර්ණ කිරීමෙන් පසු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලින් බැහැරවන සේවාලාභීන් මත්ද්‍රව්‍යයෙන් නිදහස් වී යම් සාර්ථක සංවර්ධන තත්ත්වයන් අත්පත් කරගෙන ඇති බව හඳුනාගත හැක. සේවාලාභියා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරනු ලැබීම ඒ අතර ප්‍රධාන වේ. මත්ද්‍රව්‍ය භාවිතය පුද්ගලයාගේ සෞඛ්‍යයට හා පවුල් ජීවිතයට ඍජුවම බලපානු ලබන අතර, ප්‍රතිකාර ලබා බැහැර වූ පසු ඔවුන් තම මුදල් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යෙදවීම වෙනුවට තම ජීවිතයේ සාර්ථකත්වය සඳහා යොදවනු ලැබීම හේතුවෙන් ඔවුන් මූල්‍යමය වශයෙන් ප්‍රගතියක් අත් කරගෙන, සමාජය තුළ ගෞරවනීය ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදාකරගෙන තිබේ. එමෙන්ම ආදර්ශමත් දෙමාපියන් ලෙස කටයුතු කිරීමට සහ අවංකව හා කැපවීමෙන් කටයුතු කිරීම හේතුවෙන් වෘත්තීමය දියුණුවක් ළඟා කර ගැනීමේ හැකියාව ද ලැබී තිබේ. මත්ද්‍රව්‍යවලින් නිදහස්වීම හේතුවෙන් බාහිර පෙනුම, අන්‍යෝන්‍ය විශ්වාසය, මිත්‍රත්වය වර්ධනය කර ගැනීම වැනි වාසි සහගත තත්ත්වයන් ළඟා කරගෙන ඇති බව හඳුනාගත හැක.

එමෙන්ම ප්‍රතිකාර මධ්‍යස්ථාන විමර්ශනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ප්‍රතිකාර මධ්‍යස්ථානයක පැවතිය යුතු අවම ප්‍රමිතීන් වර්ධනය කිරීම, මධ්‍යස්ථාන තුළ පවතින ප්‍රතිකාර ක්‍රමවේද තවදුරටත් ගුණාත්මක කිරීම, මධ්‍යස්ථාන නිලධාරීන්ගේ තාක්ෂණික දැනුම ඉහළ නැංවීමට හැකියාව ලැබුණි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ අධීක්ෂණය වන පෞද්ගලික මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ 2023 වර්ෂයේ දී නේවාසිකව ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් ප්‍රමාණය

	ප්‍රතිකාර මධ්‍යස්ථානය	ලිපිනය	දුරකථන අංකය	2023 වර්ෂය සඳහා ඇතුළත් වූ සේවාලාභීන් ප්‍රමාණය
01	මිතුරු මිතුරෝ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	මිතුරු මිතුරෝ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය රිල්හේන, පැල්මඩුල්ල	045 2274363	311
02	නිදහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	නිදහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 26, ශ්‍රී සද්ධාතිස්ස මාවත, හිග්ගස්හේන, කුරුවිට	045 2262852	104
03	සෙනෙහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන	සෙනෙහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	011 2613242	88

	මධ්‍යස්ථානය	අංක 80, තුන්බෝවිල, පිළියන්දල	077 1251578	
04	නිසංසල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	නිසංසල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 108, කීනිගම, බුත්පිටිය	033 3555740	55
05	කරුණාවේ නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	කරුණාවේ නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය ඇලිබ, කඳන, හොරණ	077 5110259	172
06	මිදුම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	මිදුම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය සවන් පියස, විජය කුමාරතුංග මාවත, එඬේරමුල්ල, වත්තල	077 7368332	61
07	බලය නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	බලය නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය බමුණුමුල්ල, බණ්ඩාරගම	011 2721812/ 20	58
08	ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය (සමාජ සේවා දෙපාර්තමේන්තුව)	ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අම්බලම් වත්ත උතුර, පුවක්පිටිය, අවිස්සාවේල්ල	071 4445957	79
09	සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය (සමාජ සේවා දෙපාර්තමේන්තුව)	සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය උඟව පලාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව, හාලි ඇළ, උඩුවර	072 3930891	54
10	බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 60/14, ෆාතිමා වත්ත, දලුවකොටුව, කොච්චිකඩේ	077 3955286	964

11	නවජීවන අමද්‍යප හඬ සේවය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	නවජීවන අමද්‍යප හඬ සේවය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය උණවටුන, ගාල්ල	077 1277474 077 9563207	383
12	සිලෝවම් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	සිලෝවම් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය දලුපොත, මීගමුව	077 1146266 071 1258090	288
13	මිතුරු සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	මිතුරු සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය නො. 607/10, පිටිපන හන්දිය, හෝමගම	077 8144414	37
ප්‍රතිකාර ලබාගත් මුළු සේවාලාභීන් සංඛ්‍යාව				**2,654**

(11.4.2 වගුව)

2023 වර්ෂය තුළ පෞද්ගලික මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලින් සේවාලාභීන් 2,654 දෙනෙක් ප්‍රතිකාර ලබාගෙන ඇති බව වාර්තා විය. මෙම සේවාලාභීන් ප්‍රතිකාර කාලසීමාව අවසන් වූ පසු නැවත සමාජගතකිරීම සිදුකරනු ලබයි. එහිදී මත්ද්‍රව්‍යවලින් නිදහස් වූ පුද්ගලයින් හට යහපත් පවුල් ජීවිතයක් ළඟාකර ගත හැකි අතර, ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවල දියුණුවක් සහ මූල්‍යමය ගැටලුවලින් මිදී සාමකාමී ජීවිතයක් ගත කිරීමේ හැකියාව ලැබේ.

නාමෝදිෂ්ඨ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහා 2023 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් ඇතුළත් වී ඇති රැඳවියන් සංඛ්‍යාව

	නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථානය	**ලිපිනය**	**දුරකථන අංකය**	**රැඳවියන් සංඛ්‍යාව**
01	පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර	පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර පල්ලෙකැලේ, කුන්ඩසාලේ	081 4677546	1,381
02	වටරැක බන්ධනාගාරය	වටරැක බන්ධනාගාරය බස්නාහිර පලාත, මීගොඩ	011 4677517	540
03	තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය	තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය තල්දෙන, බදුල්ල	055 3128437	698
04	වීරවිල එළිමහන් සිරකඳවුර	වීරවිල එළිමහන් සිරකඳවුර වීරවිල	047 4933609 047 4927832	946

05	අනුරාධපුර බන්ධනාගාරය	අනුරාධපුර බන්ධනාගාරය අනුරාධපුර	025 4677501	123
06	තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය	තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය පල්ලන්සේන, දළුපොත, මීගමුව	031 4677501	10,351
07	කන්දෙවත්ත එළිමහන් සිරකඳවුර	කන්දෙවත්ත එළිමහන් සිරකඳවුර කන්දෙවත්ත, මීතිරිගල	011 4677545 011 4677576	55
08	මීතිරිගල එළිමහන් වැඩකඳවුර	මීතිරිගල එළිමහන් වැඩකඳවුර මීතිරිගල	011 4677545 011 4677578	මීතිරිගල බන්ධනාගාරයේ රැඳවියන් කන්දෙවත්ත බන්ධනාගාරය වෙත ඇතුළත් කර ඇත.
09	පබෝධා මෙත්සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	පබෝධා මෙත්සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අඹේපුස්ස	035 4677525	248
10	කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය කන්දකාඩු	024 3244959	913
ඇතුළත් වූ මුළු සේවාලාභීන් සංඛ්‍යාව				**15,255**

(11.4.3 වගුව)

නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශයේ 2022/2023 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	2022	2023
භෞතික ප්‍රගතිය	76%	78%
මූල්‍ය ප්‍රගතිය	29%	26%

2022 වර්ෂයේ භෞතික ප්‍රගතිය 76%ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 29%ක් විය. 2023 වර්ෂයේ භෞතික ප්‍රගතිය 78% දක්වා ප්‍රගමනයක් පෙන්නුම් කරනු ලැබූ අතර, මූල්‍ය ප්‍රගතිය 26% ක් විය.

11.5 පර්යේෂණ අංශය

මත්ද්‍රව්‍ය නිවාරණය සහ පාලනය සම්බන්ධයෙන් වැඩසටහන් සැලසුම් කිරීමට සහ අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා සාක්ෂි මත පදනම් වූ නිර්දේශ ඉදිරිපත් කිරීම පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ වගන්ති අංක 07 (ඊ) ප්‍රකාරව අන්තරායකර ඖෂධ දුර්භාවිතය ව්‍යාප්තියට හේතු සාධක සහ ඒ හා බැඳුණු නෛතික, වෛද්‍ය විද්‍යාත්මක, සමාජයීය, සංස්කෘතික හා ආර්ථික කරුණු පිළිබඳ වූ පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම හරහා පර්යේෂණ අංශය එම කාර්යය සිදුකරනු ලබයි.

පර්යේෂණ අංශය 2023 වර්ෂය තුළ දී පහත සඳහන් ප්‍රධාන ඉලක්කගත ක්ෂේත්‍ර හයක් (06) යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබිණ.

1. පර්යේෂණ අධ්‍යයන හා සමීක්ෂණ පැවැත්වීම
2. පර්යේෂණ ප්‍රකාශන
3. පුහුණු වැඩමුළු හා පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීම
4. අන්තර්ජාතික ආයතන සමඟ තොරතුරු හුවමාරුව
5. දත්ත පද්ධති කළමනාකරණය
6. ප්‍රවණතා විශ්ලේෂණය

11.5.1 පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණ

I. මෙතැම්පිටමින් (අයිස්) භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ ජාතික සමීක්ෂණය - 2023

ශ්‍රී ලංකාවේ මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය හඳුනා ගනිමින් මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගල සංඛ්‍යාව භූගෝලීය ප්‍රදේශ මට්ටමින්, ස්ත්‍රී පුරුෂභාවය, වයස වැනි ප්‍රජා විද්‍යාත්මක නිර්ණායක අනුව ඇස්තමේන්තුගත කිරීම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ විය. පොලිස් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව මෙම සමීක්ෂණයට අදාළව ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් දත්ත රැස් කිරීම සිදුකරන ලද අතර රාජ්‍ය සහ රාජ්‍ය නොවන ප්‍රතිකාර මධ්‍යස්ථානවල ප්‍රතිකාර ලබන සේවාලාභීන්ගේ තොරතුරු ද ලබාගන්නා ලදි. බාහිරසේවා නිලධාරීන් විසින් ක්ෂේත්‍රය තුළින් හඳුනාගත් පුද්ගලයින් ද මෙම සමීක්ෂණයේ සංගහණයට ඇතුළත් විය. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් මෙම සමීක්ෂණය සඳහා විශේෂඥ සහාය ලබාදෙන ලදි. සමීක්ෂණයේ පළමු පියවර අවසන් කර මත්ද්‍රව්‍ය දුර්භාවිතය, නිවාරණය හා පාලනය සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නියෝජිතයින් සමඟ විද්වත් සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී ජාතික මට්ටමින් දත්ත රැස්කිරීමේ යාන්ත්‍රණයක අවශ්‍යතාවය සහ එහි අන්තර්ගතවිය යුතු කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදි. එම සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස මෙතැම්පිටමින් භාවිතය පිළිබඳ සමීක්ෂණය සියලු මත්ද්‍රව්‍ය වර්ග පිළිබඳ ජාතික මට්ටමේ සමීක්ෂණයක් ලෙස 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදි.

II. බන්ධනාගාරගත කාන්තා රැඳවියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය: ශ්‍රී ලංකා බන්ධනාගාර ඇසුරින්

කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව බන්ධනාගාර කේන්ද්‍ර කරගනිමින් පර්යේෂණයක් සිදු කරන ලදි. මත්ද්‍රව්‍ය හා වෙනත් වැරදි සඳහා බෝගම්බර, කළුතර, මීගමුව, වාරියපොල සහ වැලිකඩ බන්ධනාගාරයන්හි බන්ධනාගාරගත කාන්තා රැඳවියන් අතරින් කෙදිනක හෝ කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති කාන්තාවන් 80 දෙනෙකු අධ්‍යයන නියැදියට ඇතුළත් කරගන්නා ලදි.

මත්ද්‍රව්‍ය භාවිත කරන කාන්තාවන් මත්ද්‍රව්‍ය අලෙවිය, මත්ද්‍රව්‍ය ජාවාරම එමෙන්ම වාණිජ ලිංගික වෘත්තිය වැනි සමාජ විරෝධී ක්‍රියා තම ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ලෙස සිදු කර ඇති බව අධ්‍යයනයේ දී අනාවරණය වූ ප්‍රධාන කරුණක් විය. කාන්තාවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමට මිතුරු බලපෑම සහ සතුට/ විනෝදය යන ප්‍රධාන සාධක හේතු වී ඇත. තම ප්‍රථම මත්ද්‍රව්‍ය ලෙස මද්‍යසාර, දුම්කොළ නිෂ්පාදන (සිගරට්, දුම්කොළ සැපීම, සිගා) වැනි නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය පමණක් නොව හෙරොයින් හා මෙතැම්පිටමින් වැනි මත්ද්‍රව්‍ය ද කාන්තාවන් විසින් භාවිත කර ඇති බව හඳුනාගත් අතර හෙරොයින් භාවිත කරන කාන්තාවන් අතරින් බහුතරයක් ඇබ්බැහිකාරීත්වයේ උග්‍ර මට්ටමේ සිටින බව තවදුරටත් අධ්‍යයනය මඟින් අනාවරණය විය.

III. මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත අපේක්ෂාවන් පිළිබඳ අධ්‍යයනය - 2023

මත්ද්‍රව්‍ය භාවිත අපේක්ෂාවන් හඳුනා ගැනීමේ මූලික පරමාර්ථය ඇතිව සිදු කරන ලද මෙම අධ්‍යයනයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස කොළඹ දිස්ත්‍රික්කය තෝරා ගනු ලැබිණ. මද්‍යසාර, ගංජා, හෙරොයින් සහ මෙතැම්පිටමින් (අයිස්) යන එක් එක් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් දස දෙනෙකු බැගින් පුද්ගලයින් 40 දෙනෙකු නියැදියට ඇතුළත් කරගන්නා ලදි.

මද්‍යසාර, ගංජා, හෙරොයින් සහ මෙතැම්පිටමින් (අයිස්) වැනි මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් පුද්ගලයින් තුළ ධනාත්මක මෙන්ම ඍණාත්මක අපේක්ෂා පවතින බව හඳුනාගත හැකි වූ අතර භාවිත කරනු ලබන මත්ද්‍රව්‍ය අනුව මත්ද්‍රව්‍ය භාවිත අපේක්ෂාවන්හි විවිධ විෂමතා හඳුනාගත හැකි විය. එකම මත්ද්‍රව්‍ය වුවද එක් එක් පුද්ගලයා අනුව මත්ද්‍රව්‍ය භාවිත අපේක්ෂාවල විවිධතා හඳුනාගත හැකි විය. අධ්‍යයන අනාවරණ නිවාරණ වැඩසටහන් සැලසුම් කිරීමට සහ නිවාරණ වැඩසටහන්වල අන්තර්ගතය සමාලෝචනය කිරීම සඳහා යොමු කර ඇත.

IV. නීතිවිරෝධී ගංජා වගාව ආශ්‍රිත ප්‍රවණතා සහ භාවිතය සම්බන්ධ මහජන ආකල්ප පිළිබඳ අධ්‍යයනය

ගංජා භාවිතය ආශ්‍රිත නූතන ප්‍රවණතා සහ ඒ ආශ්‍රිත රටා හඳුනා ගැනීම, ගංජා වගාකරුවන්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක පැතිකඩ හඳුනා ගැනීම, ගංජා නීතිගත කිරීම පිළිබඳ සාමාන්‍ය ප්‍රජාවගේ අදහස් හා ආකල්ප හඳුනා ගැනීම මූලික අරමුණු කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්ක මූලික කරගනිමින් සිදු කළ මෙම අධ්‍යයනය සඳහා පුද්ගලයින් 30 දෙනෙකු අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ තෝරාගන්නා ලද අතර ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යොදා ගනිමින් දත්ත රැස් කරන ලදි.

V. මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින්ගේ සෞඛ්‍ය චර්යා පිළිබඳ අධ්‍යයනය

මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වී ඇති පුද්ගලයින්ගේ අවදානම් සෞඛ්‍ය චර්යා හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පුද්ගලයින්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය මට්ටම ඉතාමත් දුර්වල තත්ත්වයක පවතින බවට තොරතුරු අනාවරණය විය. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් තමන්ගේ ශරීර සෞඛ්‍ය පිළිබඳ ඉතා අඩු අවධානයක් දක්වන ලද අතර මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඇතිවන දුර්වල සෞඛ්‍ය තත්ත්වය මත රැකියාව සඳහා ගත කරන කාලය අඩුවීම, රැකියා විරහිත බව, වෘත්තීමය වශයෙන් කාර්යක්ෂම බව අඩුවීම සහ රැකියාව අහිමි වීම වැනි තත්ත්වයන්ට මොවුන් මුහුණ දී ඇත. මොවුන් හට යම් දෙයක් කෙරෙහි පූර්ණ වශයෙන් අවධානය දැක්වීමේ නොහැකියාව, මතකයේ දුර්වලතා සහ අබණ්ඩව යම් කාර්යයක් සිදු කිරීමේ නොහැකියාව ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි විය.

VI. මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සහිත සේවාලාභීන් සඳහා ක්‍රියාත්මක වන ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන්වල ප්‍රතිඵලදායක බව පිළිබඳ අධ්‍යයනය (අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර සේවාවන් ඇසුරින්)

ප්‍රතිකාර සේවාවන්වල අපේක්ෂිත ප්‍රමිතීන්වලට අනුගත වීම හෝ අපගමනය වීම පිළිබඳ අධ්‍යයනය කිරීම, ප්‍රතිකාර ක්‍රමවේදයේ ප්‍රතිඵලදායක බව අධ්‍යයනය කිරීම, සේවාලාභීන් ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසු නැවත මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමු වීමට බලපා ඇති මනෝවිද්‍යාත්මක, සමාජ හා පාරිසරික සාධක හඳුනා ගැනීම, වඩා ඵලදායී ප්‍රතිකාර ක්‍රමයක් සඳහා අදාළ යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණු විය. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන 04 හි 2023 වර්ෂයේ ජනවාරි සිට ජූනි දක්වා ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන්ගෙන් නියැදිය සඳහා පුද්ගලයින් තෝරාගන්නා ලද අතර දත්ත රැස්කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

VII. ළමා මනෝ සමාජයීය සංවර්ධනය කෙරෙහි දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම

දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය දරුවන්ගේ මනෝ සමාජයීය සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූ අතර දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය තුළින් පවුලට සිදුවන බලපෑම අධ්‍යයනය කිරීම, දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය තුළින් දරුවන්ට ඇති වී තිබෙන මනෝ සමාජයීය ගැටලු සුවිශේෂීව හා වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමත්, දරුවන්ට ඇති වී තිබෙන මනෝ සමාජයීය ගැටලු හේතුවෙන් ඔවුන් මුහුණ දෙන වෙනත් ගැටලු හඳුනා ගැනීමත් අධ්‍යයනයේ අරමුණු බවට පත්විය.

දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය නිසා ළමුන්ට ඇති විය හැකි බලපෑම් සහගත තත්ත්ව ලෙස චිත්තවේගීය හා මානසික අක්‍රමතා ඇති වීම, පවුල තුළ පවතින සම්බන්ධතා පවත්වා ගෙන යාමේ දුෂ්කරතා ඇති වීම, අධ්‍යාපන ඉලක්ක සාධනය දුර්වල වීම, චර්යාමය ගැටළු ඇති වීම, දරුවාට පවුල


තුළින් හිමි විය යුතු රැකවරණය, ආදරය, කරුණාව, අවධානය, වයසට සරිලන ලෙස පිළිගැනීම අඩු වීම හඳුනාගත හැකිවිය.

VIII. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සඳහා ප්‍රජා පාදක ප්‍රතිකාර ක්‍රමයෙහි ඵලදායීතාව - 2023

ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ක්‍රියාත්මක කර ඇති ප්‍රජා පාදක ප්‍රතිකාර ක්‍රමයේ ඵලදායීතාව තක්සේරු කිරීම සඳහා මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කර ඇත. නේවාසික ප්‍රතිකාර ක්‍රමවේදය වෙනුවට ප්‍රජා පාදක ප්‍රතිකාර ප්‍රවේශය වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධනේ අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම මේ හරහා සිදුකරනු ඇත.

11.5.2 පර්යේෂණ ප්‍රකාශන

I. මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත - 2023



ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධයෙන් විවිධ නිර්ණායක ඔස්සේ රැස්කරන ලද දත්ත විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කරමින් මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කර ඇති අතර මේ හරහා ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාගැනීමේ හැකියාව ඇත. මෙය මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ ජාතික මට්ටමේ නිල සංඛ්‍යාලේඛන අත්පොත වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ පර්යේෂණ ලිපි එකතුව - VII වන වෙළුම

සාක්ෂි මත පදනම් වූ ප්‍රවේශයන්, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් සැලසුම්කරණය සඳහා වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීම තහවුරු කිරීම සහ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ අධ්‍යයන හා පර්යේෂණ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට අවශ්‍ය පරිශීලන මූලාශ්‍රයක් වශයෙන් සමාජගත කිරීමේ අරමුණින් පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත් කරනු ලැබේ. "මත්ද්‍රව්‍ය භාවිතය" සම්බන්ධ විවිධ දිශානතීන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලද පහත සඳහන් පර්යේෂණ ලිපි සංගෘහිත කරමින් "ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ පර්යේෂණ ලිපි එකතුව - VII වන වෙළුම" සම්පාදනය කරමින් පවතී.

- මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින්ගේ සෞඛ්‍ය චර්යා
- අධි අවදානම් කණ්ඩායම් අතර අලුතින් උද්ගත වන මත්ද්‍රව්‍යය භාවිත රටා සහ චර්යා
- බන්ධනාගාරගත කාන්තා රැඳවියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය
- ගංජා භාවිතයේ ප්‍රවණතා සහ නීතිගත කිරීම සම්බන්ධ මහජන ආකල්ප
- ශ්‍රී ලංකාවේ තෝරාගත් පුනරුත්ථාපන මධ්‍යස්ථානවල නේවාසික ප්‍රතිකාර සඳහා ලියාපදිංචි වූ පුද්ගලයන්ගේ මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ ප්‍රවණතා සහ ලක්ෂණ
- කොවිඩ් - 19 වසංගත තත්ත්වය සහ ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවණතා

- ශ්‍රී ලංකාවේ නේවාසික ප්‍රතිකාර සඳහා ඇතුළත් වන මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සහිත පුද්ගලයින්ගේ සෞඛ්‍ය හා ජීවන තත්ත්වය
- ළමා මනෝ සමාජයීය සංවර්ධනය කෙරෙහි දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම

II. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ "Newsletter" කාර්තුමය සඟරාව

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් සිදු කරනු ලබන සේවාවන් ප්‍රවර්ධනය කරමින් සාමාන්‍ය ජනතාවගේ අවධානය මත්ද්‍රව්‍ය නිවාරණ හා පාලන යාන්ත්‍රණය වෙත ලබාගැනීම සඳහාත්, එමෙන්ම ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන්, ක්‍රියාකාරකම් හා සේවාවන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහාත් මෙම කාර්තුමය සඟරාව ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රධාන පරමාර්ථ වේ. 2023 වර්ෂය තුළ 35 වන කලාපය (ජනවාරි - මාර්තු), 36 වන කලාපය (අප්‍රේල් - ජුනි) සහ 37 වන කලාපය (ජූලි - සැප්තැම්බර්) ප්‍රකාශයට පත් කර ඇත.

11.5.3 පුහුණු වැඩමුළු හා පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීම

I. ජාතික හා අන්තර්ජාතික පර්යේෂණ සැසි සඳහා පර්යේෂණ සාරසංක්ෂේප (Abstracts) **සහ පත්‍රිකා ඉදිරිපත් කිරීම**

2023 වසර තුළ පහත සඳහන් පර්යේෂණ පත්‍රිකා ජාතික මට්ටමින් සහ අන්තර් ජාතික මට්ටමින් පවත්වන ලද පර්යේෂණ සැසි සඳහා ඉදිරිපත් කර ඇත.

අනු අංකය	පර්යේෂණ සැසිය	ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකාව
1	සමාජයීය විද්‍යා සහ මානව විද්‍යා පිළිබඳ ජාතික පර්යේෂණ සැසිය - 2023 (රජරට විශ්වවිද්‍යාලය)	• මෙතැම්පිටමින් භාවිතය සහ පුද්ගල මානසික හා කායික සෞඛ්‍ය කෙරෙහි එහි බලපෑම • කාන්තාවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම කෙරෙහි බලපාන සාධක (ශ්‍රී ලංකා බන්ධනාගාර ඇසුරින්)
2	සමාජයීය විද්‍යා සහ මානව විද්‍යා පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය - 2023 (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)	• සමරිසි පුද්ගලයින් අතර මත්ද්‍රව්‍ය භාවිත රටා සහ චර්යා • මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපනයෙන් පසු පුද්ගලයින් නැවත භාවිතය කෙරෙහි යොමු වීමට බලපාන මනෝ සමාජයීය සාධක • තරුණයින් හා නව යොවුන් වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්ෂණ • විශ්වවිද්‍යාල සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය හා ඒ ආශ්‍රිත ප්‍රවණතා

II. පුහුණු වැඩසටහන් පැවැත්වීම

අනු අංකය	වැඩසටහන	සහභාගීත්වය	වැඩසටහන් සංඛ්‍යාව	නිලධාරීන් සංඛ්‍යාව
1	මෙතැම්පිටමින් මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ ඒ සම්බන්ධ නෛතික පසුබිම	පොලිස් නිලධාරීන්	13	765
2	MAS Holdings Group හි උපදේශන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන	උපදේශන නිලධාරීන්	01	40
3	මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත කාලීන ප්‍රවණතා පිළිබඳ නාවික හමුදා නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන	නාවික හමුදා නිලධාරීන්	02	120
4	එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය සමඟ ඒකාබද්ධව ජාතික මට්ටමේ දත්ත වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම සම්බන්ධ විද්වත් සාකච්ඡාව	රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නියෝජිතයින්	01	3520





11.5.4 අන්තර්ජාතික සහයෝගීතාවය

I. අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය (International Narcotics Control Board) **සමඟ දත්ත හුවමාරු කිරීම**

ශ්‍රී ලංකා රජය විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන සම්මුතීන් ප්‍රකාරව සහ ඊට අනුෂාංගිකව උද්ගතවන කාරණා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අදාළ තොරතුරු සහ දත්ත මාසිකව, ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව INCB වෙත යොමු කරනු ලබයි. මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විවිධ ආයතන සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය දත්ත කාලීනව යොමු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

ත්‍රෛමාසිකව යොමු කරන ලද දත්ත වාර්තා

- මාදක ඖෂධ ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය A) 4 වන කාර්තුව 2022 සහ 1 වන කාර්තුව, 2 වන කාර්තුව, 3 වන කාර්තුව 2023
- 1971 සම්මුතියේ ලැයිස්තු අංක 2 හි සඳහන් මනෝවර්තක ද්‍රව්‍ය ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය A/P) 4 වන කාර්තුව 2022 සහ 1 වන කාර්තුව, 2 වන කාර්තුව, 3 වන කාර්තුව 2023

වාර්ෂිකව යොමු කරන ලද දත්ත වාර්තා

- මාදක ඖෂධ පිළිබඳ අවශ්‍යතා ඇස්තමේන්තු (පෝරමය B)
- 1971 මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතියේ ලැයිස්තු 2 හි අඩංගු වෛද්‍යමය හා විද්‍යාත්මක අවශ්‍යතා සඳහා වන ඖෂධ වර්ග (පෝරමය B/P)
- මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය නිෂ්පාදනය, පරිභෝජනය, ගබඩා කිරීම හා වැටලීම් පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය C)
- මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය P)
- ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව සම්පාදනය සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් දත්ත වාර්තා කිරීම - වාර්ෂික දත්ත වාර්තා කිරීමේ ප්‍රශ්නාවලිය

II. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) සමඟ දත්ත හුවමාරු කිරීම

- මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් අතරින් විශාල පරිමාණයේ මත්ද්‍රව්‍ය වැටලීම් සම්බන්ධ සිද්ධීන් පිළිබඳ (Individual Drug Seizures Report-IDS) දත්ත වාර්තා කිරීම - පළමුවන කාර්තුව (ජනවාරි - මාර්තු), දෙවන කාර්තුව (අප්‍රේල් - ජුනි) සහ තුන්වන කාර්තුව (ජූලි - සැප්තැම්බර්)

III. කෘතිම ඖෂධ සඳහා ගෝලීය ප්‍රතිචාරය වේගවත් කිරීම සහ ශක්තිමත් කිරීම පිළිබඳ අමාත්‍ය ප්‍රකාශය

- 2023 ජූලි 7 වන දින පැවති රැස්වීමේදී දැනුවත් කිරීම සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙත අදාළ යෙදවුම් ඉදිරිපත් කරන ලදි.

IV. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ (UNGA) 78 වැනි සැසිවාරය

මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ පාලනය කිරීම සහ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන ප්‍රඥප්තිවලට අදාළ ජාත්‍යන්තර බැඳීම් පවත්වා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ක්‍රියාමාර්ග ඇතුළත් කෙටි වාර්තාවක් සකස් කර විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදි.

V. **45 ආසියා සහ ෆැසිපික් කලාපීය රටවල මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරන ආයතන ප්‍රධානීන්ගේ (Head of National Drug Law Enforcement Agencies Asia - HONLEA) රැස්වීම**

- මෙම රැස්වීමට අදාළව ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ ප්‍රශ්නාවලිය සම්පූර්ණ කර කෙටි වාර්තාවක් සමඟ ඉදිරිපත් කරන ලදි.
- රැස්වීමට සහභාගී වීම සහ අවශ්‍යය යෙදවුම් ඉදිරිපත් කිරීම.

VI. **එක්සත් ජනපදයේ ලේකම්ගේ නිල සංචාරය නැගෙනහිර පළාත**

මේ සඳහා සාකච්ඡාවන්වලට නිලධාරීන් සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය වාර්තා යොමු කිරීම සිදුකර ඇත.

VII. **යුරෝපා සංගමයේ 25 වැනි සැසිවාරය සහ ශ්‍රී ලංකාව පිළිබඳ ඒකාබද්ධ කොමිසම**

යුරෝපා සංගමය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සම්බන්ධයෙන් අවශ්‍ය නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සහ එම රැස්වීම සඳහා සහභාගී වීම.

VIII. **ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර සහයෝගීතාව**

මාලදිවයින් ජාතික ඖෂධ නියෝජිතායතනය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා යෙදවුම් ඉදිරිපත් කිරීම සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ද්විපාර්ශ්වික රැස්වීමට සහභාගී වීම.

IX. **අන්තර්ජාතික රැස්වීම් සහ සංසද සඳහා සහභාගී වීම**

Commission on Narcotic Drugs (CND) හි සියලු සැසි සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වීම සහ ශ්‍රී ලංකාව විසින් මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් ගෙන ඇති පියවර පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සිදුකර ඇත.

X. **ජාත්‍යන්තර හෝ කලාපීය ප්‍රතිපත්තිමය ලේඛන සඳහා නිරීක්ෂණ සහ යෙදවුම් ඉදිරිපත් කිරීම**

UNODC සහ BIMSTEC අතර අවබෝධතා ගිවිසුම සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

11.5.5 දත්ත පද්ධති කළමනාකරණය

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය (Drug Abuse Monitoring System - DAMS)

මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත්වන පුද්ගලයින්ගේ සහ මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමිකතා සඳහා ප්‍රතිකාර සේවාවන්වලට ඇතුළත් වන සේවාලාභීන්ගේ දත්ත වාර්තා කිරීමේ සහ එම දත්ත මත පදනම්ව විශ්ලේෂණාත්මක වාර්තා ඉදිරිපත් කිරීමේ අරමුණින් මෙම දත්ත පද්ධතිය පවත්වාගෙන යනු ලබයි. මාර්ගගත දත්ත පද්ධතියට සියලුම පොලිස් ස්ථාන සහ ප්‍රතිකාර මධ්‍යස්ථාන (රාජ්‍ය/ රාජ්‍ය නොවන/ බන්ධනාගාර) මඟින් දත්ත වාර්තා කිරීම සිදුවේ. මත්ද්‍රව්‍ය

සම්බන්ධ ප්‍රතිකාර සඳහා ඇතුළත් වන සේවාලාභීන්ගේ තොරතුරු සෑම කාර්තුවකට වරක් විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කරනු ලබයි. ඒ අනුව 2023 වර්ෂය තුළ දී වාර්තා 04ක් ප්‍රකාශයට පත්කර ඇත.

- මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූ සේවාලාභීන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව (2022 වාර්ෂික වාර්තාව - වෙළුම 127/ 2023 පළමුවෙනි කාර්තුව - 128 වෙළුම/ 2023 දෙවෙනි කාර්තුව - 129 වෙළුම/ 2023 තෙවැනි කාර්තුව - 130 වෙළුම)

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියට වාර්තා වූ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත් වූ පුද්ගලයින්ගේ තොරතුරු විශ්ලේෂණය කරමින් පහත වාර්තා ප්‍රකාශයට පත්කරන ලදි.

- වාර්ෂික වාර්තාව (මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව ජනවාරි සිට දෙසැම්බර් දක්වා - 64 වෙළුම), අර්ධ වාර්ෂික (2023 ජනවාරි සිට ජුනි දක්වා) වාර්තාව (මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 65 වෙළුම)

දත්ත පද්ධතිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම සඳහා දත්ත වාර්තා කිරීමේ පත්‍රිකා මුද්‍රණය කර පොලිස් ස්ථාන සහ ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කිරීම සහ දත්ත පද්ධතිය සම්බන්ධ තාක්ෂණික ගැටලු මතුවන අවස්ථාවල අදාළ මැදිහත්වීම් සිදුකර ගැටලු නිරාකරණය කරගැනීමට සහාය දැක්වීම සිදු කරන ලදි.

මත්ද්‍රව්‍ය දුර්භාවිතය සමබන්ධ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම පිළිබඳ පොලිස් නිලධාරීන් පුහුණු කිරීම

පුහුණු වැඩමුළුව	සහභාගී වූ පොලිස් නිලධාරීන් සංඛ්‍යාව	පුහුණු වැඩසටහන් සංඛ්‍යාව
කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශ නිලධාරීන් සඳහා	100	02

- 2023 වර්ෂයේ ජුනි මස සිට අත්අඩංගුවට පත්වූ පුද්ගලයින් පිළිබඳ දත්ත පද්ධතිය සම්බන්ධීකරණය කිරීම සඳහා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය විසින් කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශ නිලධාරීන් වෙත පවරන ලදි.

11.5.6 ප්‍රවණතා විශ්ලේෂණය

2023 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවණතා හඳුනා ගැනීම සඳහා පහත සඳහන් විශ්ලේෂණාත්මක වාර්තා සම්පාදනය කරන ලදි.

- මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් සහ ප්‍රතිකාර ඇතුළත් කිරීම් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව (ජනවාරි - දෙසැම්බර්, 2022)
- මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට පත්වීම් පිළිබඳ වාර්තාව (ජනවාරි - ජුනි 2023)

- ගෝලීය මද්‍යසාර සහ දුම්කොළ පරිභෝජනයෙහි පසුබිම (ලෝක සෞඛ්‍ය සංවිධානයේ සංඛ්‍යාලේඛන ඇසුරින්)
- දකුණු ආසියාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිත තත්ත්වය (INCB වාර්ෂික වාර්තාව 2022 ඇසුරින්)
- මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් පිළිබඳ විශ්ලේෂණ වාර්තා (ජනවාරි - දෙසැම්බර් 2022)
- මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් පිළිබඳ විශ්ලේෂණ වාර්තා (ජනවාරි - ජුනි 2023)

දිවයින පුරා මහේස්ත්‍රාත් අධිකරණවලින් වාර්තා වූ විනාශ කරන ලද මත්ද්‍රව්‍ය පිළිබඳ දත්ත ආශ්‍රිත විශ්ලේෂණ වාර්තා

- විනාශ කරන ලද මත්ද්‍රව්‍ය පිළිබඳ විශ්ලේෂණ වාර්තා (ජනවාරි - මාර්තු 2023)
- විනාශ කරන ලද මත්ද්‍රව්‍ය පිළිබඳ විශ්ලේෂණ වාර්තා (මාර්තු - ජුනි 2023)
- විනාශ කරන ලද මත්ද්‍රව්‍ය පිළිබඳ විශ්ලේෂණ වාර්තා (ජූලි - ඔක්තෝම්බර් 2023)

11.5.7 ප්‍රගති වාර්තා සම්පාදනය

සැලසුම් සකස් කිරීම සහ ප්‍රගති වාර්තා සම්පාදනය සම්බන්ධයෙන් 2022 වර්ෂයේ දී පහත සඳහන් කාර්යයන් පර්යේෂණ අංශය විසින් සිදුකරන ලදි.

- 2022 වර්ෂයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇතුළත් වාර්තාව (හතරවන කාර්තුව) සම්පාදනය කර රේඛීය අමාත්‍යාංශයට යොමු කිරීම.
- 2023 වර්ෂයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇතුළත් වාර්තාව (පළමු කාර්තුව, දෙවන කාර්තුව සහ තුන්වන කාර්තුව) සම්පාදනය කර රේඛීය අමාත්‍යාංශයට යොමු කිරීම.

11.5.8 දේශීය සහ විදේශීය ආධාර සහ තාක්ෂණික සහාය ලබාගැනීමට අදාළ ව්‍යාපෘති

- ලෝක සෞඛ්‍ය සංවිධානයේ (World Health Organization) 2022 වාර්ෂික මූල්‍යාධාර වැඩසටහන යටතේ පර්යේෂණ අංශයෙහි කාර්ය මණ්ඩලයේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර රු. 1,690,912.15 ක මූල්‍යාධාර මුදලක් ලබා ගැනීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) 2022 වාර්ෂික මූල්‍යාධාර වැඩසටහන යටතේ නිවාරණ/ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සහ බාහිරසේවා කාර්ය මණ්ඩලයේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා යොමු කිරීම සහ මූල්‍යාධාර ලබා ගැනීම.

11.5.9 මත්ද්‍රව්‍ය නිවාරණය සහ පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය සහ පාලනය සඳහා වූ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමේ උපදේශන රැස්වීම කොළඹ කිංග්ස්බරි හෝටලයෙහි දී සාර්ථකව අවසන් කරන ලදි.

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) නියෝජිතයින්, UNODC හි නියෝජිතයින් සහ අදාළ පාර්ශ්වකරුවන් නියෝජනය කරමින් නිලධාරීන් රැසක් මෙම අවස්ථාවට සහභාගී විය.



ජාතික ප්‍රතිපත්තියේ ප්‍රධාන අංශ වන ඉල්ලුම අඩු කිරීම, සැපයුම පාලනය, සම්බන්ධීකරණය සහ සහයෝගිතාව, පර්යේෂණ සහ තොරතුරු කළමනාකරණය, සහ අධීක්ෂණ සහ ඇගයීම යන කරුණු එක් එක් සැසිවාර තුළදී සාකච්ඡා කරන ලද අතර, ජාතික ප්‍රතිපත්තියට ඇතුළත් කිරීමට නිරීක්ෂණ/ නිර්දේශ කිහිපයක් සිදු කරන ලදි. අමාත්‍යාංශ, දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සහ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන/ සංවිධාන නියෝජනය කරමින් පාර්ශ්වකරුවන් 80කට අධික පිරිසක් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මෙම රැස්වීම සමඟ සම්බන්ධ විය.

පර්යේෂණ අංශයේ 2022/23 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	2022	2023
භෞතික ප්‍රගතිය	93%	95%
මූල්‍ය ප්‍රගතිය	63.1%	78%

2023 වර්ෂයේ භෞතික ප්‍රගතිය 95% ක් වූ අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පර්යේෂණ අධ්‍යයන හා සමීක්ෂණ පැවැත්වීම, පර්යේෂණ ප්‍රකාශන, පුහුණු වැඩමුළු හා පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීම, අන්තර්ජාතික ආයතන සමඟ තොරතුරු හුවමාරුව, දත්ත පද්ධති කළමනාකරණය සහ ප්‍රවණතා විශ්ලේෂණය යන උපාය මාර්ග ඔස්සේ පර්යේෂණ අංශයේ අරමුණු සහ ඉලක්ක සපුරා ඇති අතර 2023 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය සඳහා වන වැඩසටහන් සඳහා දායකත්වය ලබා දීමට පර්යේෂණ අංශයට හැකියාව ලැබී ඇත. 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය 63.1%ක් වූ අතර 2023 දී 78% ක් විය. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී පර්යේෂණ අංශයෙහි ක්‍රියාකාරකම් වල සැලකිය යුතු මට්ටමේ ප්‍රගතියක් හඳුනා ගත හැකිය.

11.6 ජාතික මාදක රසායනාගාරය

මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් සියලුම විද්‍යාත්මක කාර්යයන් ආවරණය කිරීම සඳහා අත්‍යාවශ්‍ය සහ අංග සම්පූර්ණ විද්‍යාත්මක ඒකකයක් ලෙස ජාතික මාදක රසායනාගාරය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුබද්ධිතව ස්ථාපිත කර ඇත. අන්තරායකර ඖෂධ සැපයුම් පාලනය සහ ඉල්ලුම අවම කිරීම සඳහා රසායනාගාර විශ්ලේෂණය, විද්‍යාත්මක පර්යේෂණ, විද්‍යාත්මක පුහුණුව, තාක්ෂණික සහය සැපයීම, විද්‍යාත්මක නිර්දේශ සහ උපදේශන සේවා සිදු කිරීමෙහි නිරත වේ.

ජාතික මාදක රසායනාගාරය විසින් විමර්ශන, බුද්ධිමය සහ අධිකරණමය අරමුණු සහ කටයුතු සඳහා, නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් ඉදිරිපත් කරන ලද සැක සහිත ඖෂධ සාම්පල (මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය, පුරෝගාමී රසායනික ද්‍රව්‍ය) විශ්ලේෂණය කිරීම සහ මධ්‍යසාර, පාලිත ඖෂධ, පාලිත රසායනික ද්‍රව්‍ය (පුරෝගාමී), ක්‍රීඩා ආශ්‍රිත පෝෂණ අතිරේක සාම්පල ද නියාමන අරමුණු සඳහා විශ්ලේෂණය සිදු කෙරේ. තව ද මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් හඳුනාගැනීම සඳහා රෝහල්, අධිකරණ, ප්‍රතිකාර මධ්‍යස්ථාන, රජයේ සහ පෞද්ගලික අංශයේ සේවා ස්ථාන මඟින් ඉදිරිපත් කරන ජීව විද්‍යාත්මක නිදර්ශක විශ්ලේෂණය කිරීම ද සිදු කෙරේ.

එමෙන්ම ජාතික මාදක රසායනාගාරය විසින්, අන්තරායකර ඖෂධ සැපයුම පාලනය, ඉල්ලුම අවම කිරීම සහ දුර්භාවිතය වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කරමින් විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් නිවාරණ ක්‍රමෝපාය ප්‍රවර්ධනය කිරීමේ අරමුණු මත පදනම්ව සිය දෛනික සහ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරනු ලබයි.

11.6.1 නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, ජාවාරම් කිරීම, විකිණීම සහ භාවිතයට එරෙහිව ඵලදායී ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යාත්මක සහය ලබා දීම.

I. විමර්ශන, මෙහෙයුම්, බුද්ධිමය සහ අධිකරණ කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුළ පවතින සැක සහිත ඖෂධ ද්‍රව්‍ය හඳුනාගැනීම සහ විශ්ලේෂණය

2023 වර්ෂයේ දී නීතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතන විසින් කරන ලද ඉල්ලීම් අනුව, ජාතික මාදක රසායනාගාරය මඟින් අවස්ථා 46ක දී මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල 96ක් සඳහා විශ්ලේෂණයන් සිදුකොට ඇත. ඉහත විශ්ලේෂණ ප්‍රතිඵල ජාතික හා අනෙකුත් වගකිව යුතු ආයතන සමඟ බෙදා ගනිමින් මත්ද්‍රව්‍ය ගැටළුව පිළිබඳ විවිධ මෙහෙයුම් සකස් කිරීම, නව ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණ කිරීම, උපක්‍රමික විශ්ලේෂණ කිරීම, නීති ප්‍රතිපත්ති විශ්ලේෂණය හා සැකසුම් අවශ්‍යතා, නෛතික සහ සෞඛ්‍ය ගැටළු අවම කිරීම යන අරමුණු ඉටුකරගැනීම කර ගැනීම සඳහා භාවිත කර ඇත. මෙම අනාවරණ මඟින් රටේ නීති බලගැන්වීම, අපරාධ නිවාරණය හා සෞඛ්‍ය ප්‍රතිපත්ති සැකසීම් සඳහා සුවිශේෂී බලපෑමක් ඇති කරනු ලබයි.

තවද මහේස්ත්‍රාත් අධිකරණ නියෝගයන්ට අදාලව නිකුත් කරන ලද විශ්ලේෂණ වාර්තා, නඩු පැවරීම සම්බන්ධයෙන් ගත යුතු නෛතික ක්‍රියාමාර්ග තීරණය කිරීම සඳහා යොදා ගැනේ.

විෂ වර්ග අබිං සහ අන්තරායදායක ඖෂධ පාලන ආඥාපනත හා 2008 අංක 01 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත යටතේ, පාලනය වන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන විසින් ජාතික මාදක රසායනාගාරය වෙත යොමුකරන ලද මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල පිළිබඳ සිදු කරන ලද පර්යේෂණාත්මක විශ්ලේෂණ පහත පරිදි වේ.

ආයතනය		ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ.	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.
මහේස්ත්‍රාත් අධිකරණ	අවස්ථා	-	01	02	-	01	-	01	-	01	01	-	05
	සාම්පල සංඛ්‍යාව	-	01	04	-	01	-	01	-	02	01	-	05
පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය	අවස්ථා	-	-	01	-	-	-	01	-	-	-	-	-
	සාම්පල සංඛ්‍යාව	-	-	01	-	-	-	04	-	-	-	-	-
විශේෂ විමර්ශන ඒකකය ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් හේවා බලකාය	අවස්ථා	02	01	01	03	01	02	-	-	01	01	03	01
	සාම්පල සංඛ්‍යාව	03	02	01	04	03	18	-	-	01	04	04	01
ශ්‍රී ලංකා රේගුව	අවස්ථා	-	01	-	-	01	01	-	02	-	-	-	-
	සාම්පල සංඛ්‍යාව	-	02	-	-	06	02	-	04	-	-	-	-
ශ්‍රී ලංකා පොලීසිය	අවස්ථා	-	-	-	01	-	-	-	-	-	01	-	-
	සාම්පල සංඛ්‍යාව	-	-	-	02	-	-	-	-	-	01	-	-
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	අවස්ථා	-	-	-	-	01	01	-	-	-	-	-	-
	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	01	04	-	-	-	-	-	-
නෙට් නිෂ්පාදනය (පුද්ගලික) සමාගම	අවස්ථා	-	-	-	-	-	-	-	-	-	-	01	-
	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	-	01	-
කු/ ඩී.එස්. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය, කුරුණෑගල	අවස්ථා	-	-	-	-	-	-	-	-	-	-	01	-
	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	-	01	-
අ.ඖ.පා.ජා.ම.	අවස්ථා	-	03	-	-	-	01	-	-	-	01	-	-
	සාම්පල සංඛ්‍යාව	-	07	-	-	-	01	-	-	-	03	-	-
එකතුව	අවස්ථා	02	06	04	04	04	05	02	02	02	04	05	06
	සාම්පල සංඛ්‍යාව	03	12	06	06	11	25	05	04	03	09	06	06

වගු අංක 1- 2023 වසර තුළදී විශ්ලේෂණය කරන ලද මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල සංඛ්‍යා

මුළු අවස්ථා සංඛ්‍යාව : 46

මුළු සාම්පල සංඛ්‍යාව : 96

II. වීදි හෙරොයින් පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය

පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති අඛණ්ඩව සිදුකරනු ලැබේ.

- වීදිවල දක්නට ලැබෙන හෙරොයින්වල මිල සහ පිරිසිදුභාවය අනාවරණය කර එහි ඇති සම්බන්ධතාවය හඳුනාගැනීම සඳහා සිදුකරනු ලබන පර්යේෂණ
- හෙරොයින් සාම්පලවල මූලාරම්භය හා විකාශනය හඳුනාගැනීම
- වීදි හෙරොයින් සාම්පලවල ඇති නව තනුකකරණ ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා වන විශ්ලේෂණයන්

බස්නාහිර පළාතේ විවිධ ප්‍රදේශවලින් 2023 වර්ෂය සඳහා ලැබුණු "වීදි" සාම්පල දහ හතර (14) පවතින තනුකරණ ද්‍රව්‍ය/ එකතු කරන වෙනත් ද්‍රව්‍ය සහ ඒවායේ ඩයිඇසිටයිල් මොර්ෆීන් (DAM) අන්තර්ගතය සම්බන්ධයෙන් විශ්ලේෂණය කරන ලදි.

ආයතනය	**මත්ද්‍රව්‍ය**	**සාම්පල සංඛ්‍යාව**
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	හෙරොයින්	14
එකතුව		**14**

වගු අංක 02 - 2023 වසරේ විශ්ලේෂණය කරන ලද, වීදි හෙරොයින් සාම්පල

III. වීදි මෙතැම්ෆිටමින් පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය

පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති අඛණ්ඩව සිදුකරනු ලැබේ.

- මෙතැම්ෆිටමින් සාම්පලවල මූලාරම්භය හා විකාශනය හඳුනාගැනීම
- වීදි මෙතැම්ෆිටමින් සාම්පලවල ඇති නව තනුකකරණ ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා වන විශ්ලේෂණයන්

ආයතනය	**මත්ද්‍රව්‍ය**	**සාම්පල සංඛ්‍යාව**
විශේෂ විමර්ශන ඒකකය ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් හේවා බලකාය	මෙතැම්ෆිටමින්	05
එකතුව		05

වගු අංක 03 – වසරේ විශ්ලේෂණය කරන ලද වීදි මෙතැම්ෆිටමින් සාම්පල

IV. ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටලවල ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම හා නැවත සකස් කිරීම

ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටලයක් ශ්‍රී ලංකා රේගුව මඟින් ආයතනයට යොමු කරන ලද අතර ඒවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව රසායනික ප්‍රතිකාරක නැවත සකසා පුරවා දෙන ලද අතර ඒවා පහත සඳහන් පරිදි වේ.

ආයතනය	පරීක්ෂණ කට්ටල වර්ගය	පරීක්ෂණ කට්ටල සංඛ්‍යාව
ශ්‍රී ලංකා රේගුව	මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ කට්ටල	01
එකතුව		**01**

වගු අංක 04 - 2023 වසර තුළ නැවත සකස් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටලවල දත්ත

V. මත්ද්‍රව්‍ය සැපයුම අඩාල කිරීම සම්බන්ධයෙන් විද්‍යාත්මක නිර්දේශ/ තාක්ෂණික සහය සහ උපදේශන සේවා

මත්ද්‍රව්‍ය සැපයුම අඩාලකිරීම සම්බන්ධයෙන් විද්‍යාත්මක නිර්දේශ/ තාක්ෂණික සහය සහ උපදේශන සේවා ලබා දීම සම්බන්ධයෙන් ජාතික මාදක රසායනාගාරය වගකිව යුතු අංශයක් ලෙස ක්‍රියා කරනු ලබයි.

ආයතනය	සපයන ලද සේවාවන් පිළිබඳ විස්තර
මහේස්ත්‍රාත් අධිකරණ	• අංක 172, පහළ ශාන්ත ඇන්ඩෘ වීදිය, කොළඹ 15හි සිදු කරන ලද භූමි පරීක්ෂාව සම්බන්ධයෙන් මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයට තාක්ෂණික සහාය සහ විශේෂඥ වාර්තාවක් ලබා දීම.
	• කැස්බෑව මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු අංකය: B.R 1178/17 ප්‍රිගැබලින් සඳහා පිළිබඳ විශේෂඥ වාර්තාවක් ලබා දීම. සඳහා • කොළඹ මහාධිකරණයේ නඩු අංක: 4407/2023 ට අදාළව පුත්තලම INSEE සිමෙන්ති කම්හලේ සිදුකරන ලද මත්ද්‍රව්‍ය විනාශ කිරීම සඳහා අධිකරණ නියෝග මත තාක්ෂණික සහය ලබාදීම සහභාගී වීම සහ නිරීක්ෂණය කිරීම.
සංවර්ධන ලොතරැයි මණ්ඩලය	• මෙතම්ෆෙටමින් සම්බන්ධ නඩු පැවරීම පිළිබඳ පවතින නීතිය ගැන විශේෂඥ වාර්තාවක් ලබා දීම
මහජන ආරක්ෂක අමාත්‍යාංශය	• ‘‘අත්අඩංගුවට ගත් ඖෂධ බැහැර කිරීමේ ක්‍රම’’ සහ ‘‘අත්අඩංගුවට ගත් ඖෂධ විනාශ කිරීම සඳහා දහන යන්ත්‍රයක් තෝරා ගැනීම’’ යනාදින් සඳහා අවශ්‍ය තාක්ෂණික පිරිවිතර සහ නිර්දේශ ඇතුලත් වාර්තා දෙකක් ඉදිරිපත් කරන ලදි. • ශ්‍රී ලංකාවේ ගංජා නිෂ්පාදන අපනයනය කිරීමේ නීත්‍යානුකූල හැකියාව පිළිබඳ තාක්ෂණික වාර්තාවක් ඉදිරිපත් කිරීම
	• අත්අඩංගුවට ගත් ඖෂධ බැහැර කිරීම සඳහා දාහකයක් ස්ථාපනය කිරීමට අදාල වනාතවිල්ලුව, ලක්ටෝවත්ත, යෝජිත ඉඩම 2023.08.09 දින නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කර අදාළ වාර්තාව ඉදිරිපත් කරන ලදි.

	• ඇමෝනියම් නයිට්‍රේට් පුපුරණ ද්‍රව්‍ය ආනයනය/ ගබඩා කිරීම සහ බෙදා හැරීම සම්බන්ධයෙන් නිරීක්ෂණ සහ තාක්ෂණික වාර්තා ඉදිරිපත් කිරීම
	• අත්අඩංගුවට ගත් නීති විරෝධී මත්ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විනාශ කර දැමීමේ පහසුකමක් තෝරා ගැනීම සහ ප්‍රසම්පාදනය කිරීම සඳහා සංශෝධිත තාක්ෂණික පිරිවිතර ඉදිරිපත් කිරීම.
ශ්‍රී ලංකා පොලිසිය	• පොල්ගහවෙල පොලිස් ස්ථානය සඳහා පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු අංක 48432/ODD/22 සඳහා විද්‍යාත්මක නිර්දේශ ලබා දී ඇත .
	• ශ්‍රී ලංකා පොලිසියට බඳවාගැනීමට නියමිත නිලධාරීන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ මුත්‍රා පරීක්ෂණ සඳහා අවශ්‍ය පරීක්ෂණ කට්ටල මිලදී ගැනීම සඳහා තාක්ෂණික පිරිවිතර ඉදිරිපත් කිරීම.
	• මත්ද්‍රව්‍ය පරීක්ෂණයේ පූර්ව බඳවාගැනීම් සම්බන්ධ විශේෂඥ වාර්තාව පොලිස් බඳවාගැනීමේ අංශය වෙත ලබා දෙන ලදි.
	පහත සඳහන් මත්ද්‍රව්‍ය ආශ්‍රිත සිද්ධීන් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමේ වාර්තාවන් බම්බලපිටිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කරන ලදි. • කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක: B/6386/03/19 (2C-C) • අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක: B66596/03/22 (25B-NBOH) • අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක: B66601/03/22 (25B-NBOH) • පුත්තලම පොලිස් අධිකාරී කාර්යාලයේ ඉල්ලීම මත කිරුම් තරාදි මිලදීගැනීම්, නිරවද්‍ය ලෙස ස්ථානගත කිරීම සඳහා තාක්ෂණික පිරිවිතර සපයන ලදි.
ආරක්ෂක අමාත්‍යාංශය	• අයිසො ප්‍රොපයිල් නයිට්‍රයිට් රසායනිකය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලදි.
ශ්‍රී ලංකා රේගුව	• ජාත්‍යන්තර නාවුක යාත්‍රා තුළ කල් ඉකුත් වූ මාදක සහ මනෝවර්තක ඖෂධ බැහැර කිරීම සඳහා කෙටුම්පත් කරන ලද ක්‍රියාවලිය සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම • “Tripelargoin”හි රසායනික සංයුතිය පිළිබඳ පැහැදිලි කිරීමේ වාර්තාව ඉදිරිපත් කිරීම
අධිකරණ අමාත්‍යාංශය	• අත්අඩංගුවට ගත් ඖෂධ බැහැර කිරීම සම්බන්ධ රෙගුලාසි සඳහා නිරීක්ෂණ ලබා දීම
ශ්‍රී ලංකා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය	• කොළඹ මහාධිකරණ නඩු අංක: 4407/2023 සම්බන්ධ මත්ද්‍රව්‍ය විනාශ කිරීම පිළිබඳ වූ වාර්තාව ලබා දීම

වගු අංක 05: 2023 වසර තුළ සපයන ලද තාක්ෂණික සහය/ නිර්දේශ පිළිබඳ විස්තර

VI. මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා විද්‍යාත්මක පුහුණු වැඩසටහන්

"ශ්‍රී ලංකාවේ නීති විරෝධී මත්ද්‍රව්‍ය, පාලනයට නතු ඖෂධ හඳුනාගැනීම සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම" යන තේමාව යටතේ දෙදින විද්‍යාත්මක පුහුණු වැඩසටහන් ජාතික මාදක රසායනාගාරය විසින් සංවිධානය කරන ලද අතර මෙම පුහුණු වැඩමුළුවල අරමුණු වූයේ,

- මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීම සම්බන්ධ මූලික දැනුම ලබා දීම.
- මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සම්බන්ධ පුළුල් අවබෝධාත්මක දැනුම ලබා දීම.
- මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය හඳුනාගැනීම සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල භාවිතා කරමින් ප්‍රායෝගික දැනුම ලබා දීම.
- මත්ද්‍රව්‍යවල නවීන ආකාර සම්බන්ධව සහභාගිවන්නන් ගේ දැනුම යාවත්කාලීන කිරීම.

ආයතනය		ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ.	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.
විශේෂ කාර්ය බලකාය	වැඩමුළු සංඛ්‍යාව (පැය)	-	-	-	-	-	-	-	-	-	16	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	18	-	-
ශ්‍රී ලංකා නාවික හමුදාව	වැඩමුළු සංඛ්‍යාව (පැය)	-	30	-	04	04	-	18	16	-	7.5	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	25	-	35	25	-	80	45	-	135	-	-
ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය	වැඩමුළු සංඛ්‍යාව (පැය)	-	-	08	-	-	08	-	07	-	-	-	08
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	25	-	-	22	-	23	-	-	-	22
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	වැඩමුළු සංඛ්‍යාව (පැය)	-	-	08	-	-	-	-	-	-	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	35	-	-	-	-	-	-	-	-	-

ශ්‍රී ලංකා පොලිසිය (රථවාහන අංශය)	වැඩමුළු සංඛ්‍යාව (පැය)	-	-	-	-	01	-	03	-	03	-	-	06
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	-	100	-	65	-	94	-	-	204
විශේෂ විමර්ශන ඒකකය- ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් හේවා බලකාය	වැඩමුළු සංඛ්‍යාව (පැය)	08	-	-	-	-	-	-	-	08	-	08	-
	සහභාගී වූ සංඛ්‍යාව	45	-	-	-	-	-	-		40	-	30	-
ශ්‍රී ලංකා යුධ හමුදා බුද්ධි අංශය	වැඩමුළු සංඛ්‍යාව (පැය)	-	-	16	-	18	-	-	-	-	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	35	-	45	-	-	-	-	-	-	-
එකතුව	වැඩමුළු සංඛ්‍යාව (පැය)	8	30	32	4	23	08	24	23	11	23.5	8	14
	සහභාගී වූ සංඛ්‍යාව	45	25	95	35	170	22	180	68	134	153	30	226

වගු අංක 06: 2023 වසර තුළ සංවිධානය කරන ලද විද්‍යාත්මක පුහුණු වැඩසටහන

මුළු පුහුණු වැඩමුළු සංඛ්‍යාව : 34 (පැය 208.5)

මුළු සහභාගි වූ සංඛ්‍යාව : 1183

VII. අන්තර්ජාල හා සමාජ මාධ්‍ය හරහා මත්ද්‍රව්‍ය අලෙවිය සහ තැපැල්/ කුරියර් සේවා අවභාවිත කරමින් සිදුකරන මත්ද්‍රව්‍ය බෙදාහැරීමට එරෙහි ක්‍රියාමාර්ග

මත්ද්‍රව්‍ය සැපයුම් පාලන ක්‍රියාමාර්ගවල ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මධ්‍යම තැපැල් හුවමාරුවේ නිලධාරීන්ට පහත පුහුණු වැඩසටහන පවත්වන ලදි.

ආයතනය	පුහුණු වැඩ සටහන් (පැය)	සහභාගී වූ සංඛ්‍යාව
ශ්‍රී ලංකා මධ්‍යම තැපැල් හුවමාරුව	08	25
එකතුව	**08**	**25**

වගු අංක 07: 2023 වසර තුළ සංවිධානය කරන ලද විද්‍යාත්මක පුහුණු වැඩසටහන (තැපැල්)

11.6.2 පාලිත ඖෂධ/ ද්‍රව්‍ය අපසරණය වැලැක්වීමේ නියාමන අරමුණු සඳහා විද්‍යාත්මක සහය ලබා දීම සහ ඒවායේ ආනයන අපනයන සහ බෙදාහැරීම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම

I. නියාමන අරමුණු සඳහා මත්ද්‍රව්‍ය, මනෝවර්ථක ද්‍රව්‍ය, පූර්වගාමී රසායනික ද්‍රව්‍ය, මධ්‍යසාර, දුම්කොළ හා වෙනත් අඩංගු නිෂ්පාදන විශ්ලේෂණය

මත්ද්‍රව්‍ය, මනෝවර්ථක ද්‍රව්‍ය, පූර්වගාමී රසායන ද්‍රව්‍ය, මධ්‍යසාර, දුම්කොළ, වෙනත් සහ එවැනි ද්‍රව්‍ය සහ/ හෝ වෙනත් ආකලන ද්‍රව්‍ය පවතින බව හඳුනාගැනීම සඳහා/ හෝ නියාමන අරමුණු සඳහා ජාතික මාදක රසායනාගාරය විසින් සිදු කරන ලද පර්යේෂණ පදනම් වූ විශ්ලේෂණයන් පහත දැක්වේ.

ආයතනය	සිදු කරන ලද විශ්ලේෂණ වර්ගය	අවස්ථා සංඛ්‍යාව	සාම්පල සංඛ්‍යාව
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	මධ්‍යසාර	01	05
එකතුව		**01**	**05**

වගු අංක 8: 2023 වසරේ විශ්ලේෂණය කරන ලද සාම්පල

මුළු පරීක්ෂණ සංඛ්‍යාව : 01

මුළු සාම්පල සංඛ්‍යාව : 05

II. නියාමන පියවර ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික සහාය සහ විද්‍යාත්මක නිර්දේශ ලබා දීම

මත්ද්‍රව්‍ය/ මනෝවර්ථක ද්‍රව්‍ය/ පූර්වගාමී රසායන ද්‍රව්‍ය/ මධ්‍යසාර/ දුම්කොළ/ වෙනත් සහ එවැනි ද්‍රව්‍ය සහ/හෝ වෙනත් ආකලන ද්‍රව්‍ය පිළිබඳ නියාමන ක්‍රියාමාර්ගවලට අදාළ තාක්ෂණික සහය සමග විද්‍යාත්මක නිර්දේශ ඉදිරිපත් කිරීම ජාතික මාදක රසායනාගාරය මඟින් සිදු කරනු ලබයි.

ආයතනය	ලබා දී ඇති අවසරයන්
ඖෂධ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික වෛද්‍ය නිෂ්පාදන පරිපාලනය, මහජන චීන සමූහාණ්ඩුව.	• රෙමිෆෙන්ටනිල් හයිඩ්‍රොක්ලෝරයිඩ් ආනයනය කිරීම • ෆෙන්ටනිල් සිට්රේට් 0.1mg/ 2ml ආනයනය කිරීම • ෆෙන්ටනිල් සිට්රේට් Injection 0.1mg/ 2ml ආනයනය කිරීම
මධ්‍යම මත්ද්‍රව්‍ය කාර්යාංශය, ඉන්දියාව	• ට්‍රැමඩෝල් හයිඩ්‍රොක්ලෝරයිඩ් කැප්සියුල BP 50mg ආනයනය කිරීම
	• ට්‍රැමඩොල්, DF ස්ඵටික 50 mg – 500kg අවස්ථා දෙකකදී ආනයනය කිරීම

මත්ද්‍රව්‍ය කොමසාරිස්, මධ්‍යම මත්ද්‍රව්‍ය කාර්යාංශය, ඉන්දියාව	• ට්‍රැමඩොල්, DF ස්ඵටික 50mg – 500kg ආනයනය කිරීම
	• මෙතිල්ෆෙනිඩේට් හයිඩ්‍රොක්ලෝරයිඩ් පෙති USP 10mg ආනයනය කිරීම
ඖෂධ සහ වෛද්‍ය උපකරණ ෆෙඩරල් ආයතනය, ජර්මනිය	• පශු වෛද්‍ය භාවිතය සඳහා කෙටමින් ආනයනය කිරීම
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය	• පරිභෝජන කටයුතු සඳහා තුර්කි සුදු පොපි ඇට ආනයනය කිරීම තහනම් කිරීම සඳහා නීති නිර්දේශ ඉදිරිපත් කිරීම
CIBG/ සෞඛ්‍ය සහ තරුණ සත්කාර පරීක්ෂක, ෆාමැටෙක්, නෙදර්ලන්තය	• කෙටමින් එන්නත් 10% 25ml ආනයනය කිරීම
ඖෂධ, සැපයුම් සහ ඖෂධ පිළිබඳ සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය (DIGEMID) සෞඛ්‍ය අමාත්‍යාංශය, පේරු	• කෙටමින් 10% (කෙටමින් හයිඩ්‍රොක්ලෝරයිඩ් 100mg) (KET-A-100) පශු වෛද්‍ය භාවිතය සඳහා ආනයනය කිරීම
	• කෙටමින් 100mg, සයිලොසීන් 20mg, ඇට්‍රොපින් සල්ෆේට් 1mg (KET-A-XYL) පශු වෛද්‍ය භාවිතය සඳහා ආනයනය කිරීම
ඖෂධ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික වෛද්‍ය නිෂ්පාදන පරිපාලනය, මහජන චීන සමූහාණ්ඩුව	• රෙමිෆෙන්ටනිල් හයිඩ්‍රොක්ලෝරයිඩ් ආනයනය කිරීම
රෝපා ආයුර්වේද රෝහල	• ගංජා අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධ තොරතුරු, තාක්ෂණික සහාය (2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පනත යටතේ)

වගු අංක 9: 2023 වර්ෂයේදී මාදක ඖෂධ සහ මනෝවර්ථක ද්‍රව්‍ය ආනයනයට අදාළ තාක්ෂණික සහය ලබා දීම.

III. වෛද්‍ය සහ උපදේශන වෘත්තිකයන්ගේ ධාරිතා ගොඩනැගීම

ඖෂධ අවභාවිතාව පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව, පුහුණු වැඩසටහන්/ සැසිවාර ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ සමාජ ප්‍රතිසංවිධානය කිරීමේ වැඩසටහන් ජාතික මාදක රසායනාගාරය මගින් පවත්වනු ලැබේ.

ආයතනය		ජන.	පෙබ.	මාර්තු	අප්‍රේ	මැයි	ජූනි	ජූලි	අගෝ.	සැප්.	ඔක්.
වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර	වැඩමුළු සංඛ්‍යාව (පැය)	03	-	03	-	-	03	-	04	03	04

විශ්වවිද්‍යාලය	සහභාගී වූ සංඛ්‍යාව	26	-	30	-	-	20	-	25	20	30
වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ සායනික ඖෂධවේදය සහ චිකිත්සක අභ්‍යාසලාභීන්	වැඩමුළු සංඛ්‍යාව (පැය)	03	-	-	-	-	-	-	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	05	-	-	-	-	-	-	-	-	-
පේරාදෙණිය ජාතික රෝහලේ ඖෂධවේදීන්	වැඩමුළු සංඛ්‍යාව (පැය)	03	-	-	-	-	-	-	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	05	-	-	-	-	-	-	-	-	-
සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ ග්‍රාම සේවා නිලධාරීන්	වැඩමුළු සංඛ්‍යාව (පැය)	-	03	-	-	-	-	-	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	40	-	-	-	-	-	-	-	-
සංවර්ධන නිලධාරීන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය	වැඩමුළු සංඛ්‍යාව (පැය)	-	-	-	-	-	-	-	03	-	01
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	13	-	30
ශ්‍රී ලංකා රථවාහන පොලිසියේ නිලධාරීන්	වැඩමුළු සංඛ්‍යාව (පැය)	-	-	-	-	01	-	-	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	-	100	-	-	-	-	-
ඖෂධවේදීන්, ජාතික රෝහල, මහනුවර	වැඩ මුළු සංඛ්‍යාව (පැය)	03	-	-	-	-	-	-	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	14	-	-	-	-	-	-	-	-	-
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහතික පත්‍ර පාඨමාලාව, මහනුවර	වැඩ මුළු සංඛ්‍යාව (පැය)	-	-	-	-	-	-	03	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	-	-	-	35	-	-	-

මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පාඨමාලාව	වැඩ මුළු සංඛ්‍යාව (පැය)	-	-	-	03	-	-	-	-	04	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	30	-	-	-	-	25	-
ඖෂධ උපදේශන පාඨමාලාව	වැඩ මුළු සංඛ්‍යාව (පැය)	-	-	-	03	-	-	-	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	25	-	-	-	-	-	-
ඖෂධවේදීන්, මීගමුව	වැඩ මුළු සංඛ්‍යාව (පැය)	-	-	08	-	-	-	-	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	06	-	-	-	-	-	-	-
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඖෂධවේදී උපාධිධාරීන්	වැඩ මුළු සංඛ්‍යාව (පැය)	-	-	-	-	06	-	-	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	-	51	-	-	-	-	-
එකතුව	වැඩ මුළු සංඛ්‍යාව (පැය)	12	03	11	06	07	03	03	15	07	05
	සහභාගී වූ සංඛ්‍යාව	50	40	36	55	151	20	35	63	45	60

වගු අංක 10: අදාළ කාලය තුළදී පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර

මුළු පුහුණු වැඩමුළු සංඛ්‍යාව : 17 (පැය 64)

මුළු සහභාගි වූ සංඛ්‍යාව : 530

11.6.3 විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම, ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ නැවත සමාජගත කිරීමේ ක්‍රියාවලීන් සඳහා විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ සහාය ලබා දීම

I. දුර්භාවිත ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනාගැනීම සහ විශ්ලේෂණය

මේ කර්තව්‍යයේදී ජීව විද්‍යාත්මක සාම්පලවල ඇති පාලනයට නතු ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය කොටස් හඳුනාගැනීම සඳහා පුද්ගල හා ආයතන මට්ටමින් විශ්ලේෂණ කරනු ලබයි. විශ්ලේෂණයෙන් පසුව මත්ද්‍රව්‍යවලින් නිදහස් බවට දෙනු ලබන සහතිකය රැකියා ලබා ගැනීම හා

වෙනත් කටයුතු සඳහා ප්‍රයෝජනවත් වේ. මෙම රසායනාගාර වාර්තාව රෝග නිධාන හඳුනාගැනීම, ප්‍රතිකාර තීරණය කිරීම, පුනරුත්ථාපනය කිරීම සඳහා පුද්ගලයන් යොමු කිරීම, අධ්‍යාපනික මෙන්ම රැකියා අවශ්‍යතා වැනි කාරණාවලදී ප්‍රයෝජනවත් වේ. ඊට අමතරව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධ 2007 අංක 54 දරන පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සාම්පල විශ්ලේෂණ වාර්තාවන් මහේස්ත්‍රාත් අධිකරණ වෙත සපයනු ලබයි.

විෂ වර්ග අඛිං අන්තරායකර ඖෂධ පාලනය පිළිබඳ ආඥාපනත හා 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත, 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූවන් ප්‍රතිකාර හා පුනරුත්ථාපන කිරීම සම්බන්ධ පනත බලගැන්වීම උදෙසා ජාතික මාදක රසායනාගාරය විසින් විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක සාම්පලවල විස්තරාත්මක ලේඛනයන් පහත වගු අංක 11 මඟින් ඉදිරිපත් කෙරේ.

ආයතනය		ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ.	සැප්.	ඔක්.	නොවැ	දෙසැ.
රජයේ හා පෞද්ගලික රෝහල්	සාම්පල සංඛ්‍යාව	15	15	22	13	13	19	24	19	17	11	17	22
	පරීක්ෂණ සංඛ්‍යාව	66	39	81	28	109	88	151	110	147	58	123	122
නීතිය බලාත්මක කරන ආයතන/ රෝහල්	සාම්පල සංඛ්‍යාව	04	01	02	03	01	03	28	07	08	03	20	04
	පරීක්ෂණ සංඛ්‍යාව	48	01	24	25	12	25	251	84	96	25	207	37
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය	සාම්පල සංඛ්‍යාව	-	01	01	01	-	-	-	-	01	02	02	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	01	01	01	-	-	-	-	12	13	24	-
වෙනත්	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	02	-		-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	02	-		-
එකතුව	සාම්පල සංඛ්‍යාව	19	17	25	17	14	22	52	26	28	16	39	26
	පරීක්ෂණ සංඛ්‍යාව	114	41	106	54	121	113	402	194	257	96	354	159

වගු අංක 11 : 2023 වසරේදී විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක නියැදි සංඛ්‍යාව

මුළු නියැදි සංඛ්‍යාව **: 301**

මුළු පරීක්ෂණ සංඛ්‍යාව **: 2011**

II. විමර්ශන සහ මෙහෙයුම් අරමුණු සඳහා ජීව විද්‍යාත්මක නිදර්ශකවල මත්ද්‍රව්‍ය ඇති බවට තහවුරු කිරීමේ විශ්ලේෂණයන් සිදු කිරීම

ජීව විද්‍යාත්මක නිදර්ශක (මුත්‍රා) සම්බන්ධයෙන් පරීක්ෂණ කට්ටල හරහා සිදු කරන මූලික පරීක්ෂණ යනු ගුණාත්මක විශ්ලේෂණයක් පමණක් වන අතර එහිදී අදාල නිදර්ශකයන්ගේ මත්ද්‍රව්‍ය හෝ එහි පරිවෘත්තීය ද්‍රව්‍ය තිබීම හෝ නොපැවතීම පමණක් පෙන්නුම් කරන අතර, එහිදී අන්තර් ප්‍රතික්‍රියා කරන මත්ද්‍රව්‍ය හා සමාන රසායනික ද්‍රව්‍ය හේතුවෙන් ද අදාල ප්‍රතිඵල පෙන්නුම් කල හැක. එබැවින් යමෙකු මත්ද්‍රව්‍ය භාවිතා කර ඇති බව විමර්ශනය සඳහා සවිස්තරාත්මක තහවුරු කිරීමේ විශ්ලේෂණයක් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

2023 වර්ෂය තුළ ජාතික මාදක රසායනාගාරය විසින් ගෑස් ක්‍රොමැටොග්‍රැෆි මෑස් ස්පෙක්ට්‍රොස්කොපි (Gas Chromatography Mass Spectrometry) තාක්ෂණය භාවිතයෙන් විමර්ශන සහ මෙහෙයුම් අරමුණු සඳහා වන ඉල්ලීම් මත පදනම්ව නීතිය බලාත්මක කරන ආයතනයක සහ රැකියා ස්ථාන විසින් ඉදිරිපත් කරන ලද ජීව විද්‍යාත්මක නිදර්ශක (මුත්‍රා) සඳහා තහවුරු කිරීමේ විශ්ලේෂණය සිදු කරන ලදි. අදාල නිදර්ශකවල මත්ද්‍රව්‍ය ඇති බවට සනාථ කිරීමට සිදු කරනු ලැබූ තහවුරු කිරීමේ පරීක්ෂාවන් සම්බන්ධයෙන් විස්තර පහත වගුවෙහි සටහන් වේ.

ආයතනය	අරමුණ	සාම්පල සංඛ්‍යාව	තහවුරු කිරීම සඳහා ඉලක්කගත විශ්ලේෂණ සංඛ්‍යාව
ශ්‍රී ලංකා යුධ හමුදා රෝහල	විමර්ශන	24	25
ශ්‍රී ලංකා පොලිස් රෝහල	විමර්ශන	02	02
පැක් වෙල් ලංකා පුද්ගලික සමාගම	විමර්ශන	03	04
එකතුව		29	31

වගු අංක 12 : 2023 කාල සීමාව තුළ සිදු කරන ලද තහවුරු කිරීමේ විශ්ලේෂණය පිළිබඳ විස්තර

III. රැකියා ස්ථානයන්හි මත්ද්‍රව්‍ය පරීක්ෂණ

රැකියා ස්ථානවල වැඩ කරන කාල සීමාවන්හිදී පුද්ගලයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය, ආරක්ෂාව, සෞඛ්‍ය, මෙන්ම කාර්යක්ෂමතාව කෙරෙහිද බලපෑම් ඇති කරයි. එය රටෙහි නිෂ්පාදන ක්‍රියාවලියට අහිතකර ලෙස බලපාන බව පැහැදිලිය. මෙහි අවදානම අවම කිරීම පිණිස ජාතික මාදක රසායනගාරය මඟින් රැකියා ස්ථාන තුළ මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර කලාප ස්ථාපිත කිරීම උදෙසා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා අනුබද්ධ සමාගම්වල සම්බන්ධීකරණයෙන් මත්ද්‍රව්‍ය භාවිතය/ නොකිරීම තහවුරු කිරීම සඳහා සේවකයන්ගේ ශරීර තරලවල පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනා ගැනීමේ සහ පරීක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් ආරම්භ කොට ඇත.

රැකියා ස්ථාන තුළ මත්ද්‍රව්‍ය භාවිතය තහවුරු කිරීම සඳහා විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක සාම්පලවල විස්තරාත්මක ලේඛනයන් පහත වගුවෙන් දැක්වේ.

ආයතනය		ජන.	පෙබ.	මැයි	ජූනි	ජූලි	අගෝ.	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.
එන්වෝයි ඕර්ටස් පුද්ගලික සමාගම	සාම්පල සංඛ්‍යාව	-	-	13	32	04	04	03	03	11	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	65	230	30	29	24	21	84	-
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	01	-	-	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	-	-	-	12	-	-	-	-
හරිත නෙට්වර්ක් පුද්ගලික සමාගම	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	01	-	-	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	-	-	-	01	-	-	-	-
පැක් වෙල් ලංකා පුද්ගලික සමාගම	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	25	03
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	75	04
ඇස්ට්‍රන් ප්‍රයිවට් ලිමිටඩ්	සාම්පල සංඛ්‍යාව	-	02	-	-	-	-	-	-	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	06	-	-	02	-	-	-	-	-
ඇක්යුටි ටෙක්නොලේජ් පාර්ට්නර්ස්	සාම්පල සංඛ්‍යාව	02	01	03	-	10	03	02	02	05	03
	පරීක්ෂණ සංඛ්‍යාව	10	05	15	-	-	15	10	10	25	15
ප්ලාස්ටිකා ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම, මාලබේ	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	17	-	-	-	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	-	-	51	-	-	-	-	-
එන් - ඒබල් පුද්ගලික සමාගම	සාම්පල සංඛ්‍යාව	-	01	-	-	-	-	-	-	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	03	-	-	-	-	-	-	-	-
ඒජිස්, ලංකා	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	03	-	02	-	-	02

පුද්ගලික සමාගම	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	-	-	03	-	08	-	-	09
පිනකල් ප්‍රොජෙට්ස් පුද්ගලික සමාගම පිළියන්දල	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	11
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	22
සවුත් ඒසියන් ටෙක්නොලජීස් පුද්ගලික සමාගම	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	30
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	90
එයාපෝට් සහ ඒවිඒශන් පුද්ගලික සමාගම	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	141
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	564
එකතුව	සාම්පල සංඛ්‍යාව	02	04	16	32	26	08	07	05	41	190
	පරීක්ෂණ සංඛ්‍යාව	10	14	80	230	94	45	42	31	184	704

වගු අංක 13 : විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක සාම්පල වල විස්තරාත්මක ලේඛනය

මුළු නියැදි සංඛ්‍යාව **: 331**

මුළු පරීක්ෂණ සංඛ්‍යාව **: 1434**

IV. මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ පරීක්ෂණ කට්ටලවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සහ සහතික කිරීම

තත්ත්ව පරීක්ෂණ සහතිකකරණ (Quality Test Certificate - QTC) වැඩසටහන මෑතකදී ජාතික මාදක රසායනාගාරය මඟින් දියත් කරන ලද අතර මෙහි දී මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ කට්ටල/ මෙවලම්වල තත්ත්වය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ වැඩි වශයෙන් අවධානය යොමුකරන ලද අතර පරීක්ෂණවල විස්තර පහත පරිදි වේ.

ආයතනය	පරීක්ෂණ කට්ටල වර්ගය	පරීක්ෂා කරන ලද මත්ද්‍රව්‍ය/ද්‍රව්‍ය වර්ග	පරීක්ෂණ කට්ටල සංඛ්‍යාව
ශ්‍රී ලංකා පොලිසිය	බහු-විධ තත්ත්ව පරීක්ෂාව මත්ද්‍රව්‍ය (04) හඳුනාගැනීමේ පරීක්ෂණ කට්ටල (මුත්‍රා)	කොකේන්, ඇම්ෆෙටමින්, කැනබිනොයිඩිස්, මෝර්ෆීන්,	05
එකතුව			**05**

වගු අංක 14 : 2023 කාලසීමාව තුළ දී පරීක්ෂා කරන ලද පරීක්ෂණ කට්ටල සංඛ්‍යාව

V. ආයෝජන මණ්ඩලය යටතේ පවතින සේවා ස්ථාන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

සේවකයින්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම මෙන්ම සමාගම් අවශ්‍යතා සහ ලාභය යන කරුණු දෙවිදියටම ආරක්ෂා කිරීම සඳහා මත්ද්‍රව්‍ය රහිත සේවා ස්ථානයක් ක්‍රියාත්මක කිරීම වැදගත් අවශ්‍යතාවයකි. ජාතික මාදක රසායනාගාරය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන සමාගම්වල මානව සම්පත් කළමනාකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර ඇත. කරන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

ආයතනය	වැඩ මුළු සංඛ්‍යාව (පැය)	සහභාගි වූ සංඛ්‍යාව
සීතාවක අපනයන සැකසුම් කලාපය	02	29
මහනුවර කර්මාන්තපුරය, පල්ලෙකැලේ	02	10
එකතුව	**04**	**39**

වගු අංක 15 : 2023 කාලසීමාව තුළ දී දැනුවත් කිරීමේ වැඩසටහන්

VI. මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පදවන රියදුරන් මාර්ගබදව පරීක්ෂා කිරීම පිළිබඳ නියමු අධ්‍යයනය

ජාතික මාදක රසායනාගාරය විසින් ශ්‍රී ලංකාවේ මාර්ග අනතුරු වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා ක්ෂණික විසඳුමක් ලෙස අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහයෝගයෙන් මත්ද්‍රව්‍ය භාවිත කරන රියදුරන් පරීක්ෂා කිරීම පිළිබඳ නියමු පර්යේෂණ අධ්‍යයනයක් ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා මාර්ග ආරක්ෂාව පිළිබඳ වූ ජාතික සභාව රුපියල් මිලියන 10ක් ලබා දී ඇත.

නියමු ව්‍යාපෘතිය 2023.05.19 දින ශ්‍රී ලංකා පොලිසිය විසින් නිල වශයෙන් ආරම්භ කරන ලද අතර මණ්ඩලයේ නිලධාරීන් බස්නාහිර පළාතේ ස්ථාන කිහිපයක සිදුකරන ලද පරීක්ෂණයන් නිරීක්ෂණය කරන ලද අතර නියමු අධ්‍යයනයේ දෙවන අදියර දෙසැම්බර් මස දකුණු පළාතේ ආරම්භ කරන ලදි. ඒ සඳහා දකුණු පළාතේ පොලිස් නිලධාරීන් සහ වෛද්‍ය නිලධාරීන්ට අවශ්‍ය පූර්ව පුහුණුව මණ්ඩලයේ නිලධාරීන් විසින් සපයන ලදි. තවද, මත්ද්‍රව්‍ය භාවිත කරන රියදුරන්ගේ මත්ද්‍රව්‍ය පරීක්ෂාවට අදාළ රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ද ලබා දී ඇත.

VII. ශ්‍රී ලංකා පොලිස් සේවය සඳහා නිලධාරීන් බඳවා ගැනීම සඳහා ජීව විද්‍යාත්මක නිදර්ශක (මූත්‍රා) සාම්පල විශ්ලේෂණය

ශ්‍රී ලංකා පොලිස් බඳවාගැනීමේ අංශය විසින් කරන ලද ඉල්ලීමට අනුව, විෂ අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනත සහ 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත යටතේ පාලනය වන ඖෂධවල පරිවෘත්තීය ද්‍රව්‍ය තිබීම හෝ

නොමැතිකම හඳුනා ගැනීම සඳහා අයදුම්කරුවන්ගේ ජීව විද්‍යාත්මක නිදර්ශක විශ්ලේෂණය කරන ලදි.

ආයතනය	සාම්පල	පරීක්ෂණ
ශ්‍රී ලංකා පොලිසිය	877	10,524
එකතුව	**877**	**10,524**

වගු අංක 16 - ශ්‍රී ලංකා පොලිසියේ අයදුම්කරුවන්ගේ ජීව විද්‍යාත්මක නිදර්ශක (මුත්‍රා) සාම්පල විශ්ලේෂණය පිළිබඳ විස්තර

11.6.4 ආයතනික පරාසයන් ශක්තිමත් කිරීම

I. ජාත්‍යන්තර කාර්යක්ෂමතා පරීක්ෂණ වැඩසටහන්

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන මඟින් ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන නමින් පවත්වන ජාත්‍යන්තර රසායනාගාර කුසලතා පරීක්ෂණ වැඩසටහනට ජාතික මාදක රසායනාගාරය සහභාගී වේ. මෙම වැඩසටහනට සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල රසායනාගාරයන් සහභාගී වේ.

මේ සඳහා අඛණ්ඩව සිදුකරන සහභාගීත්වය මඟින් ගෝලීය මට්ටමෙන් රසායනාගාර සම්මතකරණය කර ගැනීම, විශ්ලේෂණ හැකියාවන් වර්ධනය කර ගැනීම, නිවැරදි තීන්දු ගැනීම පිළිබඳ වඩා නිවැරදි ප්‍රවිශ්ඨයක් ලබා ගනී. ස්ථාවර මෙන්ම ඒකාබද්ධ ප්‍රතිඵල හා වාර්තාකරණයන් සියලුම රසායනාගාර මඟින් ලබා ගැනීම මෙහිදී බලාපොරොත්තු වේ.

මේ සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යාලය මඟින් අවශ්‍ය නිර්දිෂ්ඨ සාම්පල සහ හඳුනා නොගත් සැක සහිත සාම්පල, සහ ජීව විද්‍යාත්මක සම්පල, හඳුනාගැනීම සහ විශ්ලේෂණ සඳහා එවනු ලබයි.

- **ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) – 2022 අදියර 2**

ජාත්‍යන්තර සහායෝගීතා අභ්‍යාස වැඩසටහන් 2022 අදියර 2 ප්‍රතිඵල සමාලෝචනයට අනුව ජාතික මාදක රසායනාගාරය ඉහළ මට්ටමේ නිරවද්‍යතාවයක් ලබා ගත් අතර UNODC විසින් ඇගයීමට ලක් කරන ලදි.

- **ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) – 2023 අදියර 1**

සියලුම පරීක්ෂණ සාම්පල, අත්අඩංගුවට ගත් ද්‍රව්‍ය (SM), ජීව විද්‍යාත්මක නිදර්ශක (BS) සඳහා සිදු කරන ලද සියලුම අදාළ විශ්ලේෂණයන් ප්‍රතිඵල සමාලෝචනයට අනුව ජාතික මාදක රසායනාගාරය ඉහළ මට්ටමේ නිරවද්‍යතාවයක් ලබා ගත් අතර UNODC විසින් ඇගයීමට ලක් කරන ලදි.

- **ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) – 2023 අදියර 2**

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන 2023 අදියර 2 ට අදාළ අත්අඩංගුවට ගත් ද්‍රව්‍ය (SM), ජීව විද්‍යාත්මක නිදර්ශක (BS) සඳහා අදාළ විශ්ලේෂණයන් සිදුකිරීම

II. රසායනාගාර කාර්ය මණ්ඩලය විසින් සහභාගි වන ලද පුහුණු කිරීම්, දැනුවත් කිරීමේ වැඩසටහන්

ආයතනය	වැඩසටහන
ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජිත ආයතනය	2023.06.14 දින "ශ්‍රී ලංකාවේ තහනම් උත්තේජක ද්‍රව්‍ය ආනයනය, බෙදා හැරීම සහ නියාමනය කිරීම" මැයෙන් පැවති ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සහභාගී විය.
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය	2007 අංක 54 දරන ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) පිළිබඳ පනත සහ 2008 අංක 01 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත සංශෝධනයට අදාළ රැස්වීම් සඳහා සහභාගී විය.
මත්ද්‍රව්‍ය පාලන ජාතික ප්‍රතිපත්තිය සැකසීම JICA ආයතනය	2023.08.04 වන දින JICA ආයතනයේ කිංග්ස්බරි හෝටලයේ දී මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම සහ පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමේ ජාතික උපදේශන රැස්වීමට සහභාගී විය.
JICA පුහුණු වැඩසටහන	2023 ජනවාරි 31 සිට පෙබරවාරි 08 දක්වා ජපානයේ ටෝකියෝ හිදී පැවති ශ්‍රී ලංකාවේ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම පිළිබඳ JICA පුහුණු වැඩසටහන සඳහා සහභාගී විය.
	2023 මාර්තු 7 සිට මාර්තු 21 දක්වා ජපානයේ ටෝකියෝ 23 හිදී පැවති අවදානමට ලක්විය හැකි කණ්ඩායම් (නැවත වැරදි කරපු පිරිස්, කාන්තා සහ ගොදුරු බවට පත් ළමයින්) නැවත සමාජ ගත කිරීම හා ප්‍රතිකාර සහ පුනරුත්ථාපන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා පවත්වන ලද පුහුණු වැඩ සටහන සඳහා සහභාගී විය.
ආරක්ෂක අමාත්‍යාංශය	2023.10.05 දින ආරක්ෂක අමාත්‍යාංශයේ පැවති "රසායනික භාවිත ප්‍රවේශම සහ ආරක්ෂාව සහ රසායනික අවි ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වැළැක්වීමේ උපාය මාර්ගය" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා සහභාගී විය.
ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)	ලෝක සෞඛ්‍ය සංවිධානයේ ධාරිතා සම්බන්ධ ව්‍යාපෘතිය යටතේ විද්‍යාත්මක නිලධාරීන් සඳහා වූ තෙදින පුහුණු වැඩසටහන සඳහා සහභාගී විය
එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය (UNGA)	2023 සැප්තැම්බර් 18 සිට 26 දක්වා නිව්යෝර්ක් හි පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ (UNGA) 78 වැනි සැසිවාරය සඳහා සහභාගී විය.
කොළඹ ක්‍රමය	2023 නොවැම්බර් 14 සිට 16 දක්වා පිලිපීනයේ පැවති අන්තරායකර ඖෂධ පාලන උපදේශන වැඩසටහන සඳහා සහභාගී විය
පරීක්ෂණ රසායනාගාර	2023.10.06 දින පරීක්ෂණ රසායනාගාර සංගමය (Association of Testing Laboratories) මගින් සංවිධානය කරන ලද "රසායනාගාර සඳහා

සංගමය - රාජගිරිය (Association of Testing Laboratories)	සංඛ්‍යානමය විශ්ලේෂණය" පිළිබඳ පුහුණුව සඳහා සහභාගී විය.
මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC)	මෙතම්ෆෙටමින් පිළිබඳ දත්ත රැස් කිරීම සහ කළමනාකරණය පිළිබඳ වූ වැඩසටහනකට 2023 දෙසැම්බර් 13 සහ 14 වැනි දිනවලදී සහභාගී විය

වගු අංක 17 : 2023 වසරේ රසායනාගාර කාර්ය මණ්ඩලය විසින් සහභාගි වන ලද පුහුණු කිරීම්, දැනුවත් කිරීමේ වැඩසටහන්

ජාතික මාදක රසායනාගාරයේ 2022/2023 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	2022	2023
භෞතික ප්‍රගතිය	51.4%	85.98%
මූල්‍ය ප්‍රගතිය	35.16%	94.76%

ඇතැම් ව්‍යාපෘතීන් සම්පූර්ණ කරගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීමත්, අදාල රජය හා පෞද්ගලික ආයතන විසින් සිදු කරන ලද ඉල්ලීම් සහ අවශ්‍යතා මත පමණක් විශ්ලේෂණ වාර්තා ලබා දීම සහ තාක්ෂණික සහයන් ලබා දීම සිදු කරනු ලැබීමත් නිසා 2023 වසර සඳහා භෞතික ප්‍රගතිය 34.58% දක්වා වැඩිවීමක් සිදුව ඇත.

11.7 පුරෝගාමී පාලන අධිකාරිය

ශ්‍රී ලංකාවේ මාදක සහ මනෝවර්තක ද්‍රව්‍යවලට ද්‍රව්‍ය නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීමේ දී භාවිතා කරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අත්සන් කර ඇති ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන ගිවිසුමක් වන 1988 මත්ද්‍රව්‍ය හා මනෝවර්තක ද්‍රව්‍යවල නීති විරෝධී ජාවාරමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ විධිවිධාන ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක අධිකාරිය ලෙස 2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතියේ 18 වැනි වගන්තියට අනුව පුරෝගාමී පාලන අධිකාරිය පිහිටුවා ඇත.

පුරෝගාමී රසායනිකයක් යනු වෙනත් සංයෝගයක් නිපදවන රසායනික ප්‍රතික්‍රියාවකට සහභාගි වන රසායන ද්‍රව්‍යකි. එබැවින් මෙම රසායනික ද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම, භාවිතය නිරීක්ෂණය කිරීම සඳහා දැඩි යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

11.7.1 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුකූල වීම

ශ්‍රී ලංකාව 1988 මත්ද්‍රව්‍ය හා මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට 1991 ජුනි 6 සිට පාර්ශවකරුවෙකු වී ඇත. පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධ විධිවිධාන සහ අවශ්‍යතා (නීති සම්පාදන සහ පාලන පියවර), සාමාන්‍ය අවශ්‍යතා 12වන වගන්තියේ 1වන ඡේදයේ පහත පරිදි සාරාංශ කර ඇත.

සම්මුතියේ මූලික අදහස වන්නේ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා භාවිත කළ හැකි රසායනික ද්‍රව්‍ය ගණනාවක් නිත්‍යානුකූල අරමුණු සඳහා වෙළෙඳාමට ඉඩ දී වෙළෙඳාම නියාමනය කිරීම සහ නීති විරෝධී ඖෂධ නිෂ්පාදනය සඳහා යොමුවීම වැළැක්වීමයි. 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතිය පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා නීතිමය පදනමක් ස්ථාපිත කරන අතර එවැනි ද්‍රව්‍ය අපසරණය වැළැක්වීම සඳහා සුදුසු පරිපාලන රාමුවක්, ක්‍රියාකාරී යාන්ත්‍රණයක් සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි පිහිටුවීමට යෝජනා කරයි.

1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 12වන වගන්තියට අනුව, පුරෝගාමී රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීමේ නිරත සියලුම පුද්ගලයින් සහ ව්‍යවසායන් නිරීක්ෂණය කළ යුතුය.

"මත්ද්‍රව්‍ය හෝ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරන, පනතේ I සහ II වගු තුළ ඇති ද්‍රව්‍ය වෙනත් කාර්යයක් සඳහා යොමු කිරීම වැළැක්වීමට වගකිවයුතු පාර්ශවයන් සුදුසු යැයි සලකනු ලබන ක්‍රියාමාර්ග ගත යුතු අතර, මේ සඳහා එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය."

ඒ අනුව සහ ඉහත සඳහන් කරුණු අනුව පුද්ගලයින් සහ/ හෝ ව්‍යවසායන්, අවසන් භාවිතාකරුවන් 1759, ආනයනකරුවන් 256, වෙළෙන්දන් 257, අපනයනකරුවන් 4, සහ පරිශ්‍ර 409 ලෙස පුරෝගාමී පාලන අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති අතර, එම පරිශ්‍ර පිළිබඳ පරීක්ෂණ පැවැත්විය යුතුය. එසේ ලියාපදිංචි නොකළ ව්‍යවසායන්/ පුද්ගලයන් දැනුවත් කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත්වල දැන්වීමක් පළ කිරීමට කටයුතු කර ඇත.

11.7.1.1 මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම සහ පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තියට අනුව පුරෝගාමී පාලන අධිකාරියේ කාර්යභාරය

මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම සහ පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තියේ 2.2 වගන්තියට අනුව, පුරෝගාමී පාලන අධිකාරිය හට ශ්‍රී ලංකාව තුළ ඵලදායී අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට බලය ඇත.

(අ) පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය සහ අපනයනය සඳහා සහතික සහ අවසර ලබා දීම සහ ගිවිසුම්වල සියලුම අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීම සඳහා 1988 මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍යවල නීතිවිරෝධී ජාවාරමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 12වැනි වගන්තියේ විධිවිධානවලට අනුකූලව පුරෝගාමී සහ අත්‍යවශ්‍ය රසායනික ද්‍රව්‍ය පිළිබඳ ජාතික පාලනයන් නියාමනය කිරීම හෝ බලාත්මක කිරීම.

(ආ) පාලනය යටතේ පවතින පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ආනයනය, අපනයනය, ගබඩා කිරීම සහ බෙදාහැරීම සම්බන්ධයෙන් පවතින ක්‍රියා පටිපාටි, භාවිතයන්, රෙගුලාසි සහ නීති වරින් වර සමාලෝචනය කිරීම.

(ඇ) බලපත්‍ර අනුමත කරන බලධාරීන් සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අනෙකුත් අදාළ ආයතන සමඟ එක්ව පාලනය යටතේ පවතින පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ජාවාරම් කිරීම, හරවා යැවීම සහ අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම ශක්තිමත් කිරීම.

සලකා බලන කාලසීමාව තුළ සේවක සංඛ්‍යාව වැඩි දියුණු කිරීම, 2010 අංක 01 දරන පුරෝගාමී පාලන අධිකාරියේ රෙගුලාසි සංශෝධනය කිරීම, තත්‍යකාලීන තොරතුරු හුවමාරු කිරීමේ යාන්ත්‍රණයන් පිහිටුවීම, මාර්ගගතව හමුවීම් වෙන්කරවා ගැනීමේ විකල්පය වෙබ් අඩවිය හරහා අධිකාරිය විසින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. පුරෝගාමී පාලන අධිකාරිය, බලපත්‍ර නිකුත් කිරීම, පරීක්ෂණ ක්‍රියා පටිපාටිය සහ රසායනික බැහැර කිරීමේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි ස්ථාපිත කර ඇත.

11.7.1.2 2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිය ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීම

2008 අංක 01 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ 19 වැනි වගන්තියට අනුව අධිකාරියට පහත රාජකාරි පැවරී ඇත.

අධිකාරියේ කාර්යය

(අ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අපේක්ෂා කරන තැනැත්තන්, අදාළ කර්මාන්තවල අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන, නියම කරනු ලබන ආකාරයට වලංගු බලපත්‍රයක් අනුව එසේ සිදු කරන බවට;

(ආ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ආනයනය හෝ අපනයනය කිරීමට අදාළ කටයුතු බලපත්‍රලාභියා විසින් කටයුතු කරන්නේ යම් පරිශ්‍රයක සිට ද, එම පරිශ්‍රය ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍යවන වන පියවර ගන්න බවට;

(ඇ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ඒවා ආනයනය කරන ලද හෝ අපනයනය කරන ලද කාර්යය සඳහා පමණක් භාවිතා කරන බවට;

(ඈ) පනතේ පළමුවන උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය භාවිතා කරමින් යම් මාදක ඖෂධයක් හෝ මනෝවර්තකයක් නීතිවිරෝධී ලෙස නිෂ්පාදනය කිරීමේ උත්සාහයන් යථා පරිදි වාර්තා කරන බවටත්, එම වරදකරුවන්ට දඬුවම් පැමිණවීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගන්නා බවටත්;

(ඉ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍යවලින් යම් රසායනික ද්‍රව්‍යක් ආනයනය කරන හෝ අපනයනය කරන සෑම තැනැත්තෙක්ම, එම ද්‍රව්‍ය ආනයනය කිරීම, අපනයනය කිරීම, භාවිතා කිරීම, නිෂ්පාදනය කිරීම සහ බෙදාහැරීම පෙන්නුම් කරන ත්‍රයිමාසික වාර වාර්තා අධිකාරියට ඉදිරිපත් කරන බවට;

(ඊ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍යවලින් යම් ද්‍රව්‍යයකට අදාළව සියලු සැකකටයුතු ගනුදෙනු පිළිබඳ විස්තර, එවැනි ද්‍රව්‍ය කිසිවක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හා සම්බන්ධ තැනැත්තන් විසින් ප්‍රමාදයකින් තොරව අධිකාරියට දැනුම් දෙන බවට;

(උ) නියම කර ඇති කාරණා පිළිබඳ නිසි වාර්තා පවත්වා ගෙන යන බවත්, කටයුතු සහ වාර්තා නියම කරනු ලබන ආකාරයට නියාමනය කරන බවටත්, අධිකාරිය සහතික විය යුතුය.

11.7.1.3 පුරෝගාමී රසායන ද්‍රව්‍ය පාලනයට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ නීති විරෝධී ජාවාරමට එරෙහි සම්මුතියේ 18වැනි වගන්තිය බලාත්මක කිරීම සඳහා 2010 අංක 1 දරන පුරෝගාමී පාලන අධිකාරි නියෝග රෙගුලාසි අනුව පුරෝගාමී පාලන අධිකාරිය 2010 මැයි 04 දින සිට ක්‍රියාත්මක වේ.

තවද, නීතිවිරෝධී ලෙස මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදාගත හැකි පුරෝගාමී රසායන අපසරණය වැළැක්වීමට අදාළ අධිකාරියේ මෙහෙයුම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මසකට වරක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ. ඒ අනුව එම කාලය තුළ රැස්වීම් දෙකක් (02) පැවැත්විණි.

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍යවල නීතිවිරෝධී වෙළඳාමට එරෙහි සම්මුතිවල 31 වැනි වගන්තිය ප්‍රකාරව පුරෝගාමී රසායනික ද්‍රව්‍ය සඳහා ගත යුතු පාලන ක්‍රියාමාර්ග 2010 අංක 1 දරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය (නියාමන පියවර) රෙගුලාසි අංක 1හි දක්වා ඇත.

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍යවල නීතිවිරෝධී වෙළඳාමට එරෙහි සම්මුති පනතේ 18වැනි වගන්තියට එරෙහිව බලාත්මක කිරීම සඳහා, 2010 අංක 1 දරන පුරෝගාමී පාලන අධිකාරියේ රෙගුලාසි සහ 2010 අංක 1 දරන පුරෝගාමී රසායනික (නියාමන පියවර) නියෝග පිහිටුවීම සංශෝධනය කිරීම සඳහා අධිකාරිය විසින් නිසි අනුමැතිය ලබා දී ඇත.

11.7.2 පුරෝගාමී රසායනික ද්‍රව්‍යවල නීත්‍යානුකූල අවශ්‍යතාවය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය නීති විරෝධී ලෙස මත්ද්‍රව්‍ය නිෂ්පාදනයට අපසරණය වීමේ හැකියාව නිරීක්ෂණය කිරීම

ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ, පුරෝගාමී රසායනික මූලික වශයෙන් භාවිත කරනුයේ රසායනාගාර පර්යේෂණවල ප්‍රතික්‍රියාකාරක ඇතුළුව සුවඳ විලවුන්, තීන්ත, ඩයි වර්ග, ඖෂධ, ප්ලාස්ටික් වැනි දෛනික අවශ්‍යතා ඇතුළු පුළුල් පරාසයක අත්‍යවශ්‍ය නිෂ්පාදන නීත්‍යානුකූලව නිෂ්පාදනය කිරීම සඳහාය. බොහෝ කාර්මික යෙදුම් අතර ඇසිටෝන් සහ මෙතිල් එතිල් කීටෝන් මුද්‍රණ තීන්තවල ද්‍රාවක ලෙස බහුලව භාවිතා වන අතර ඒවා බොහෝ නිෂ්පාදන කර්මාන්තවල දින සංකේතනය සඳහා භාවිතා කරයි. සල්ෆියුරික් අම්ලය ප්‍රධාන වශයෙන් බැටරි අම්ල නිෂ්පාදනය සඳහා භාවිතා වේ. හයිඩ්‍රොක්ලෝරික් අම්ලය සහ සල්ෆියුරික් අම්ලය පී.එච්. අගය සකස් කිරීම සඳහා කර්මාන්තවල අපජල පිරිපහදු කිරීම සඳහා බහුලව භාවිතා වන අතර පිහිනුම් තටාක නඩත්තු කිරීමේදී ද භාවිතා වේ. ඇසිටෝන්, ටොලුයින් සහ මෙතිල් එතිල් කීටෝන් තීන්ත කර්මාන්තයේ ද්‍රාවක ලෙස භාවිතා කරනුයේ දැව ආලේපන වැනි තුනී සහ ද්‍රාවක පදනම් වූ තීන්ත නිෂ්පාදන ක්‍රියාවලීන්හි ය. ටොලුයින් මැලියම් නිෂ්පාදනය සඳහා ද්‍රාවකයක් ලෙසද භාවිතා කරයි. එතිල් ඊතර් කුළුබඩු නිස්සාරණය සඳහා භාවිතා කරයි. පිපරනැල් අයිස්ක්‍රීම් සහ රසකාරක නිෂ්පාදනය වැනි රස කැවිලි නිෂ්පාදන කර්මාන්තවල භාවිතා වේ. පොටෑසියම් පර්මැන්ගනේට් ධූමකරණය සඳහා ගොවිපලවල භාවිතා වේ. ඖෂධීය ඖෂධ කිහිපයක නිෂ්පාදනය සඳහා ඇන්ත්‍රනිලික් අම්ලය, ෆීනයිල් ඇසිටික් අම්ලය, පිපරඩීන්, ඇසිටික් ඇන්හයිඩ්‍රයිඩ්, එන්. ඇසිටිලැන්ත්‍රලිනික් අම්ලය, එපිහිඩ්‍රින්, අර්ගොමෙට්‍රින, නොර් එප්ඩ්‍රින්, 1-ෆීනයිල් -2-ප්‍රොපනොන සහ ප්සියුඩෝඑපිහිඩ්‍රින් භාවිතා වේ. උදාහරණයක් ලෙස, එපිහිඩ්‍රින් සහ සියුඩෝඑපිහිඩ්‍රින්, ස්වාස නාල විස්තාරණය, නාසික ඉහිල්කිරීම් සඳහා අදාළ ඖෂධ නිෂ්පාදනයට සඳහා භාවිතා වේ. නොර්එප්ඩ්‍රින් නාසික ඉහිල්කිරීම් නිෂ්පාදනය සඳහා භාවිතා කරයි. ඉරුවාරදය සඳහා ප්‍රතිකාර කිරීම සඳහා අර්ගොමෙට්‍රින් සහ අර්ගොටැමින් නියම කර ඇත. සැෆ්රෝල් සහ අයිසෝ සැෆ්රෝල් සුවඳ විලවුන්, පයිප්පෙරෝනල් සහ සබන් නිෂ්පාදනය සඳහා යොදා ගනී. කාබනික සංයෝග සංස්ලේෂණය සඳහා ලයිසර්ජික් අම්ලය භාවිතා කරයි.

11.7.2.1 පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයන හා අපනයන අධීක්ෂණය

ශ්‍රී ලංකාවේ පුරෝගාමී රසායන පාලනය සඳහා බලාත්මක අධිකාරිය ලෙස, පුරෝගාමී පාලන අධිකාරිය විසින් මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හැකියාව අවම කිරීම සඳහා එවැනි රසායනික ද්‍රව්‍ය අපසරණය වීම වැළැක්වීමේ අරමුණින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය සහ බෙදාහැරීම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමේ කටයුතු පහත සඳහන් අයුරින් ඉටුකරනු ලබයි.

- **බලපත්‍ර නිකුත් කිරීම**

පුරෝගාමී පාලන අධිකාරිය විසින් 2008 අංක 1 දරන පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ඕනෑම ද්‍රව්‍යයක් ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අයදුම්පත් ඉදිරිපත් කරන පුද්ගලයින් සඳහා බලපත්‍ර නිකුත් කර ඇති අතර 2023 වර්ෂය තුළ බලපත්‍ර 92ක් නිකුත් කර ඇත.

- **පරිශ්‍ර ලියාපදිංචි කිරීම**

පුරෝගාමී පාලන අධිකාරිය විසින් 2008 අංක 1 දරන පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ඕනෑම ද්‍රව්‍යයක් ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අයදුම්පත් ඉදිරිපත් කරන පුද්ගලයින් ගේ, එම කටයුතුවලට අදාළ පරිශ්‍රය ලියාපදිංචි කල යුතු අතර, එවැනි පරිශ්‍ර ලියාපදිංචි කිරීම් 16ක් 2023 වර්ෂය තුළ සිදු කර ඇත.

I. අධීක්ෂණය සහ පරීක්ෂණය

බලපත්‍රලාභියාගේ ලියාපදිංචි පරිශ්‍රය වරින් වර අධීක්ෂණය කළ යුතු අතර, පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ද්‍රව්‍ය භාවිතා කරමින් සිදුකරන ක්‍රියාකාරකම්, පුරෝගාමී පාලන අධිකාරිය මඟින් අධීක්ෂණය කළ යුතු අතර අධිකාරියේ සිටින සීමිත සේවක සංඛ්‍යාව සහ වාහන වල ගැටළු හේතුවෙන් 2023 වර්ෂය තුළ සිදු කරන ලද පරිශ්‍ර පරීක්ෂා කිරීම් සංඛ්‍යාව පනස් දෙකකට (52) සීමා විය.

පරිශ්‍ර පරීක්ෂාවන් අතරතුර














11.7.2.2 පුරෝගාමී රසායන ද්‍රව්‍ය ගනුදෙනු කිරීම සහ අවසන් භාවිතය නිරීක්ෂණය කිරීම


පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ නිශ්චිතව දක්වා ඇති ඕනෑම ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදහස් කරන සෑම පුද්ගලයෙක්ම හෝ පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති යම් ද්‍රව්‍යයක් භාවිතා කිරීමට අදහස් කරන පුද්ගලයන් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ යුතුය. අධිකාරිය, අදාළ ගාස්තුව සමඟ, අයදුම්පත ලැබීමෙන් පසු අයදුම්පතෙහි සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාවය සහ අලෙවි නියෝජිතයා හෝ අවසාන පරිශීලකයා විසින් ක්‍රියාකාරකම් සිදු කරන ආකාරය තහවුරු කර වසරක කාලයක් සඳහා ලියාපදිංචි සහතික නිකුත් කරනු ලැබේ. ඒ අනුව පුරෝගාමී රසායනික ද්‍රව්‍ය සඳහා ලියාපදිංචි කර ඇති අයදුම්පත් 526ක් සඳහා ලියාපදිංචි සහතික 515ක් නිකුත් කර ඇත.

		බලපත්‍ර		ලියාපදිංචි සහතික			එකතුව
		ආනයනකරුවන්	අපනයනකරුවන්	වෙළෙන්දන්	අවසන් භාවිතා කරන්නන්	පරිශ්‍රය	
වසර 2023 (2023.12.31 දිනට	ලියාපදිංචි අයදුම්පත් සංඛ්‍යාව	96	01	62	464	16	**639**
		97		526			
	නිකුත් කළ ලියාපදිංචි සහතික/ බලපත්‍ර සංඛ්‍යාව	91	01	60	455	10	**617**
		92		515			
	පරිශ්‍ර පරීක්ෂා කිරීම						**52**


වගුව 1 : 2023.01.01 සිට 2023.12.31 දක්වා කාලය තුළ ලියාපදිංචි කර ඇති අයදුම්පත් සහ බලපත්‍ර පිළිබඳ විස්තර



රූපය 1: 2023.01.01 සිට 2023.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ සඳහා ලියාපදිංචි වූ අයදුම්පත් සංඛ්‍යාව පිළිබඳ විස්තර




රූපය 2 : 2023.01.01 සිට 2023.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳ විස්තර



රූපය 3 : 2023.01.01 සිට 2023.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ සඳහා ලියාපදිංචි කර ඇති අයදුම්පත් සංඛ්‍යාව සහ බලපත්‍ර සංසන්දනය කිරීම

මාසය	2023	
	පරීක්ෂා කිරීම්	අවලංගු කල බලපත්‍ර
ජනවාරි	00	00
පෙබරවාරි	04	00
මාර්තු	03	00
අප්‍රේල්	00	00
මැයි	00	00
ජුනි	07	00
ජූලි	06	00
අගෝස්තු	00	00
සැප්තැම්බර්	00	00
ඔක්තෝබර්	12	00
නොවැම්බර්	11	00
දෙසැම්බර්	09	00
එකතුව	**52**	**00**

වගුව 2 : 2023.01.01 සිට 2023.12.31 දක්වා කාලය තුල සිදු කරන ලද පරිශ්‍ර පරීක්ෂා කිරීම් පිළිබඳ විස්තර




රූප සටහන 4 : 2023.01.01 සිට 2023.12.31 දක්වා කාලය තුළ සිදු කරන ලද පරිශ්‍ර පරීක්ෂා කිරීම් පිළිබඳ විස්තර

පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය හෝ අපනයනය සඳහා නිකුත් කර ඇති බලපත්‍ර, ඒවායේ සංශෝධන සහ අලුත් කිරීම් සඳහා ගාස්තු අය කරනු ලබන්නේ රු.5,000/-, රු.2,000/- සහ රු.4,500/- වශයෙනි. පරිශ්‍රය ලියාපදිංචි කිරීම සඳහා රු.5,000/-ක් අය කරනු ලබන අතර අලෙවි නියෝජිතයන් ලියාපදිංචි කිරීම, ඔවුන්ගේ සංශෝධන සහ අලුත් කිරීම් සඳහා රු.4,000/-, රු.1,500/- සහ රු.3,500/- පිළිවෙලින් අයකරනු ලැබේ. අවසාන පරිශීලකයින් සඳහා ලියාපදිංචි සහතිකය ලියාපදිංචි කිරීම, සංශෝධනය කිරීම සහ අලුත් කිරීම සඳහා පිළිවෙලින් රු.1,500/-, රු.500/- සහ රු.1,000/- අය කෙරේ. 2023.01.01 සිට 2023.12.31 දක්වා කාලය තුළ බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීමෙන් පුරෝගාමී පාලන අධිකාරියේ ආදායම ලෙස රු.1,327,700ක් උපයා ගන්නා ලදි. අවසාන පරිශීලකයින් ලියාපදිංචි කිරීම සඳහා අය කරන ලද ගාස්තු සහ විස්තර 03 වගුවේ දක්වා ඇත.


මාසය	අවසන් භාවිතා කරන්නන් රු.	වෙළෙන්දන් රු.	ආනයනකරුවන් රු.	පරිශ්‍ර රු.	අපනයනකරුවන් රු.	එකතුව රු.
ජනවාරි	46,750.00	28,050.00	56,100.00	16,500.00	00.00	147,400.00
පෙබරවාරි	48,950.00	11,550.00	24,200.00	5,500.00	00.00	90,200.00
මාර්තු	33,450.00	33,100.00	46,200.00	00.00	00.00	112,750.00

අප්‍රේල්	30,250.00	00.00	4,950.00	00.00	4,950.00	40,150.00
මැයි	31,350.00	15,400.00	44,000.00	11,000.00	00.00	101,750.00
ජුනි	57,200.00	19,250.00	9,900.00	00.00	00.00	86,350.00
ජූලි	48,400.00	12,650.00	17,050.00	00.00	00.00	78,100.00
අගෝස්තු	45,650.00	36,850.00	66,550.00	22,000.00	00.00	171,050.00
සැප්තැම්බර්	39,600.00	13,200.00	47,300.00	5,500.00	00.00	105,600.00
ඔක්තෝබර්	63,800.00	23,650.00	61,050.00	11,000.00	00.00	159,500.00
නොවැම්බර්	44,550.00	36,850.00	44,550.00	11,000.00	00.00	136,950.00
දෙසැම්බර්	48,950.00	23,100.00	20,350.00	5,500.00	00.00	97,900.00
එකතුව	**538,900.00**	**253,650.00**	**442,200.00**	**88,000.00**	**4,950.00**	**1,327,700.00**


වගුව 03 : විවිධ බලපත්‍ර කාණ්ඩ යටතේ 2023.01.01 සිට 2023.12.31 දක්වා කාලය තුළ පුරෝගාමී පාලන අධිකාරිය විසින් ජනනය කරන ලද ආදායම



රූපය 5 : 2023.01.01 සිට 2023.12.31 දක්වා කාලය තුළ මාසික ආදායමේ විචලනය පිළිබඳ විස්තර



රූපය 6 :2023.01.01 සිට 2023.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ යටතේ මාසික ආදායමේ විචලනය



රූපය 7 : 2023.01.01 සිට 2023.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ යටතේ වාර්ෂික ආදායම

11.7.3 පුරෝගාමී පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු සමාලෝචනය

ආරම්භයේ සිට වසර දහතුනක් (13) ගාස්තු සංශෝධන කර නොතිබීම, පවතින ගාස්තු අයකිරීමේ ක්‍රමය තුළ පවතින නොගැලපීම්, ආනයනකරුවන්, අපනයනකරුවන්, අලෙවිකරුවන් සහ අවසාන පරිශීලකයින් යන සියලුම කාණ්ඩවලට සමාන ගාස්තු පැනවීම යන කරුණු සලකා බැලීමෙන් අනතුරුව අදාළ අරමුණ කුමක් වුව ද තොග විකුණුම් මට්ටම, සිල්ලර මට්ටම, කුඩා පරිමාණ සහ මහා පරිමාණ අවසන් භාවිතය හෝ ආනයනය සහ අපනයනය යන කරුණු සැලකිල්ලට නොගෙන ප්‍රමාණය, පරීක්ෂණ වියදම්, තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා කරන පරීක්ෂා කිරීම්, එහි ඇති රසායනික ද්‍රව්‍ය සත්‍යාපනය කිරීම සඳහා පවත්වනු ලබන නියැදි විශ්ලේෂණ පිරිවැය, දැනට පවතින ගාස්තු ක්‍රමය මගින් අධිකාරියේ පිරිවැය සම්පූර්ණයෙන් අයකර නොගන්නා බව හඳුනාගෙන ඇත. එබැවින්, අත්‍යාවශ්‍ය කර්තව්‍යයක් ලෙස සහ තාක්ෂණික සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට අදාළ අධිකාරියේ වියදම් සම්පූර්ණයෙන් අයකරගැනීම සහතික කිරීම සඳහා, රසායනික විශ්ලේෂණය සහ විෂමතා මඟහරවා ගැනීමේ අරමුණ ඇතිව පුරෝගාමී පාලන අධිකාරියේ බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා සංශෝධිත ගාස්තු 2010 අංක 01 දරන පුරෝගාමී රසායන ද්‍රව්‍ය (නියාමන පියවර) නියෝග සංශෝධන සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි.

11.7.4 පාරිභෝගිකයා සම්බන්ධ තොරතුරු හුවමාරුව සඳහා සුහුරු පුරෝගාමී පාලන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම

2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතියේ 19 වැනි වගන්තිය ප්‍රකාරව පාරිභෝගිකයා සම්බන්ධ ගැටලු විසඳීමට සහ පුරෝගාමී පාලන අධිකාරියේ සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කඩිනම් කිරීම සහතික කිරීම සඳහා අධිකාරිය පහත සඳහන් කාර්යයන් ආරම්භ කරන ලදි.

I. පුරෝගාමී පාලන අධිකාරියේ වෙබ් අඩවිය හරහා මාර්ගගත හමුවීම් වෙන්කරවා ගැනීම, මාර්ගගත බලපත්‍ර තත්ත්ව පරීක්ෂාව, බලපත්‍ර හිමියන්ගේ ලැයිස්තුව සමඟ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, බලපත්‍ර අවලංගු කාලසීමාව, පරීක්ෂණ දැනුම්දීම්, මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා විකල්ප සහ නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් සඳහා ප්‍රවේශය ඇතුළු තත් කාලීන තොරතුරු හුවමාරු කිරීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම, තොරතුරු සත්‍යාපනය කිරීම, ඉල්ලුම්පත්‍ර භාරදීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ පාරිභෝගිකයන් සඳහා තොතුරු සැපයීම, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටිය සහ තොරතුරු ගබඩා කිරීමේ පද්ධතියක් හරහා අනෙකුත් තොරතුරු ලබාදීම.

II. බලපත්‍ර හෝ ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී අධිකාරිය විසින් තොතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා ආනයනකරු, අපනයනකරු, පරිශ්‍ර, අලෙවිකරු සහ අවසාන පරිශීලකයා ඉදිරිපත් කරන අයදුම්පත් සමඟ ඉදිරිපත් කරන ලද පිරික්සුම් ලැයිස්තු පුරෝගාමී රසායන ද්‍රව්‍ය දේශීය නිෂ්පාදනය, වෙළඳාම, බෙදාහැරීම සහ අවසන් භාවිතය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා අයදුම්පත් සමාලෝචනය කර යාවත්කාලීන කරන ලදි.

11.7.5 පුරෝගාමී රසායනික ද්‍රව්‍ය අපසරණය වැළැක්වීමේ ඵලදායී යාන්ත්‍රණයක් සඳහා ජාතික ආයතන අතර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම

11.7.5.1 පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය සහ ප්‍රතිනැව්ගත කිරීම අධීක්ෂණය කිරීම සහ පාලනය සඳහා ශ්‍රී ලංකා රේගුව සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර සම්බන්ධීකරණ සහ සහයෝගීතා යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම

11.7.5.1.1 ශ්‍රී ලංකා රේගුව සම සම්බන්ධීකරණයෙන් පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සහතික කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇත.

I. පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය සහ අපනයනය ඵලදායි ලෙස අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ අසිකුඩා පද්ධතිය උපයෝගී කර ගැනීම, අධිකාරිය විසින් අදාළ සියලුම පුරෝගාමී රසායනික ද්‍රව්‍යවල එච්.එස්. කේතයන් ඉදිරිපත් කිරීමත් සමඟ වාර්තා සහ අවදානම් තක්සේරු කිරීමේ වාර්තා පිළියෙළ කිරීම.

II. පුරෝගාමී රසායනික ද්‍රව්‍යවලට අදාළ නැව්ගත කිරීම් තත්කාලීන පදනමින් නිෂ්කාශනය කිරීම සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමටත් ප්‍රමාදයන් මඟහරවා ගැනීම සඳහාත් සහ පුරෝගාමී පාලන අධිකාරියේ පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පැය 24 සේවා දින 7 පුරා ක්‍රියාත්මක වන සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම.

III. තත්කාලීන පදනමින් පුරෝගාමී පාලන අධිකාරිය සමඟ ඵලදායී සන්නිවේදනය සහ සම්බන්ධීකරණය සඳහා ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන ඒකකයේ රේගු අධිකාරීවරයා නම් කිරීම.

IV. ඒපිහිඩ්රින් වැනි ඖෂධ ලෙස ආනයනය කරනු ලබන විවිධ එච්.එස් කේත යටතේ සකස් කරන ලද පුරෝගාමී රසායනික අඩංගු පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය කිරීමේදී අධිකාරිය මුහුණ දෙන අභියෝග ජය ගැනීම සඳහා කටයුතු කිරීම. හයිඩ්‍රොක්ලෝරික් අම්ලය, ඒපිහිඩ්රින් සල්ෆේට්, නොර්ඒපිහිඩ්රින්, සියුඩෝ ඒපිහිඩ්රින්, අර්ගොමෙට්‍රින සහ අර්ගොට් ඇමින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතියට යටත්ව, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා අපසරණය වීම මෙන්ම මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ අවදානම හේතුවෙන් මෙතිලිතයිල්කීටෝන් අඩංගු තීන්ත මිශ්‍රණ සහ නයිට්‍රික් අම්ලය, පාලිත රසායනික ද්‍රව්‍ය ලැයිස්තුවට ඇතුළත් කිරීමට යෝජිත වේ.

11.7.5.2 ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සමඟ පුරෝගාමී පාලන අධිකාරියේ සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සමඟ පුරෝගාමී පාලන අධිකාරියේ සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීම සහ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව ආනයන බලපත්‍රයේ වලංගු කාලය දිගු කිරීම සහ එහි පුරෝගාමී පාලන අධිකාරියේ අනුමැතිය සහතික කිරීම.

11.7.5.3 සෞඛ්‍ය අමාත්‍යාංශය, අදාළ බලධාරීන් සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර සම්බන්ධීකරණය සහ සහයෝගීතා යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම

එපිහිඩ්රින් සඳහා විශේෂ සඳහනක් සහිත පූර්වගාමී රසායනික ද්‍රව්‍ය අඩංගු ඖෂධ නිෂ්පාදන අපසරණය වැළැක්වීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත.

11.7.5.4 මධ්‍යම පරිසර අධිකාරිය සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර සම්බන්ධීකරණ සහ සහයෝගීතා යාන්ත්‍රණ ශක්තිමත් කිරීම.

පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීමේ තත්ත්වයන් සහ 2010 අංක 1 දරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය (නියාමන පියවර) නියෝග 20වැනි වගන්තියේ අවශ්‍යතාවක් ලෙස නිර්දේශ නිකුත් කිරීමේ තත්ත්ව නිරීක්ෂණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර ශක්තිමත් සම්බන්ධතාවයක් ඇති කිරීමට මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත.

11.7.6 පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම

මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීම සඳහා පුරෝගාමී රසායන ද්‍රව්‍ය අපසරණය වීම, පුළුල් වෙමින් විවිධාංගීකරණය වෙමින් පවතින නව කෘත්‍රිම ඖෂධ සහ ඖෂධ වෙළඳපොළේ ව්‍යාප්තිය සම්බන්ධ අඛණ්ඩ සහ මතුවෙමින් පවතින අභියෝග සලකා බැලීමේදී ද්විපාර්ශ්වික ශක්තිමත් කිරීම ඉතා වැදගත් වේ. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පිළිබඳ කාර්යාලය, මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසම, අනෙකුත් ජාත්‍යන්තර ආයතන සහ සාමාජික රටවල බලයලත් ජාතික අධිකාරීන් හරහා කලාපීය, ජාත්‍යන්තර සම්බන්ධීකරණ සහ සහයෝගිතා යාන්ත්‍රණ ක්‍රියාත්මක කෙරේ.

එබැවින් ද්විපාර්ශවික කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය මඟින් පුරෝගාමී රසායනික පාලන පියවර ශක්තිමත් කිරීම සහ වාර්තා කිරීම, පූර්ව අනතුරු ඇඟවීම් සහ තොරතුරු හුවමාරු පද්ධති සඳහා ජාතික, කලාපීය සහ ජාත්‍යන්තරව ස්ථාපිත වේදිකා භාවිතය ශක්තිමත් කිරීම, බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම, උගත් පාඩම් සහ හොඳම පරිචයන්, තාක්ෂණික සහයෝගීතාව, මූල්‍ය සහ තාක්ෂණික ආධාර වැඩසටහන්, ඒකාබද්ධ විමර්ශන යනාදී සබඳතා ශක්තිමත් කිරීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම පහත සඳහන් කරුණු ඇතුළත් අධිකාරියේ රැස්වීම සඳහා ඉදිරිපත් කර ඇත.

I. ශ්‍රී ලාංකීය සන්දර්භයට අදාළ වන පරිදි ජාත්‍යන්තර ගිවිසුම් සමඟ සමපාත වන පරිදි පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පිළිබඳ ජාතික ව්‍යවස්ථාදායක රාමුවේ ක්‍රියාකාරිත්වයට අනුකූල වීම සහතික කිරීම.

   ජාත්‍යන්තර සම්මුතීන් තුනක් මෙන්ම සාක් සම්මුතිය සහ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය (INCB), මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සහ මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසම (CND) විසින් නිකුත් කරන ලද සියලුම යෝජනා ඒකාබද්ධ කිරීම. පුරෝගාමී පාලනය සම්බන්ධයෙන් අහිතකර ප්‍රතිවිපාක ආමන්ත්‍රණය කරමින් මත්ද්‍රව්‍ය

ගැටලුවට එරෙහිව සටන් කිරීම සඳහා 2008 අංක 01 දරන පනත සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

II. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව යාවත්කාලීන, ප්‍රමිතිගත, විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් තාක්ෂණික ක්‍රියා පටිපාටි යෙදෙන බවට සහතික වීම.


එබැවින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් INCB සහ UNODC විසින් නිකුත් කරන ලද සියලුම අත්පොත්/ මාර්ගෝපදේශ එකතු කර ඇති අතර අදාළ පරිදි අභ්‍යන්තර ක්‍රියා පටිපාටි යාවත් කාලීන කර ඇත.


III. නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් සහ අපයෝජන (ප්‍රාදේශීය සහ ගෝලීය) ප්‍රවණතා රටා නිරීක්ෂණය කිරීම සඳහා තොරතුරු රැස් කිරීම සහතික කිරීම.

පුරෝගාමී රසායනික ද්‍රව්‍යවල සැක කටයුතු ගණුදෙනු හඳුනා ගැනීම සඳහා ශක්තිමත් හවුල්කාරිත්වයක් සහතික කිරීම සඳහා, පුරෝගාමී පාලන අධිකාරිය තාක්ෂණික සහාය සඳහා කලාපීය සහ ජාත්‍යන්තර නියෝජිතායතනවල හවුල්කාරිත්ව වැඩසටහන් සක්‍රියව පවත්වාගෙන යනු ලැබේ. එවැනි එක් වේදිකාවක් වන්නේ මාර්ගගත පුර්ව දැනුම් දීම් පද්ධතියයි. එය 1988 එක්සත් ජාතීන්ගේ (UN) සම්මුතියේ 12වැනි වගන්තියට අනුව අපනයනය කරන රටවලට පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පිළිබඳ විද්‍යුත් පණිවිඩ වශයෙන් දැනුම්දීමට ඉඩ සලසන මාර්ගගත වේදිකාවකි. එම නිසා 2023 වර්ෂය තුළ දැනුම්දීම් 156ක් ලැබී සමාලෝචනය කර ඇති අතර තොරතුරු සත්‍යාපනය කිරීමේදී හඳුනාගත් විෂමතා හේතුවෙන් නැවිගත කිරීම් 01ක් ආනයනය කිරීමට ප්‍රතික්ෂේප කර ඇත.

මාසය	**පූ .අ. වා සංඛ්‍යාව**
ජනවාරි	17
පෙබරවාරි	14
මාර්තු	16
අප්‍රේල්	05
මැයි	11
ජුනි	11
ජූලි	13
අගෝස්තු	11
සැප්තැම්බර්	22
ඔක්තෝබර්	12
නොවැම්බර්	11
දෙසැම්බර්	14
එකතුව	**157**

	පූ .අ. වා සංඛ්‍යාව
ප්‍රතික්ෂේප වූ	01
ප්‍රතික්ෂේප නොවූ	156





IV. පුරෝගාමී පාලන අධිකාරිය, පුරෝගාමී රසායනික ද්‍රව්‍ය (නීත්‍යානුකූල සහ නීති විරෝධී භාවිතයෙන්) සම්බන්ධයෙන් තොරතුරු ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ හුවමාරු කිරීමේ බලාත්මක ජාතික අධිකාරිය වේ. පුරෝගාමී පාලන අධිකාරිය, ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය, අනෙකුත් ජාත්‍යන්තර නියෝජිතායතන සහ වෙනත් රටවල නිසි ජාතික අධිකාරීන් සමඟ වාර්ෂික අවශ්‍යතාවය සහ රසායනික ද්‍රව්‍ය (නීත්‍යානුකූල සහ නීති විරෝධී භාවිතයන්) පිළිබඳ තොරතුරු හුවමාරු කරගෙන ඇත.

V. මීට අමතරව, ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව රට තුළ පුරෝගාමී රසායනික ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාව වඩාත් දැනුවත් කිරීම සහ පුරෝගාමී රසායනික ද්‍රව්‍ය අධික ප්‍රමාණවලින් ගබඩා වීම වළක්වා ගනිමින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතා වීම වැළැක්වීම පිළිබඳව කර්මාන්ත දැනුවත් කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනී.

VI. ආනයනය කරන රටවලට පූර්ව අපනයන දැනුම්දීම් (PEN) සැපයීමට අමතරව කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර මට්ටමින් අංශය විසින් පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.

- පූර්ව අපනයන දැනුම්දීම් සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීම සහ පරීක්ෂණ සඳහා සහය වීම
- ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය (INCB) සහ වෙනත් රටවල නිසි බලධාරීන් සමඟ තත්කාලීන තොරතුරු හුවමාරුව
- පෝරම සහ වාර්තා ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය වෙත යොමු කිරීම (උදා:- පෝරමය D)

11.7.7 ඖෂධ පිළිබඳ නීති බලාත්මක කිරීම සහ අනෙකුත් ආයතන සඳහා තාක්ෂණික සහය ලබා දීම

2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ 19 වෙනි වගන්තියට අනුව I වගුවේ සහ II වගුවේ දක්වා ඇති ද්‍රව්‍ය භාවිතයෙන් යම් කිසි මත්ද්‍රව්‍ය හෝ මනෝවර්තක ද්‍රව්‍යයක් නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීමේ උත්සාහයන් අධිකාරිය විසින් හඳුනාගෙන සහතික කල යුතුය. එවන් අවස්ථා නිසි ලෙස වාර්තා කර වැරැදිකරුවන්ට දඬුවම් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. පුරෝගාමී පාලන අධිකාරියේ නිලධාරීන් විසින් සැක කටයුතු ගණුදෙනු හඳුනා ගැනීමේදී මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට දැනුම් දී නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දිය යුතු වේ.

ඒ අනුව එම කාල සීමාව තුළ පහත විමර්ශන සිදු කර ඇත.

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය මඟින් වැටලීමක් සිදු කරන ලද ඖෂධ නිෂ්පාදන ආයතනයක විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා, 2023.04.27 දින රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, රාජ්‍ය බුද්ධි සේවා දෙපාර්තමේන්තුව හා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ නිලධාරීන් සමඟ එක්ව නිරීක්ෂණ කටයුතු සිදුකර වාර්තාවක් ඉදිරිපත් කරන ලදි. පරිශ්‍ර පරීක්ෂාවන්වලදී නිලධාරීන් ඔවුන්ගේ විශේෂ අවධානය යොමු කරන්නේ මාර්ගෝපදේශ සපුරා ඇත්දැයි පරීක්ෂා කර බැලීමට සහ පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ආනයනය කරන්නන් විසින් පවත්වාගෙන යනු ලබන පරිශ්‍රයන්හි පුරෝගාමී රසායන ද්‍රව්‍ය අපසරණය වැළැක්වීම සඳහා සුදුසු ආරක්ෂක පියවරයන් අනුගමනය කරනු ලැබේදැයි නිරීක්ෂණය කිරීම පිණිසයි.

11.7.8 එපිහිඩ්‍රින් අඩංගු ඖෂධ අපසරණය වැළැක්වීම

2019 සිට 2020 දක්වා කාලය තුළ අක්බාර් පාමසූටිකල් ආයතනය විසින් ගණුදෙනු කරන ලද එපිහිඩ්‍රින් අපසරණයවීමේ හැකියාව පුරෝගාමී පාලන අධිකාරියේ නිලධාරීන් විසින් විමර්ශනය කරන ලද්දේ වසර 2018 සිට 2019 දක්වා අත්අඩංගුවට ගන්නා ලද මෙතම්පටමයින්/ මෙතම්පටමයින් ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව සහ මෙතම්පටමයින් ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි වීම

සැලකිල්ලට ගනිමිනි. ශ්‍රී ලංකා රේගුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, වෛද්‍ය සැපයුම් අංශය සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය සමඟ සම්බන්ධීකරණයෙන් එම ලියාපදිංචි නොකල අලෙවිකරුවන්ගේ/ අවසන් පරිශීලකයන්ගේ විකුණුම් තොරතුරු හඳුනාගෙන ඒවා නිරීක්ෂණය කිරීම සඳහා විමර්ශනයන් සිදු කිරීමට නිර්දේශ කරන ලදි.

11.7.9 දත්ත කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම

ඖෂධ නිෂ්පාදනය සඳහා භාවිතා කරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය අපසරණය වීම වැළැක්වීම සඳහා පුරෝගාමී රසායනික පාලන ක්ෂේත්‍රයේ වැදගත් වන දත්ත කළමනාකරණ පද්ධතියක් මෙම කාලය තුළ නිර්මාණය කර ඇත.

මෙම දත්ත සමුදාය 2008 අංක 1 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ I වගුවේ සහ II වගුවේ ලැයිස්තුගත කර ඇති පුරෝගාමී රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන, භාවිතා කරන, ආනයනය කරන සහ අපනයන කරන සමාගම් ලැයිස්තුවකින් සමන්විත වේ. පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ප්‍රමාණයන් නිෂ්පාදනය, ගණුදෙනු කිරීම, භාවිතය, ආනයනය, අපනයනය සහ ඒවායේ ප්‍රමාණයන් සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍ය ද දත්ත පදනමට ඇතුලත් කර නිතිපතා යාවත්කාලීන වේ.

සංවර්ධනය කරන ලද දත්ත කළමනාකරණය ප්‍රවණතාව අධ්‍යයනය කිරීමේ දී අරමුණු සහගත විශ්ලේෂණයක් සඳහා භාවිතා කළ හැකි දත්ත සම්පාදනය කිරීමට සහ අවශ්‍ය ස්ථානවල නීතියෙන් ගැලවීමේ මාර්ග අවහිර කිරීමට උපකාරී වන අතර මෙම දත්ත කළමනාකරණයේ ප්‍රධාන උපයෝගීතා පහත දැක්වේ.

- ආනයන/ අපනයන/ භාවිතා කිරීමේ රටා වෙනස් වන අවස්ථාවක දී ගැටළු නිරාකරණය කිරීම
- ලියාපදිංචිය/ බලපත්‍ර ලබා ගැනීමේ විෂය පථය යටතේ සිටින ක්ෂේත්‍රයේ කොටස්කරුවන් හඳුනා ගැනීම
- එක් එක් රසායනික ද්‍රව්‍යවල අවශ්‍යතා තක්සේරු කිරීම
- මෙම රසායනික ද්‍රව්‍යවල නිත්‍යානුකූල වෙළඳාම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම.

තවද, කොළඹ විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කරන ලද ක්‍රමවේදයක් මෙම කාලසීමාව තුළ සමාලෝචනය කර සම්පූර්ණ කර ඇති අතර, එය නිරීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම යන පැහැදිලි පියවර හයක් අනුගමනය කරමින් සම්පූර්ණ බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය ප්‍රවාහය ඇතුළු පුරෝගාමී පාලන අධිකාරියේ ක්‍රියාවලීන් ස්වයංක්‍රීයව ස්ථාපිත කිරීම. බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ මෙම පියවරයන් නවීකරණය කිරීමට යෝජනා කර ඇත.

1. අයදුම්පත් ඉදිරිපත් කිරීම
2. අයදුම්පත් සැකසීම
3. අයදුම්පතට අදාළ කාර්ය ප්‍රවාහය සහ තත්ත්ව
4. බලපත්‍ර අයදුම්පත් සඳහා ගෙවීම් ක්‍රම
5. වාර්තා කිරීම
6. අවසරය ලබාදීම

පද්ධති අධ්‍යයනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායනයට (ICTA) ඉදිරිපත් කර ඇති අතර එහි උපදේශනය යටතේ පිහිටුවීම ආරම්භ කෙරේ. පද්ධති අධ්‍යයනය රේඛීය අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ විශේෂඥයින් විසින් සමාලෝචනය කෙරේ.

පුරෝගාමී පාලන අධිකාරියේ 2022/2023 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	2022	2023
භෞතික ප්‍රගතිය	66.74%	84.2%
මූල්‍ය ප්‍රගතිය	76.9%	87.77%

පුරෝගාමී පාලන අංශයේ 2022 වර්ෂයේ භෞතික ප්‍රගතිය 66.74%ක් සහ 2023 වර්ෂයේ භෞතික ප්‍රගතිය 84.2% වශයෙන් ද මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 76.9%ක් සහ 87.77%ක් වශයෙන් 2022 සහ 2023 වර්ෂවලදී දැකගත හැකි විය. අධිකාරියේ සිටින සීමිත සේවක සංඛ්‍යාව හේතුවෙන් පරිශ්‍ර පරීක්ෂාවන් සහ අනෙකුත් ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සැලසුම් කරන ලද ආකාරයට ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

අංකය	සහභාගි වූ නිලධාරියාගේ නම	තනතුර	වැඩසටහන	පැවැත් වූ ආයතනය/ රට	කාලය
01	ශාක්‍ය නානායක්කාර මහතා ඒ. තමර දර්ශන මහතා ඒ. නිලානි රේණුකා මිය ඒ.ඩී.වයි.කේ. අතාවුද මිය එච්.ජී.සී. ලක්මාල් මයා ආර්.ඩී. ප්‍රසංක මයා එච්.එච්.එන්. ලක්මාලි මිය එච්.පී.ජී.ඩී.එස්. අල්විස් මිය	සභාපති සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) පර්යේෂණ නිලධාරී විද්‍යාත්මක නිලධාරී සහකාර බාහිරසේවා නිලධාරී සහකාර උපදේශන නිලධාරී උපදේශන සහකාර මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා තොරතුරු සහකාර	Country Focus Training of Prevention on usage of Illegal Drugs in Sri Lanka	ජපානය	2023.01.31 - 2023.02.09
02	ජී.ආර්. ගුණවර්ධන මයා එම්.ඩබ්.එන්.එම්. අබේනායක මිය	සහකාර අධ්‍යක්ෂ (නාමෝද්දිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන) විද්‍යාත්මක නිලධාරී	JICA Knowledge Co-creation Program	ජපානය	2023.03.06 - 2023.03.22
03	ජී.අයි.එස්. ගුණසිංහ මිය	විද්‍යාත්මක නිලධාරී	BIMSREC Training course on Precursor Chemical for Narcotics Law Enforcement	තායිලන්තය	2023.03.26 - 2023.04.04
04	ශාක්‍ය නානායක්කාර මහතා ප්‍රදීප් කොහොලානේගෙදර මහතා කේ.වී.ආර්. වික්‍රමසිංහ මහතා	සභාපති සහකාර අධ්‍යක්ෂ - නිවාරක අධ්‍යාපන හා පුහුණු සහකාර අධ්‍යක්ෂ (විද්‍යාත්මක පර්යේෂණ) (වැ.බ)	Colombo Plan Drug Advisory Program National Secretaries Meeting	පිලිපීනය	2023.11.14 - 2023.11.16

05	ඩී.සී.එම්. ගමගේ මිය	අභ්‍යන්තර විගණක	NIPA Training Program	කොරියාව	2023.11.14 - 2023.11.24
06	කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන්	-	කාර්යක්ෂමතා කඩඉම් විභාග වෙනුවෙන් වැඩමුලු පැවැත්වීම	රාජ්‍ය සේවා කොමිෂන් සභා නිලධාරීන්	2023.11.17 2023.11.24 2023.12.01
07	ජී.ආර්. ගුණවර්ධන මයා ටී.එම්. පේරුසිංහ මයා එස්.ඒ.ඩී.සී. අබේසිංහ මිය	සහකාර අධ්‍යක්ෂ (නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන) උපදේශන නිලධාරී සහකාර බාහිරසේවා නිලධාරී	Support on Study Visit of Sri Lankan Delegation to India	ඉන්දියාව	2023.11.29- 2023.11.30
08	ප්‍රධාන කාර්යාලයේ සහ මධ්‍යස්ථානවලට අනුයුක්ත පුවාහන අංශයේ සියලුම නිලධාරීන්	ප්‍රවාහන කළමනාකරු මධ්‍යස්ථාන කළමනාකරුවන් කළමනාකරණ සහකාර සංවර්ධන නිලධාරී රියදුරන්	ප්‍රවාහන අංශයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	2023.11.30
09	මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	-	ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්	2023.12.05

13. විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය මඟින් අනිවාර්යය අවශ්‍යතාවයක් ලෙස විගණනය කරන ආයතනයන්හි විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට ජාතික විගණන පනතින් ප්‍රතිපාදන සලසා ඇත. තවද, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ මඟින් ද විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමේ අවශ්‍යතාවය සහ කමිටු සංයුතිය සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා ඇත.

ඒ අනුව, විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් පත් කිරීම සම්බන්ධයෙන් අදාල මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ නිකුත් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් එම කමිටු ක්‍රියාකාරීත්වය තවදුරටත් විධිමත් කර ඇත.

මූල්‍ය හා වත්කම් කළමනාකරණය ඇතුළු ආයතනයේ සියලුම අංශයන් පිළිබඳ කරන ලද විගණනයන් සමාලෝචනය කිරීම මඟින් විගණන හා කළමනාකරණ කමිටුව මෙම ආයතනය සඳහා වෙන් කළ සම්පත් ප්‍රමුඛතා අනුපිළිවෙළට පෙර සකස් කරන ලද සැලසුම්වලට අනුගතව ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ප්‍රශස්ථ අයුරින් යොදාගෙන ඇත් ද යන්න තහවුරු කරනු ලබයි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි විගණන හා කළමනාකරණ කමිටුව මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු සහ විධායක නොවන තවත් මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය කාර්තුමය වශයෙන් මෙම විගණන කළමනාකරණ රැස්වීම් කැඳවීම සිදු කරනු ලබන අතර විගණන කමිටු සභාපති ලෙස කටයුතු කරනුයේ මහා භාණ්ඩාගාර නියෝජිතයා ය. මීට අමතරව ජාතික විගණන කාර්යාලයේ නිල නියෝජිත සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ නිරීක්ෂකයින් ලෙස සහභාගී වේ.

කාර්යභාරය

ආයතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර ඒවා සම්පූර්ණ බවටත් ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ප්‍රතිපත්තිවලට අනුකූල වන බවටත් තහවුරු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ විගණන හා කළමනාකරණ කමිටුව විසින් ලබා දී ඇත.

2023 වර්ෂය සඳහා ආයතනයේ කාර්යභාරය අනුව සහ අභ්‍යන්තර විගණන අංශයේ සම්පත් අනුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇගයීම් සිදු කරයි. ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය (Internal Control System) වැඩිදියුණු කිරීම මඟින් එදිනෙදා ආයතන කටයුතුවල අඩුපාඩු අවම කිරීමටත් ආයතනයේ කාර්යයන් සඳහා නියමිත කැලැන්ඩරයක් පවත්වා ගැනීම මඟින් ආයතනයේ කටයුතු නියමිත දිනවලදී සිදු කර ප්‍රමාදයන් වළක්වා ගත යුතු බවත් නැවත නැවතත් පෙන්වා දී ඇත.

2023 වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු 6ක් පවත්වන ලදි. වාර කිහිපයක් තිස්සේ නිවැරදි නොවී පුනරාවර්තනය වන කරුණු සම්බන්ධයෙන් ගත හැකි විගණන හා කළමනාකරණ ප්‍රතිකර්ම පිළිබඳව අවධානය යොමු කර අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඇත. අන්තරායකර ඖෂධ පාලක

ජාතික මණ්ඩලයේ කාර්යයන්/ මෙහෙයුම් සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති විගණන විමසුම් සඳහා ලබා දී ඇති පිළිතුරු අනුව අවධාරණය කරනු ලබන ගැටළු පිළිබඳ පසුවිපරම් සිදු කර ඇත.

ආයතනය සඳහා සත්‍ය හා සාධාරණ විගණන මතයක් ලබා ගැනීම සඳහා ආයතනයේ කළමනාකරණ අංශය සහ විගණන අංශය තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ.

අවදානම් කළමනාකරණය සහ රැස්වීම් වාර්තා/ මණ්ඩලයට වාර්තා කිරීම

විගණන හා කළමනාකරණ කමිටුව අවදානම් කළමනාකරණය සහ සමාලෝචන කමිටුව ලෙස ද ක්‍රියා කරනු ලැබේ.

අනුකූලවීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අර්ථ දැක්වීම්වලට අනුකූලව අදාල පාර්ශව ලේඛනගත කිරීමේ ක්‍රියා පරිපාටිය, වාර්ෂික පදනමින් ආයතනය විසින් කළ යුතු හෙළිදරව් කිරීම්වලට අදාල ක්‍රියා පරිපාටිය, ආරක්ෂණ සංකල්පයට අනුව අදාල ක්‍රියා පරිපාටීන්, නීති රීති විධාන හා පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හා විශේෂ විධිවිධාන, ආයතනයේ ගිණුම්කරණ රෙගුලාසි අනුව සිදු කළ යුතු හෙළිදරව් කිරීම් ද ඇතුළු කරුණුවල ඵලදායිත්වය සමාලෝචනයට ලක්විය.

2023 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්ය සාධනය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි විගණන හා කළමනාකරණ කමිටුව විසින් සමාලෝචිත වර්ෂයේ (2023) ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කර ඇති අතර, එය සියලු ක්‍රියාකාරී ක්ෂේත්‍රවල කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නංවන අතර, නිරීක්ෂණය කරන ලද අපගමනයන් මඟහරවා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දෙන ලදි. එපමණක් නොව, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා මඟින් ඉස්මතු කර ඇති කරුණු සමාලෝචනය කරන අතරම, අධ්‍යක්ෂ මණ්ඩලයට සුදුසු ප්‍රතිකර්ම යෝජනා කිරීමටත්, අදාල බලධාරීන් සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය වාර්තා කිරීමටත් පියවර ගන්නා ලදි.

විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන් සහ වගකීම් ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් දක්වන සහයෝගය හා දායකත්වය ආයතනයේ ප්‍රගමනයට ප්‍රධාන සාධකයක් වනු ඇත.

ඒ අනුව විගණනයේ වැදගත්කම සහ විගණන විමසුම් මඟින් ඉදිරිපත් වන කරුණු සැලකිල්ලට ගැනීමට ආයතනය බැඳී සිටින බව සහ ඒ අනුව අදාල අපගමනයන් නිවැරදි කර ගැනීමේ වගකීම පිළිබඳ ඉහළ කළමනාකාරීත්වය දැනුම්වත් විය යුතුවේ. තවද, ආයතනයේ මනා පැවැත්ම තහවුරු කිරීමට නම් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම සඳහා ආයතනයේ කළමනාකාරීත්වය විසින් නොපමාව කටයුතු කළ යුතුවේ.

14. ආදායම් ප්‍රකාශය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය (අ.ඖ.පා.ජා.ම)
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

		2023 රු.	2022 රු.
ආදායම්			
රාජ්‍ය පුනරාවර්ථන ප්‍රදාන	සටහන 1	263,717,000.00	234,850,000.00
වෙනත් ආදායම්	සටහන 2	25,135,091.38	9,634,530.52
ස්ථාවර වත්කම් විකණීමෙන් ලද ලාභය/අලාභය	සටහන 3	(350,663.47)	(6,601.54)
		288,501,427.91	244,477,928.98
වියදම්			
පුද්ගල හා පරිපාලන පිරිවැය	සටහන 4	168,288,977.44	183,529,003.93
වෙනත් මෙහෙයුම් පිරිවැය	සටහන 5	45,888,626.74	35,332,796.50
නිවාරණ අධ්‍යාපන හා පුහුණුව	සටහන 6	3,229,412.31	2,540,928.32
ප්‍රතිකාර හා පුනරුත්ථාපන පිරිවැය	සටහන 7	36,954,158.52	44,483,063.03
පර්යේෂණ අධ්‍යයන පිරිවැය	සටහන 8	2,522,691.50	977,452.00
බාහිර සේවා පිරිවැය	සටහන 9	4,202,821.95	2,656,407.68
රසායනාගාර පිරිවැය	සටහන 10	7,806,326.56	1,538,032.78
බන්ධනාගාර හා අනිකුත් මධ්‍යස්ථාන පිරිවැය	සටහන 11	219,132.00	52,424.00
මානව සම්පත් සංවර්ධන පිරිවැය	සටහන 12	297,500.00	(77,250.00)
මූල්‍ය පිරිවැය	සටහන 13	79,080.00	71,835.00
ක්ෂයවීම්	සටහන 14	21,261,328.04	21,732,572.95
මුළු මෙහෙයුම් පිරිවැය		290,750,055.06	292,837,266.19
වර්ෂය සඳහා අතිරික්තය/ (ඌණතාවය)		**(2,248,627.15)**	**(48,359,337.21)**

15. ශේෂ පත්‍රය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය (අ.ඖ.පා.ජා.ම)

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

		2023	2022
වත්කම්		රු.	රු.
ජංගම වත්කම්			
බැංකුවේ ඇති මුදල	සටහන 15	7,358,495.58	5,190,924.75
තොග	සටහන 16	4,696,855.55	5,051,689.65
ඉදිරියට කල ගෙවීම්	සටහන 17	4,466,502.40	1,025,243.81
අත්තිකාරම්	සටහන 18	1,434,534.50	1,434,534.50
		17,956,388.03	12,702,392.71
තැන්පතු	සටහන 19	696,812.96	696,812.96
ආපදා ණය හා උත්සව අත්තිකාරම්	සටහන 20	15,451,662.00	16,325,989.00
ප්‍රාග්ධන WIP -නව ගොඩනැගිල්ල	සටහන 21	3,529,450.59	18,056,142.20
		19,677,925.55	35,078,944.16
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	සටහන 22	593,146,932.84	590,815,390.43
		593,146,932.84	590,815,390.43
මුළු වත්කම්		630,781,246.42	638,596,727.30
හිමිකම් හා වගකීම්			
ජංගම වගකීම්			
විවිධ ණයහිමියෝ	සටහන 23	134,220.00	154,220.00
උපචිත වියදම්	සටහන 24	9,331,326.18	19,733,473.75
රඳවාගත් මුදල්	සටහන 25	333,491.15	196,140.00
		9,799,037.33	20,083,833.75
NNL පරීක්ෂණ - රියදුරු		1,151,891.00	1,344,441.00
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික වෙන්කිරීම්	සටහන 26	42,856,160.44	61,069,525.00
ගෙවිය යුතු පාරිතෝෂික	සටහන 26	-	2,082,650.00
		42,856,160.44	63,152,175.00
හිමිකම්			
රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානය	සටහන 27	122,845,946.94	107,037,946.94
ප්‍රාග්ධන සංචිත		65,503,710.68	65,503,710.68
ප්‍රත්‍යාගණන සංචිත		560,260,606.10	574,231,155.51
ඇක්චුරියල් ලාභය/අලාභය		18,587,724.41	-

අවිනිශ්චිත ගිණුම	සටහන 29	185,685.12	185,685.12
අතිරික්තය/ ඌනතාවය		(190,409,515.60)	(192,942,220.70)
මුළු හිමිකම්		576,974,157.65	554,016,277.55
මුළු හිමිකම් හා වගකීම්		630,781,246.42	638,596,727.30

ගිණුම්වලට අදාල ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලම අත්‍යාවශ්‍ය කොටසකි. මූල්‍ය ප්‍රකාශන මගින් 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කටයුතුවල සහ එහි අතිරික්තය/ඌණතාවය පිළිබඳව සත්‍ය හා සාධාරණ බවක් පෙන්නුම් කරන බවට අප සහතික වෙමු. මෙම මූල්‍ය ප්‍රකාශන රජයේ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල වන පරිදි සකස්කොට ඇත.

අධ්‍යක්ෂ මූල්‍ය
අ.ඔෆ.පා.ජා.ම

සභාපති
අ.ඔෆ.පා.ජා.ම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.

මණ්ඩලික සාමාජික
අ.ඔෆ.පා.ජා.ම

මණ්ඩලික සාමාජික
අ.ඔෆ.පා.ජා.ම

16. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

16.1 සංස්ථාපිත තොරතුරු

16.1.1 පිහිටුවීම හා නීතිමය ස්වරූපය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන පනත මගින් ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම ආයතනයේ ප්‍රධාන කාර්යාලය, අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

16.1.2 මණ්ඩලයේ බලතල

(අ) අන්තරායකර ඖෂධ අනිසි ලෙස භාවිතය වැළැක්වීම සහ පාලනයට සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියක් නියාමනය කිරීම සහ සමාලෝචනය කිරීම සහ එවැනි ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් සහ නිර්දේශ ලබා දීම.

(ආ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමට සාධාරණ ලෙස අවශ්‍ය වන විට පුද්ගලයන්, සංවිධාන, රජයේ දෙපාර්මේන්තු සහ රජයේ සංස්ථාවලින් තොරතුරු සහ විස්තර කැඳවීම.

එසේ වුවද, අධිකරණයෙන් ඉල්ලා සිටින විට හෝ පනතේ වෙනත් විධිවිධාන සමඟ අනුකූල වීම සඳහා හැරුණු විට මෙම වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ලබා ගත් කිසියම් තොරතුරක් හෝ විස්තර සාමාජිකයෙකු විසින් අනාවරණය නොකළ යුතුය.

(ඇ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය සහ විදේශීය මූලාශ්‍රයන්ගෙන් ආධාර සහ ප්‍රදාන ලබා ගැනීම.

(ඈ) අන්තරායකර මත්ද්‍රව්‍ය නිවාරණයෙහි සහ පාලනයෙහි යෙදී සිටින නියෝජිතායතනයන් හි ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

(ඉ) මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපන කාර්යයන් ප්‍රවර්ධනය කිරීම සහ ළමුන් සහ වැඩිහිටියන් සඳහා ජාතික අන්තරායකර ඖෂධ අනිසි භාවිතය සහ නිවාරණය සම්බන්ධව අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.

(උ) අන්තරායකර ඖෂධ පාලන ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධිත ජාතික, කලාපීය සහ අන්තර්ජාතික සංවිධාන සහ නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම

(ඌ) මත්ද්‍රව්‍ය පාලන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර සංගම් සහ නියෝජිතායතන සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම.

(එ) කිසියම් චංචල හෝ නිශ්චල දේපළක් අත්පත් කර ගැනීම, තබා ගැනීම හෝ බදුදීම හෝ කුලියට දීම, උකස් කිරීම, ඇප තැබීම සහ විකිණීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම.

16.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

16.2.1 සකස් කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශන සඳහා බලපානු ලබන උද්ධමන සාධක සඳහා ගැලපුම් කර නොමැත. අදාළ තැන්හි භාවිත කළ විශේෂ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල පැහැදිලි කර ඇත. මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ඉදිරිපත් කර ඇත.

16.2.2 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වඩා හොඳින් අවබෝධ කරගැනීම සඳහා පෙර වර්ෂයට අදාළ අවශ්‍ය සංසන්දනාත්මක සංඛ්‍යා ඉදිරිපත් කර තිබේ.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ ප්‍රතිවර්ගීකරණය කිරීම සංශෝධනය කර ඇති විට, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් ලබා දීම පිණිස ප්‍රවර්ථන වර්ෂය සමඟ අනුකූල වන පරිදි සංසන්දනාත්මක අගයන් ද ප්‍රතිවර්ගීකරණය කර ඇත.

16.2.3 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයට හෝ ප්‍රත්‍යාගණන වටිනාකමෙන් සමුච්චිත ක්ෂය අගය අඩු කර දක්වා ඇත. සින්නක්කර ඉඩම් හැරුණු විට දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය අගය වෙන් කිරීම ඒවායේ ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ සමාන වාරිකවලින් ලියා හැරීම පිණිස ඒවායේ ආගණනය කළ අගය මත පහත පරිදි ගණනය කරනු ලබයි.

	වසරකට අනුපාතය (%)	
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	5	අවු.20
ගෘහ භාණ්ඩ	10	අවු.10
කාර්යාල උපකරණ	20	අවු.05
පරිසනක මෘදුකාංග	20	අවු.05
සවිකිරීම්	20	අවු.05
පුස්තකාල පොත්	25	අවු.04
වාහන	25	අවු.04
මුළුතැන්ගෙයි උපකරණ	20	අවු.05
ගෙවතු වගා උපකරණ	20	අවු.05
රසායනාගාර උපකරණ	20	අවු.05
වෙනත් පිරියත සහ උපකරණ	20	අවු.05

ක්ෂය වීම ගණනය කරනු ලබන්නේ වසර තුළ මිලදීගත්/ බැහැර කල වත්කම් සඳහා මිලදීගත්/ බැහැර කල දිනය මතය.

මෝටර් වාහන, ප්‍රධාන කාර්යාලයේ ඉඩම සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අගයන් මත දැක්වෙන අතර අනෙකුත් සියළුම වත්කම් ඓතිහාසික පිරිවැයට දැක්වේ.

තලංගම හා ගාල්ල මධ්‍යස්ථානවල ඉඩම් අයිතිය, සෞඛ්‍ය අමාත්‍යාංශයට වන අතර එම ඉඩම්වල ඉදිකරන ලද ගොඩනැගිලි අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සතුවේ.

පහත වත්කම් කල්බදු පදනම මත මිලදී ගෙන ඇත.

කල්බදු දේපළ	වටිනාකම රු.	කල්බදු කාලසීමාව
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය	4,350,000.00	අවුරුදු 99
පිටිපන ඉඩම	4,027,518.00	අවුරුදු 30
නුවර - හන්දෙස්ස ඉඩම	1,893,051.00	-
මහහේන වතුයාය	13,062,750.00	අවුරුදු 30

16.2.4 කල්බදු දේපළ

2016.03.04 සිට 2046.03.03 දක්වා වසර 30ක කාලයක් සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමඟ බදු ගිවිසුම අත්සන් කර ඇත. මෙම මුදල තුළ එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළත් නොවන අතර වසර 30ක කුළී ගෙවීම්, මුද්දර ගාස්තු හා නීතීඥ ගාස්තු ඇතුළත් වේ.

පෙර වර්ෂයේ කල්බදු කුලී වසර 5ක් සඳහා ගෙවා ඇති අතර එම අගය වසර පහක් ඇතුළත සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරනු ලැබේ.

16.2.5 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 "සේවක ප්‍රතිලාභ", මගින් නිර්දේශ කර ඇති, "පුරෝකථනය කල ණය ඒකක ක්‍රමය" භාවිත කොට ප්‍රතිලාභ හඳුනා ගෙන ඇත.

16.2.6 වෙළඳ ලැබීම්

වෙළඳ ලැබීම් සටහන් කරනු ලබන්නේ අපේක්ෂිත ලැබිය හැකි වටිනාකමටය. වසර අවසාන වන විට පවතින සියළුම නොපිය වූ මුදල් හි සමාලෝචනයක් මත පදනම්ව අඩමාන ලැබීම් සඳහා ඇස්තමේන්තුවක් සකස් කරනු ලබයි. හඳුනාගත් වර්ෂය තුළදී බොල් ණය කපා හැරේ.

16.2.7 මුදල් සහ මුදල් හා සමාන අයිතම

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි අරමුණු සඳහා මුදල් හා සමාන අයිතම ලෙස අතැති මුදල්, බැංකු තැන්පතු, බැංකු අයිරාවන් හි ශුද්ධ වටිනාකම අන්තර්ගත වේ. ශේෂ පත්‍රයේ ජංගම බැරකම් තුළ ණය ගැනීම යටතේ බැංකු අයිරාවන් ඇතුළත් කර ඇත.

ව්‍යාපාරික වටිනාකමක් නොමැති නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාතික මාදක රසායනාගාරය භාරයේ තබාගෙන ඇත්තේ, නීතීය ක්‍රියාත්මක කිරීම අදාළ ආයතන සඳහා පවත්වනු ලබන ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සඳහා ප්‍රදර්ශන කටයුතු වලට යොදා ගැනීමටය.

16.2.8 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සියළුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය ගැළපීම් සහ හෙළි කිරීම් සිදුකර ඇත.

16.2.9 බැරකම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍ර දිනට හඳුනාගත් සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කරනු ලබන අතර පවතින බවට හඳුනාගන්නා ලද එහෙත් මුදල නිවැරදි නිශ්චය කළ නොහැකි බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසනු ලැබේ.

16.2.10 ඊ.පී.එෆ් සහ ඊ.ටී.එෆ් සඳහා ප්‍රතිපාදන

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට දායකත්වය ලැබීමට සේවකයන් සුදුසුය. සේවකයන්ගේ දළ වැටුප මත මණ්ඩලය විසින් ඊ.පී.එෆ් සහ ඊ.ටී.එෆ් සඳහා පිළිවෙලින් 12% සහ 3% බැගින් දායකත්වය සපයනු ඇත.

16.2.11 ආදායම

16.2.11.1 පුනරාවර්ථන ස්වරූපයේ ප්‍රතිපාදන

පුනරාවර්ථන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත ලද ප්‍රතිපාදන, ආදායම ලෙස හඳුනාගෙන ඇති අතර මණ්ඩලය විසින් උපයාගනු ලබන සියලු ආදායම් වෙනත් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශනය තුළ සෘජුවම හඳුනා ගනී.

16.2.11.2 ප්‍රාග්ධන ස්වරූපයේ ප්‍රතිපාදන

ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත ලබා දෙන ප්‍රතිපාදන අදාළ වියදම් වාර්තා කිරීම මඟින් අඩුකොට ඇත.

16.2.12 වියදම්

වියදම ඉක්මවූ ආදායම ගණනය කිරීමේදී මණ්ඩලය පවත්වා ගෙන යාම වෙනුවෙන් දරන ලද පුනරාවර්ථන ස්වරූපයේ සියලුම වියදම ආදායමට අය කරගෙන ඇත.

16.2.13 භාණ්ඩ තොගය

භාණ්ඩ තොගය පිරිවැයට හඳුනා ගන්නා අතර පෙර ඇතුළු පෙර පිට ක්‍රමය යටතේ අගය කරනු ලැබේ.

16.2.13.1 ජාතික මාදක රසායනාගාරයේ අනතුරුදායක මත්ද්‍රව්‍ය තොගය

පහත සඳහන් මත්ද්‍රව්‍ය වර්ග නිදර්ශක ලෙස භාවිතයට රසායනාගාරයේ තබා ඇත.

වර්ගය	ප්‍රමාණය (ග්‍රෑම්)
අබිං	537.33
හෙරොයින්	607.98
ගංජා/ කංසා පැළෑටි ද්‍රව්‍ය	461.60
කොකේන්	463.49
මෙතැම්පිටමින්	0.61
ඔක්ස්ටසි එම්.ඩී.එම්.ඒ	9.79
බාබිටියුරේට්ස්	0.06
එල්.එස්.ඩි	0.054
සයිලොසීන් එන්පිඑස්	5.86
පෙනිතිලැමයින්	0.01
ඉබෝගනීන්	6.96
කාත් පැළෑටි ද්‍රව්‍ය	126.08

16.2.14 ප්‍රත්‍යාගණනය

මණ්ඩලය විසින් මෝටර් රථ සහ රාජගිරියේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඉඩම සහ ගොඩනැඟිල්ල තක්සේරු කර ඇත.

වත්කම් වර්ගය	ප්‍රත්‍යාගණනය කිරීමේ දිනය	ප්‍රත්‍යාගණනය කිරීමේ පාර්ශව	ප්‍රත්‍යාගනිත වටිනාකම (රු.)
ඉඩම	2018-03-28	පළාත් තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව.	365,000,000.00
ගොඩනැඟිලි	2018-03-28	පළාත් තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව.	81,418,000.00

මෝටර් රථ	2014-02-19		
WP KR 4875			4,200,000.00
WP KF 2801			2,300,000.00
301-9695			1,600,000.00
19-9679			1,000,000.00
64-4315			1,700,000.00
32-4515			2,000,000.00
WP NB 1258			7,000,000.00
129-7344			20,000.00
WP XC 8708			135,000.00
51-7214			1,400,000.00
WP HQ 6503			35,000.00
WP HQ 6505			40,000.00
WP YU 6932			350,000.00
WP YU 6934			350,000.00
WP YU 6938			390,000.00
WP YU 6933			375,000.00
54-0014			1,200,000.00
WP PB 4613			2,500,000.00
WP XC 8705			70,000.00

16.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම.

16.3.1 ක්ෂය ප්‍රතිපත්තිය

2016 වර්ෂයේ සිට මිල දී ගත් වත්කම් සඳහා ක්ෂය ක්‍රමය මිලදී ගත් වර්ෂයේ දී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීමේ ක්‍රමයේ සිට මිලදී ගත් වර්ෂයේදී දින පදනම මත ක්ෂය කිරීමේ ක්‍රමයට වෙනස් වේ.

16.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

"වක්‍ර ක්‍රමය" උපයෝගි කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත. "මුදල් හා මුදල් සමාන අයිතම" තුළ මණ්ඩලයේ බැංකු ශේෂයන් අන්තර්ගත වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීඑවිඕ/සි /එන්ඩීඩීසීබී එස්එස්/2023/03

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2024 ජූලි 09 දින

සභාපති
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒම්.යූ.එස්.ඒ.විජේකෝන්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : 1. ලේකම් - මහජන ආරක්ෂක අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. } ටීඑඒඕ/සි /එන්ඩීඩීසීබී එෆ්එස්/2023/03

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 ජූලි 07 දින

සභාපති
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ කොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව, එක් පන්තියකට අයත් වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් පන්තිය එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඊට පටහැනිව කොටස් වශයෙන් වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කර තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි ගිණුමේ ශේෂය රු.217,592,705 ක් වූ අතර ඊට රු 44,929,705 ක් වූ ගොඩනැගිලි පිරිවැය වටිනාකමත් රු172,663,000 ක් වූ ගොඩනැගිලි ප්‍රත්‍යාගණ වටිනාකමත් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 65 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුතරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.43,265,362 ක් වූ මෝටර් වාහන සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණි. ඒ අනුව සිදුවී තිබූ ඇස්තමේන්තුගත දෝෂ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1992 වර්ෂයේදී 99 අවුරුදු බදු පදනම මත ලබා ගෙන තිබූ ප්‍රධාන කාර්යාලය ඉඩම 2018 වර්ෂයේදී රු.365,000,000 ක වටිනාකමක් ප්‍රත්‍යාගණය කර ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. තවද බදු දේපල වටිනාකම වෙන්ව දැක්විය යුතු වුවත් ඉඩම් වල වටිනාකම යටතේ ගිණුම්ගත කර තිබුණි. මෙම ඉඩමේ බදු වටිනාකම රු 4,350,000 ක් වූ අතර වාර්ෂික ක්‍රමක් ක්ෂය වටිනාකම් එකතුව රු 1,318,182 ක් වුවත් එම වටිනාකම ගිණුමට ගෙන නොතිබුණි.

(ඈ) වටිනාකම රු 4,085,019ක් වූ 30 අවුරුදු බදු පදනම මත ලබාගෙන ඇති හෝමාගම පිටිපන ඉඩම, ඉඩම් ගිණුම යටතේ දක්වා තිබූ අතර බදු ඉඩම් ගිණුමට ගෙන වාර්ෂිකව ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) තිස් අවුරුදු බදු පදනම මත ලබා ගෙන තිබූ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු නවදිගන්තය පුනරුත්ථාපන මධ්‍යස්ථාන ඉඩම 2016 මාර්තු 04 වන දිනට බදු ගිවිසුමට අනුව බදු වටිනාකම
රු13 ,062,750 ක් විය. මෙහිදී වාර්ෂික පදනමින් කල්බදු කුළී ගෙවීම සිදු කර ගෙවූ බදු වටිනාකම පමණක් ගිණුම්ගත කර තිබූ අතර මූල්‍ය තත්ව ප්‍රකාශයේ බදු ඉඩම් යටතේ බදු දේපලෙහි වටිනාකම දක්වා නොතිබුණි.

(ඊ) වසර 20 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පවතින අත්තිකාරම් ගිණුමේ පැවති රු.1,434,534 ක හර ශේෂය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම් පිළිබඳව ලිඛිත තොරතුරු වගකිව යුතු අංශ සතුව නොපැවතුණු අතර එකී විස්තර විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(උ) අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ ගොඩනැගිල්ල තුළ සවිකර ඇති සෝපානය අලුත් වැඩියාව සඳහා රු 1,764,690 ක් වූ ඉන්වොයිස් වටිනාකම මත කාර්ය සාධන ඇපකරයක් ලබා ගෙන මුදල් ගෙවා තිබුණි. විගණන වාර්තාවේ දිනය වන විටත් අළුත්වැඩියාවන් සම්පූර්ණකර නොතිබුණ ද මෙම වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ගෙවූ අත්තිකාරම් යටතේ ගිණුම්ගත නොකොට යන්ත්‍ර හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඌ) පාරිතෝෂික ගෙවීම්

i. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 යෙහි පරිච්ඡේද අංක 140 අනුව අස්ථිත්තයක් එහි නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වල ස්වභාවය සහ එම කාල පරිච්ඡේදය තුළ එම සැලසුම් වල මූල්‍ය බලපෑම්වල වෙනස්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට ඇගයීමට හැකිවන තොරතුරු හෙළිදරව් කල යුතුය. තවද පරිච්ඡේද අංක 141 (ග)අනුව වැටුප් වැඩි කිරීමේ අනුපාතිකය ගණනය කිරීම පිළිබඳව වටිනම් අනුපාතිකය නිර්ණය කළේ කුමන පදනම්ින්ද යන්නද හෙළිදරව් කර නොතිබුණි. මෙහිදී ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වෙනස්වීම් මත මූල්‍ය ප්‍රකාශන වලට වූ බලපෑම් සටහනක් තුළින් හෙළිදරව් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික වෙන්කිරීම් වටිනාකම රු. 42,856,163 ක ශේෂය තුල සේවයේ නොමැති නිලධාරීන් හතරදෙනෙකු සඳහා ද රු. 1,973,454 ක පාරිතෝෂික වෙන්කිරීම් සිදු කර තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් වටිනාකම රු. 1,973,454 කින් වැඩියෙන් දක්වා තිබුණි.

iii. මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 අනුව බැඳීම් වල වර්තමාන අගය ලෙස රු 307,076,330 ක වටිනාකමක් දක්වා තිබුණ ද ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල එහි අදාලත්වය විගණනයට ඉදිරිපත් නොවීය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම් වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද ඉහත 1.2 (අ), (ඇ), (ඊ) හැර නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති/විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීම සම්මුති පනතේ 18 වැනි වගන්තිය සමඟ 31 වන වගන්තිය හා අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයට අනුව සාදනු ලැබූ නියෝග අංක 1653/7-2010 මැයි 10 දින අති විශේෂ ගැසට් පත්‍රය	
i. IV වැනි කොටස පරිශ්‍ර ලියාපදිංචි කිරීම නියෝග 9	ද්‍රව්‍ය ආනයන කිරීමට හෝ අපනයන කිරීමට අදාල වන කාර්යයන් කරගෙන යන්නා වූ පරිශ්‍රයන් බලපත්‍ර නිකුත් කල දින සිට මාසක් ඇතුළත සෑම බලපත්‍රලාභියකු විසින්ම අධිකාරිය සමඟ ලියාපදිංචි විය යුතු අතර ප්‍රවර්ථන වර්ෂයේදී පරිශ්‍ර 16 ක් ලියාපදිංචි කර 10 කට බලපත්‍ර නිකුත් තර තිබුණි. තවද අධිකාරියේ සාමාජිකයින් අවම වශයෙන් මාස 3 ට වරක් හෝ බලපත්‍රලාභියාගේ ලියාපදිංචි කරනු ලැබූ පරිශ්‍රයට පැමිණ ක්‍රියාකාරකම් පිළිබඳ අධික්ෂණය කළ යුතු අතර , ද්‍රව්‍යයන් ගබඩා කර ඇති ආකාරය , උපකරණ භාවිතය පවත්වාගෙන යනු ලබන පොත් ලේඛන රෙජිස්ටර් සහ වාර්තා පරීක්ෂා කල යුතුයි. එසේ වුවත් 2023 වර්ෂයේ බලපත්‍රලාභී ආනයන 91 දෙනෙකුගේ පරිශ්‍ර 51 ක් පමණක් පරීක්ෂා කර තිබුණි.

	ii. නියෝග 5 ඡේදය	පුරෝගාමී පාලන අධිකාරියේ බලතල කාර්යයන් හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරීම ,ඉටුකිරීම සහ සිදුකිරීම සඳහා අවශ්‍ය විය හැකි ලේකම්වරයෙකු සහ වෙනත් නිලධාරීන් සහ සේවකයන් අධිකාරිය විසින් පත්කරනු ලැබිය යුතු වුවද පුරෝගාමී අධිකාරියට 2023 වර්ෂය අවසන් වන තුරු අවශ්‍ය වන කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු සිදු කර නොමැති අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.
	iii. නියෝග 8 ඡේදය හා නියෝග 10 ඡේදය	2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන වලට යටත්ව අධිකාරියේ මණ්ඩලය 2023 වර්ෂයේ එක් අවස්ථාවක් පමණක් රැස් වී තිබූ අතර නියෝග 10 ඡේද ප්‍රකාරව එහි කාර්යයන් පිළිබඳ පුරෝගාමී අධිකාරියේ මණ්ඩලයේ සාමාජිකයන් විසින් සමාලෝචනය සිදු කිරීම සඳහා පුරෝගාමී අධිකාරියේ මණ්ඩලය අවම රැස්වීම් ගණනවත් පවත්වා නොතිබුණි.
(ආ)	2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පනතට අනුසාංගිකව නිකුත් කරන ලද 2010 මැයි 12 දිනැති අංක 1653/19 -2010 ගැසට් පත්‍රය නියෝග අංක 2	ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් රැක බලා ගැනීම හා පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා නියෝග ප්‍රකාරව බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව පවත්වාගෙන යා නොහැකි වුවද, 2023 වර්ෂය අවසන් වන විට රට තුල පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 26 ක් පැවති අතර එබැවින් මධ්‍යස්ථාන 13 ක් පමණක් බලපත්‍ර ලියාපදිංචිය යාවත්කාලීන කර තිබුණි. 2024 මැයි 10 විගණන දින වන විට 2023 වර්ෂය සඳහා පෞද්ගලික පුනරුත්ථාපන මධ්‍යස්ථාන 13 ක බලපත්‍ර යාවත්කාලීන කර ගැනීම සඳහා ඉල්ලීම් කර තිබුණද එම මධ්‍යස්ථානයන් සඳහා ආරක්ෂණ නිෂ්කාශනය ලබා ගැනීම සඳහා යොමු කර ඇති බැවින් 2022 වර්ෂයේ සිට මෙම මධ්‍යස්ථාන 13 බලපත්‍ර රහිතව පවත්වා ගෙන ගොස් තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් කරුණු හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(අ) 2007 අංක 54 දරන ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්තාපනය) පිළිබඳ	

i.	7 වන වගන්තිය ප්‍රකාරව තුලනික්ෂණ මූල මණ්ඩලයක් පත් කර නොතිබීම.	නිති ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වයට පත් තැනැත්තන් අතරින් හෝ අන්තරාදායක ඖෂධ ඇබ්බැහිය හා සම්බන්ධ කායික විද්‍යාත්මක හෝ සමාජ ගැටළු යන පිළිබඳ පලපුරුද්ද හා දැනුම ඇති තැනැත්තන් අතරින් දහදෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත තුලනික්ෂණ මූල මණ්ඩලයක් පත් කර නොතිබුණි.
ii.	4 (02) සහ (03) යන වගන්ති ප්‍රකාරව මධ්‍යස්ථානයකට ඇතුළු වී අවශ්‍ය යයි සලකන පරීක්ෂාවන් සිදුකිරීම	බලය පැවරී ඇති නිළධාරියෙකුට යුක්ති සහගත වේලාවන්හිදී පනත යටතේ බලපත්‍ර දී තිබෙන හෝ නාමෝදිෂ්ඨ යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළු වී අවශ්‍ය යයි සලකන පරීක්ෂාවන් සිදු කල හැකි වූවද මධ්‍යස්ථාන 26 න් 2023 වර්ෂයේදී මධ්‍යස්ථාන 16 ක් පමණක් පරීක්ෂාවට ලක් කර තිබුණ අතර නියමිත කාලාන්තරිය වාර්තා මඟින් ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි සාර්ථකත්වය පිළිබඳ තොරතුරු මණ්ඩලයේ අවධානයට යොමු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2014 අප්‍රේල් 30 දින, තිස් අවුරුදු බදු පදනම මත රු.4,085,018කට ලබාගෙන ඇති හෝමාගම පිටිපන ඉඩම වසර 8 ක් ගතව තිබියදීත් යොදාගනු ලැබීමට අපේක්ෂිත කාර්යය නිශ්චිතව නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දී නොතිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩමට අදාල බදු ඔප්පුව ලබා ගෙන නොතිබුණි. මෙම ඉඩම ඵලදායී කාර්යයක යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

2023 වර්ෂයේ රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා සකස් කරන ලද පිරිවිතර තාක්ෂණික ඇගයීම් කමිටුව සමාලෝචනය කර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව මිල ගණන් කැඳවා තිබුණි. 2023 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම රු මිලියන 5ක සීමාව තුල මිල ගණන් කැඳවා තෝරාගත් රක්ෂණ ආයතන සමඟ රක්ෂණ ප්‍රතිලාභයෝජනා ගිවිසුම් 2023 ඔක්තොම්බර් 1 දින සිට 2024 සැප්තැම්බර් 30 දක්වා කාලපරිච්ඡේදයට අදාලව එක් සේවකයෙකුගේ වාර්ෂික වාරික වටිනාකම රු 26,645 ක්ද මණ්ඩලයේ වසරක් සම්පූර්ණ කර ඇති සේවකයන් 201 ක පවුල්වල සාමාජිකයන්ද සමඟ මුළු සාමාජිකයන්

597ක් ආවරණය වන පරිදි පුද්ගලික රක්ෂණ සමාගමක් සමඟ රු 5, 677, 525 ක වාර්ෂික වටිනාකමකට ගිවිසුම් ගත වී තිබුණි. මේ සඳහා මණ්ඩලයේ නිලධාරීන්ගෙන් කිසිදු මූල්‍ය දායකත්වයක් ලබා ගෙන නොතිබූ අතර විගණන දිනය වන විට රක්ෂණ ප්‍රතිලාභ ලෙස සේවකයන්ට රු 2,071,063 ක් රක්ෂණ ආයතනයෙන් ලබා ගෙන තිබුණි. එසේ වුවද නව රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා මහා භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කාර්ය මණ්ඩලය

2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, ප්‍රධාන කාර්යාල හා පළාත් කාර්යාලයද ඇතුළුව 374 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 205ක් විය. එබැවින් පුරප්පාඩු සංඛ්‍යාව 169 ක් විය. මෙම පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් කටයුතු කඩිනමින් සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන නව දිගන්තය

මෙම මධ්‍යස්ථානයට හිමිනමකගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ඉදි කර තිබූ රු 12,800,000 ක් පමණ වටිනා ගොඩනැගිල්ල හා ජාත්‍යන්තර ආයතනයක ආධාර මත ඉදි කර තිබූ රු 7,844,963 ක් වටිනා ගොඩනැගිල්ල ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතයට ගත හැකි පරිදි සියලු ලී බඩු හා උපකරණ වලින් සමන්විතව ඇතත් එම ගොඩනැගිල්ල 2023 වර්ෂය තුල දී ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යයෙන් පැවතුණි. මෙම ගොඩනැගිලි ඉදිකර මණ්ඩලය වෙත 2021 වර්ෂයේ බාර දී ඇති අතර අවශ්‍ය කරන යටිතල පහසුකම් හා කාර්ය මණ්ඩලය අනුයුක්ත කර ගැනීම සඳහා කටයුතු කර නොතිබීම ඊට හේතුවිය.

(ඉ) 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර පුනරුත්ථාපනය) පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා 2022 ජනවාරි 24 දින පැවති ආමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අමප/21/2279/303/176 මගින් අනුමැතිය ලබා දී තිබුනද පනතට අදාළ සංශෝධන කටයුතු නිම කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

18. පසුගිය වර්ෂ 10ක, වැදගත් මූල්‍යමය තොරතුරු

මූල්‍යමය සාරාංශය

අභ්‍යන්තර මූල්‍ය කළමණාකරණය, අයවැය සම්පින්ඩනය, මූල්‍ය වාර්තාකරණය සහ කළමණාකරණ ක්‍රමවේද සඳහා මෙම අංශය වගකිව යුතුය.

පසුගිය වසර දහය පුරා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ආදායම්, වියදම්, භාණ්ඩාගාර ප්‍රදාන පහත දැක්වෙන පරිදි සාරාංශ කර දැක්විය හැක.

රජයේ පුනරාවර්ථන හා ප්‍රාග්ධන ප්‍රදාන

	2014	2015	2016	2017	2018
රජයේ පුනරාවර්ථන ප්‍රදාන	139,123,000.00	170,633,833.00	201,401,000.00	194,098,000.00	208,723,999.00
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	30,000,000.00	17,233,000.00	20,000,000.00	3,500,000.00	27,448,000.00

	2019	2020	2021	2022	2023
රජයේ පුනරාවර්ථන ප්‍රදාන	218,522,202.00	249,463,501.00	243,944,000.00	234,850,000.00	263,717,000.00
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	14,400,000.00	24,916,946.94	16,473,000.00	300,000.00	15,808,000.00

පසුගිය වසර දහයක ආදායම් විශ්ලේෂණය

	2014	2015	2016	2017	2018
නේවාසික සහ ඇතුළත්වීමේ ගාස්තු	2,156,000.00	2,004,000.00	2,375,000.00	3,750,000.00	4,785,000.00
මත්ද්‍රව්‍ය උපදේශන සහතික පාඨමාලා ආදායම	2,232,000.00	3,564,000.00	5,642,950.00	5,514,475.00	5,492,000.00
පොල් ආදායම	1,257,350.00	968,591.00	805,294.00	937,983.00	1,717,699.25
ජාතික මාදක රසායනාගාර ආදායම	640,000.00	594,750.00	659,500.00	713,250.00	703,000.00
මත්ද්‍රව්‍ය නිවාරණ සහතිකපත් පාඨමාලා ආදායම	-	-	-	-	-
පී සී ඒ ආදායම	-	-	-	4,383,428.00	1,848,500.00

	2019	2020	2021	2022	2023
නේවාසික සහ ඇතුළත්වීමේ ගාස්තු	3,885,000.00	1,976,000.00	910,000.00	720,000.00	1,700,000.00
මත්ද්‍රව්‍ය උපදේශන සහතික පාඨමාලා ආදායම	5,391,450.00	2,311,525.00	1,828,950.00	758,475.00	3,588,175.00
පොල් ආදායම	1,334,435.99	1,091,357.00	1,680,819.50	1,734,826.50	1,464,062.00
ජාතික මාදක රසායනාගාර ආදායම	655,750.0	655,750.0	655,750.0	655,750.0	4,351,000.00
මත්ද්‍රව්‍ය නිවාරණ සහතිකපත් පාඨමාලා ආදායම	-	-	595,000.00	595,000.00	595,000.00
පී සී ඒ ආදායම	1,971,000.00	1,360,750.00	1,267,500.00	1,232,500.00	1,232,500.00

ආදායම් හා වියදම් විශ්ලේෂණය

	2014	2015	2016	2017	2018
මුළු ආදායම	147,355,485.00	178,809,437.00	224,954,432.00	218,035,628.00	226,783,685.18
මුළු වියදම	163,262,111.00	192,920,272.00	262,137,446.00	252,116,456.00	255,075,406.03
වර්ෂය සඳහා හිඟය	15,906,626.00	14,110,835.00	37,183,014.00	34,080,828.00	28,291,721.85

	2019	2020	2021	2022	2023
මුළු ආදායම	232,579,130.38	259,336,340.84	285,512,026.21	244,477,928.98	288,501,427.91
මුළු වියදම	270,838,773.85	272,033,618.71	270,493,976.89	292,837,266.19	290,750,055.06
වර්ෂය සඳහා හිඟය	38,259,643.47	12,697,277.87	15,018,049.32	48,359,337.21	2,248,627.15

19. තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ වාර්තාව

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය තිරසාර සංවර්ධන ඉලක්ක කිහිපයක් (SDG-2030) මත සිය මෙහෙයුම් මෙහෙයවන අතර සෑම දෙපාර්තමේන්තුවක්ම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රතිඵල ලඟා කර ගැනීමේදී සහ සේවා පුළුල් කිරීමේදී තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම්ව කටයුතු කරයි.

තිරසාර සංවර්ධන ඉලක්ක අංක 3 - නිරෝගී බව සහ යහපැවැත්ම හා 3.5 - හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම යටතේ ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් සාක්ෂාත් කර ගැනීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය, ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය, බාහිරසේවා අංශය, ජාතික මාදක රසායනාගාරය, නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර අංශය, පර්යේෂණ අංශය සහ පුරෝගාමී පාලන අධිකාරිය විසින් සෘජුව ක්‍රියා කරයි.

මීට අමතරව, තිරසාර සංවර්ධන ඉලක්ක අතර අංක 5.1 යටතේ තම ආදරණීයයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සහ දුරාචාර හැසිරීම හේතුවෙන් කාන්තාවන් වඩාත් ශාරීරික, මානසික, චිත්තවේගීය සහ සංජානන පරිහානියට ගොදුරු වන බව අවබෝධ කරගනිමින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ප්‍රධාන සාක්ෂාත් ඉලක්කයක් ලෙස කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැළකීම් තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක වේ. ඒ අනුව වැඩසටහන් සැළසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සෑමවිටම සමානාත්මතාවයට ගරු කරන අතර කාන්තාවන්ට විශේෂ සැලකිල්ලක් දැක්වීම මෙමගින් සහතික කෙරේ.

තිරසාර සංවර්ධන ඉලක්ක 10.2 - 2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිතබව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලුදෙනාගේ සමාජ ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබලගැන්වීම සහ පවර්ධනය, 10.3 - ප්‍රතිලාභ බෙදීයාමේදී සමාන අවස්ථාවන් පැවතීම තහවුරු කිරීම, පවත්නා අසමානතාවන් අවම කිරීම සහ වෙනස්කොට සැලකීමට තුඩුදෙන්නා වූ නීති, ප්‍රතිපත්ති සහ භාවිතාවන් ඉවත් කිරීම සහ මේ සම්බන්ධයෙන් සුදුසු නීති ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ගැනීම ජාතික මාදක රසායනාගාරය සහ පුරෝගාමී පාලන අධිකාරිය විසින් සලකා බලනු ලබන තවත් ඉලක්කගත විෂයකි. මේ සමඟ ජාතික මාදක රසායනාගාරය මත්ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට සක්‍රීයව කටයුතු කරයි.

තිරසාර සංවර්ධන ඉලක්ක 16.B උපශීර්ෂය තුළ තිරසාර සංවර්ධනය සඳහා වෙනස්කොට සැළකීම වැළැක්වීම සඳහා වූ නීති සහ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම හා බලගැන්වීම සඳහා ජාති, ආගම්, මකුල, සංස්කෘතිය, වර්ණ, ලිංගිකත්වය වැනි භේදයකින් තොරව මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාර සහ පුනරුත්ථාපන සේවා සැපයීමේදී ලිංගික දිශානතිය, ජනවාර්ගිකත්වය යනාදිය, සේවා සැපයීම, සේවා ලබා ගැනීමේ හැකියාව යනාදී වෙනස්කිරීම්වලට යටත් නොවී සමානාත්මතාවය ආරක්ෂා වන පරිදි කටයුතු කරනු ලබයි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය (අ.ඖ.පා.ජා.ම)
2023.12.31 අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2023.12.31 අවසන් වර්ෂය රු.	2022.12.31 අවසන් වර්ෂය රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
වර්ෂය සඳහා අතිරික්තය/ (ඌණතාවය)	(2,248,627.15)	(48,359,337.21)
ගැලපුම්		
ක්ෂයවීම්	21,261,328.04	21,732,572.95
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	10,355,209.34	12,278,512.76
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය/ (අලාභය)	350,663.47	-
පෙර වර්ෂයට අදාළ ගැලපීම්	4,781,332.25	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	34,499,905.25	(14,348,251.50)
ආපදා ණය හා උත්සව අත්තිකාරම්	874,327.00	1,887,407.00
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්	35,374,232.95	(12,460,844.50)
තොග	354,834.10	280,897.23
ඉදිරියට කල ගෙවීම්	(3,441,258.59)	(167,756.68)
තැන්පතු	-	285,422.31
අත්තිකාරම්	-	(188,000.00)
විවිධ ණයහිමියෝ	(20,000.00)	10,000.00
උපචිත වියදම්	(10,402,147.57)	8,970,091.63
ප්‍රත්‍යාගණන සංචිත	(13,970,549.41)	-
රඳවාගත් මුදල්	137,351.15	-
NNL පරීක්ෂණ - රියදුරු	(192,550.00)	(8,655,559.00)
මෙහෙයුම්වලින් ජනනය වන මුදල්	7,839,912.63	(11,925,749.01)
පාරිතෝෂික ගෙවීම්	(5,278,930.00)	(8,297,889.01)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	2,560,982.63	(20,223,638.02)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම	(16,201,411.80)	(2,032,127.53)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	(16,201,411.80)	(2,032,127.53)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
වර්ෂය තුල ලද ශුද්ධ අරමුදල්	15,808,000.00	300,000.00
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	15,808,000.00	300,000.00
මුදල් හා මුදල්වලට සමාන දේවල්වල ශුද්ධ වෙනස්වීම්	**2,167,570.83**	**(21,955,765.55)**
ආරම්භක මුදල් ශේෂය	**5,190,924.75**	**27,146,690.30**
අවසන් මුදල් ශේෂය	**7,358,495.58**	**5,190,924.75**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය (අ.ඖ.පා.ජා.ම)

2023.12.31 අවසන් වර්ෂය සඳහා ස්කන්දය වෙනස් වීමේ ප්‍රකාශය

	දායක ප්‍රාග්ධනය	අනෙකුත් සංචිත	පරිවර්ථන සංචිත	සමුච්චිත අතිරික්තය/ (ඌණතාවය)	ඇක්චුරියල් ලාභය/අලාභය	එකතුව
2020 දෙසැම්බර් 31 ශේෂය	90,264,946.94	462,720,932.38	65,984,610.57	(157,586,785.82)		461,383,704.07
වර්ෂය තුළ ප්‍රාග්ධන ප්‍රදාන	16,473,000.00	-	-	-	-	16,473,000.00
පෙර වර්ෂ ගැලපුම්	-	-	-	(1,380,335.08)	-	(1,380,335.08)
WIP ගොඩනැගිලි තක්සේරුව	-	970,549.41	-	-	-	970,549.41
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/ හිඟය	-	-	-	15,018,049.32	-	15,018,049.32
2021 දෙසැම්බර් 31 ශේෂය	106,737,946.94	463,691,481.79	65,984,610.57	(143,949,071.58)		492,464,967.72
වර්ෂය තුළ ප්‍රාග්ධන ප්‍රදාන	300,000.00	-	-	-	-	300,000.00
පෙර වර්ෂ ගැලපුම්	-	-	-	(633,811.91)	-	(633,811.91)
	-	-	(295,214.77)	-	-	(295,214.77)
තක්සේරුව	-	110,539,673.72	-	-	-	110,539,673.72
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/ හිඟය	-	-	-	(48,359,337.21)	-	(48,359,337.21)
2022 දෙසැම්බර් 31 ශේෂය	107,037,946.94	574,231,155.51	65,689,395.80	(192,942,220.70)	-	554,016,277.55
වර්ෂය තුළ ප්‍රාග්ධන ප්‍රදාන	15,808,000.00	-	-	-	-	15,808,000.00
ඇක්චුරියල් ලාභය/අලාභය	-	-	-	-	18,587,724.41	18,587,724.41
පෙර වර්ෂ ගැලපුම් (සටහන 28)	-	-	-	4,781,332.25	-	4,781,332.25
තක්සේරුව	-	(13,970,549.41)	-	-	-	(13,970,549.41)
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/ හිඟය	-	-	-	(2,248,627.15)	-	(2,248,627.15)
2023 දෙසැම්බර් 31 ශේෂය	122,845,946.94	560,260,606.10	65,689,395.80	(190,409,515.60)	18,587,724.41	576,974,157.65

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය (අ.ඖ.පා.ජා.ම)

2023 දෙසැම්බර් 31 අවසන් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්

සටහන 1

රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්ථන	2023	2022
	රු.	රු.
ජනවාරි	15,010,000.00	16,000,000.00
පෙබරවාරි	14,500,000.00	20,000,000.00
මාර්තු	27,660,000.00	21,750,000.00
අප්‍රේල්	18,000,000.00	16,000,000.00
මැයි	32,818,000.00	15,000,000.00
ජුනි	18,000,000.00	26,000,000.00
ජූලි	15,000,000.00	15,000,000.00
අගෝස්තු	31,896,000.00	15,000,000.00
සැප්තැම්බර්	15,000,000.00	21,500,000.00
ඔක්තෝබර්	26,025,000.00	21,500,000.00
නොවැම්බර්	24,040,000.00	24,100,000.00
දෙසැම්බර්	25,768,000.00	23,000,000.00
	263,717,000.00	**234,850,000.00**

සටහන 2

වෙනත් ආදායම්	2023	2022
	රු.	රු.
පොල් ආදායම	1,464,062.00	1,734,826.50
ආපදා ණය හා උත්සව අත්තිකාරම් පොළිය	636,865.99	712,941.60
උපදේශන පාඨමාලා ආදායම්	3,588,175.00	758,475.00
මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පාඨමාලාව	2,068,950.00	2,585,500.00
වාහනය මත රජයේ ගාස්තු	6,000.00	5,935.48
වෙනත් ආදායම්	1,102,521.77	52,178.00
රසායනාගාර ආදායම්	4,351,000.00	1,406,500.00
වැටුප් ආපසු ගෙවීම්	468,678.97	339,073.94
ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුව	24,000.00	15,000.00
පුරෝගාමී පාලන අධිකාරියෙන් ලද ආදායම්	1,223,500.00	1,232,500.00
නේවාසික හා පරිපාලන ගාස්තු	1,700,000.00	720,000.00
පර්යේෂණ පොත් විකුණුම්	9,400.00	11,600.00
වෘත්තිමය අයිතම විකුණුම්	-	45,000.00
පරිත්‍යාග නවදිගන්තය	8,084,937.65	-
අයදුම්පත් ගාස්තු	398,000.00	-
සිම්පෝසියම්	9,000.00	15,000.00
	25,135,091.38	**9,634,530.52**

සටහන 3

ඉවත් කිරීමෙන් ලද ලාභය

	2023 රු.	2022 රු.
ඉවත් කල ස්ථාවර වත්කම් වල පිරිවැය	487,848.27	3,249,498.43
ඉවත් කල ස්ථාවර වත්කම් වල සමුච්චිත ක්ෂය	(105,514.80)	(3,155,466.89)
ඉවත් කල ස්ථාවර වත්කම්වලින් විකුණුම් ආදායම	31,670.00	(87,430.00)
	350,663.47	**6,601.54**

සටහන 4

පුද්ගල හා පරිපාලන පිරිවැය

	2023 රු.	2022 රු.
විගණන හා කළමනාකරණ රැස්වීම් ගාස්තු	154,000.00	128,000.00
මණ්ඩල රැස්වීම් ගාස්තු	850,000.00	738,600.00
සේවා නියුක්ති භාරකාර අරමුදල	3,382,673.74	3,880,852.21
සේවක අර්ථසාධක අරමුදල	13,530,694.03	15,238,870.78
අතිකාල දීමනා	4,726,045.73	3,906,441.31
වැටුප් හා වේතන	128,591,144.45	144,268,570.99
සේවා පාරිතෝෂික	10,355,209.34	12,278,512.76
SHE රක්ෂණය	1,332,882.68	727,794.08
ප්‍රවාහනය	72,859.00	634,513.80
ගමන් වියදම් - විදේශිය	2,362,941.97	-
ගමන් වියදම් - දේශිය	2,930,526.50	1,726,848.00
	168,288,977.44	**183,529,003.93**

සටහන 5

වෙනත් මෙහෙයුම් පිරිවැය

	2023 රු.	2022 රු.
පුවත්පත් දැන්වීම්	232,484.00	143,802.00
විගණන ගාස්තු	1,000,000.00	1,000,000.00
විදුලි බිල්පත්	7,972,211.58	4,436,717.42
ඉන්ධන	6,207,090.99	5,452,216.28
අන්තර්ජාල සේවා	1,284,527.21	1,526,605.03
සනීපාරක්ෂක සේවා	2,587,620.00	2,284,325.00
ගොඩනැගිලි අළුත්වැඩියාව	538,873.00	727,501.45
මෝටර් රථ අළුත්වැඩියාව	4,210,114.84	2,511,650.68
කාර්යාල උපකරණ අළුත්වැඩියාව	4,026,810,75	3,000,036.56
විවිධ වියදම්, සංග්‍රහ වියදම්	602,185,20	404,120.50
පුවත්පත්, වාරසඟරා හා ප්‍රකාශන	179,963.75	118,620.00

කෘමිනාශක	39,600.00	62,540.00
තැපැල් ගාස්තු	237,690.00	146,748.00
මුද්‍රණ, ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	4,182,708.12	1,708,718.00
වරිපනම් බදු	464,017.63	408,702.18
ආරක්ෂක වියදම්	7,991,200.00	8,052,800.00
සේවක නිලඇඳුම්	108,000.00	116,000.00
දුරකථන බිල්පත්	1,426,587.50	1,371,379.34
පරිවර්ථන, විමර්ෂණ හා තාක්ෂණ ගාස්තු	486,073.24	166,158.12
ජල සැපයුම්	2,110,868.93	1,694,155.94
	45,888,626.74	**35,332,796.50**

සටහන 6

නිවාරණ අධ්‍යාපන අංශය පිරිවැය

	2023 රු.	2022 රු.
නිවාරණ අධ්‍යාපන හා මහජනතාව දැනුවත් කිරීම්	740,697.00	463,570.00
මත්ද්‍රව්‍ය විරෝධී දින වැඩසටහන	115,520.00	9,340.00
නිවාරණ අධ්‍යාපන ක්ෂේත්‍ර දීමනා	1,045,190.31	1,086,428.32
මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පාඨමාලාව - වියදම්	1,328,005.00	981,590.00
	3,229,412.31	**2,540,928.32**

සටහන 7

ප්‍රතිකාර හා පුනරුත්ථාපන පිරිවැය

	2023 රු.	2022 රු.
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - ආහාර	34,534,405.00	42,782,779.00
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - වෙනත්	1,391,325.52	1,507,875.63
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - බෙහෙත්	132,069.00	106,473.58
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - වෛද්‍ය ගාස්තු	50,000.00	38,750.00
පසුරුකවරණ වැඩසටහන්	846,359.00	47,184.82
	36,954,158.52	**44,483,063.03**

සටහන 8

පර්යේෂණ අධ්‍යයන වියදම්

	2023 රු.	2022 රු.
පර්යේෂණ අධ්‍යයනය	1,259,650.00	899,552.00
මත්ද්‍රව්‍ය උපදේශන සේවා වියදම්	1,263,041.50	77,900.00
	2,522,691.50	**977,452.00**

සටහන 9

බාහිර සේවා වියදම

	2023 රු.	2022 රු.
බාහිර සේවා ජංගම වැඩසටහන් සහ වෙනත්	1,842,060.26	489,837.11

බාහිර සේවා ක්ෂේත්‍ර දීමනා	2,360,761.69	2,166,570.57
	4,202,821.95	**2,656,407.68**

සටහන 10

ජාතික මාදක රසායනාගාර වියදම්

	2023 රු.	2022 රු.
රසායනාගාර අවශ්‍යතා සහ රසායනික ද්‍රව්‍ය	7,806,326.56	1,536,732.78
ජාතික මාදක රසායනාගාර පුහුණු වැඩසටහන්	-	1,300.00
	7,806,326.56	**1,538,032.78**

සටහන 11

බන්ධනාගාර සහ වෙනත් ප්‍රතිකාර මධ්‍යස්ථාන

	2023 රු.	2022 රු.
බන්ධනාගාර සහ වෙනත් ප්‍රතිකාර මධ්‍යස්ථාන	219,132.00	52,424.00
	219,132.00	**52,424.00**

සටහන 12

මානව සම්පත් සංවර්ධන වියදම්

	2023 රු.	2022 රු.
කාර්ය මණ්ඩල පුහුණු වියදම්	297,500.00	(77,250.00)
	297,500.00	**(77,250.00)**

සටහන 13

මූල්‍ය පිරිවැය

	2023 රු.	2022 රු.
බැංකු ගාස්තු	79,080.00	71,835.00
	79,080.00	**71,835.00**

සටහන 14

ක්ෂයවීම් සහ වෙනත්

	2023 රු.	2022 රු.
ක්ෂයවීම්	21,261,328.04	21,732,572.95
	21,261,328.04	**21,732,572.95**

සටහන 15

අතැති හා බැංකුවේ මුදල්

	2023 රු.	2022 රු.
ලංකා බැංකුව -ආයතනික ශාඛා- 1643	3,138,851.62	962,731.49
ලංකා බැංකුව -රාජගිරිය ශාඛා- 0003270702	36,660.90	49,660.90
ලංකා බැංකුව -රාජගිරිය ශාඛා- 0071810523	4,182,983.06	4,178,532.36
	7,358,495.58	**5,190,924.75**

සටහන 16

තොග	2023	2022
	රු.	රු.
රසායනික ද්‍රව්‍ය තොගය	2,249,747.49	2,468,887.14
ලිපිද්‍රව්‍ය තොගය	2,447,108.06	2,582,802.51
	4,696,855.55	**5,051,689.65**

සටහන 17

පෙර ගෙවීම්	2023	2022
	රු.	රු.
වාහන රක්ෂණ හා බලපත්‍ර ගාස්තු	-	243,751.78
කාර්යාල උපකරණ නඩත්තුව		
සිලෝන් බිස්නස් ඇප්ලයන්ස්	20,408.66	15,700.02
ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන්	26,318.00	2,796.16
මෙට්රෝපොලිටන්	94,076.23	46,285.15
ට්‍රේඩ් ප්‍රමෝටර්	94,514.50	71,637.50
හේලිස් ඇවෙන්චුරා	-	566,517.60
සොෆ්ට්විෂන්	40,000.00	39,978.08
ඔෆිස්නෙට්වර්ක්	26,613.37	6,983.00
ෆ්‍රොස්ට්එයාර් ඉන්ජිනියරින්	16,229.51	-
ටෙලිසොනික් ලංකා	28,432.24	-
ක්‍රාෆ්ට් ලංකා	7,205.41	-
ග්ලෝබල් ටෙක් එයා කන්ඩිෂනින්	12,737.70	-
අබාන්ස් ඉලෙක්ට්‍රිකල්	14,854.86	-
ඔෆිස්ට්‍රොනික්ස්	28,927.60	-
සිංගර් ශ්‍රී ලංකා	32,684.15	-
කෝල් ට්‍රේඩින් කම්පැනි	22,233.33	-
වරිපනම් බදු	31,594.52	31,594.52
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්	3,969,672.32	-
වසරට අදාල මුළු පෙර ගෙවීම්	**4,466,502.40**	**1,025,243.81**

සටහන 18

අත්තිකාරම්	2023	2022
	රු.	රු.
මත්ද්‍රව්‍ය තොරතුරු පුනරුත්ථාපන සහ පර්යේෂණ මධ්‍යස්ථාන	747.00	747.00
ජාතික අධ්‍යාපන ආයතනය	27,725.50	27,725.50

මත්ද්‍රව්‍ය අධ්‍යාපන ආයතනය	4,572.00	4,572.00
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	15,000.00	15,000.00
අධ්‍යක්ෂ - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව	138,800.00	138,800.00
කොළඹ මධ්‍යස්ථානය	1,160,250.00	1,160,250.00
ඉන්ඩෝසෝල් ප්‍රයිවට් ලිමිටඩ්	6,652.50	6,652.50
බර්නර් මාසල් පබ්ලිෂර්	4,867.00	4,867.00
නියෝජ්‍ය අධ්‍යක්ෂ	1,800.00	1,800.00
මැතිවරණ රාජකාරී	5,617.50	5,617.50
කළමණාකරු- මහනුවර මධ්‍යස්ථානය	32,553.00	32,553.00
කළමණාකරු - නවදිගන්ත මධ්‍යස්ථානය	15,700.00	15,700.00
රජයේ මුද්‍රණ සංස්ථාව	19,750.00	19,750.00
කළමණාකරු- ගාල්ල මධ්‍යස්ථානය	500.00	500.00
	1,434,534.50	**1,434,534.50**

සටහන 19

තැන්පතු	2023	2022
	රු.	රු.
දයා බිල්ඩර්ස් (පී. ඒ ආරියදාස සහ පුත්‍රයෝ)		
ඉන්ධන තැන්පතු	100,000.00	100,000.00
විදුලි සංදේශන තැන්පතු		
විදේශීය සහ නව දුරකථන ජාල තැන්පතු	25,250.00	25,250.00
ශ්‍රී ලංකා ටෙලිකොම්		
අයි.ඩී.ඩී තැන්පතු	5,000.00	5,000.00
ජී.ඕ.බී.යූ. සිලෝන් ගෑස් කම්පැනි		
සිලින්ඩර් තැන්පතු	750.00	750.00
කලම්බු ගෑස් ඇන්ඩ් වෝටර් කම්පැනි ලිමිටඩ්		
කි.ග්‍රෑම් 40 සිලින්ඩර් තැන්පතු	5,000.00	5,000.00
සිලෝන් ඔක්සිජන් ලිමිටඩ්		
ගෑස් සිලිනඩර් තැන්පතු	38,500.00	38,500.00
ලංකා විදුලි බල මණ්ඩලය		
ආරක්ෂණ තැන්පතු	-	-
ව්‍යාපෘති කාර්යාලය	3,500.00	3,500.00

බස්නාහිර පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	20,000.00	20,000.00
මහනුවර ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	6,750.00	6,750.00
දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	11,500.00	11,500.00
නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	20,000.00	20,000.00
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය		
ජල සැපයුම් තැන්පතු		
මහනුවර ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	5,000.00	5,000.00
දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	1,000.00	1,000.00
හේවාගම් කෝරලයේ බස්නාහිර විවිධ සේවා සමූපකාර සමිතිය		
වියලි සලාක තැන්පතුව	7,500.00	7,500.00
බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය		
තෙල් තැන්පතුව	6,000.00	6,000.00
නුවර විවිධ සේවා සමූපකාර සමිතිය		
වියලි සලාක තැන්පතුව	5,000.00	5,000.00
තෙල් තැන්පතුව	20,000.00	20,000.00
ගාල්ල විවිධ සේවා සමූපකාර සමිතිය		
වියලි සලාක තැන්පතුව හා ඉන්ධන තැන්පතුව	25,000.00	25,000.00
අත්තනගල්ල විවිධ සේවා සමූපකාර සමිතිය		
වියලි සලාක තැන්පතුව	48,000.00	48,000.00
ඉන්ධන තැන්පතුව	102,000.00	102,000.00
නාගරික කොමසාරිස් නුවර		
ගොඩනැගිලි කුලී තැන්පතුව	1,050.00	1,050.00
ශ්‍රී ලංකා නේෂන් අර්බිට්‍රේෂන් සෙන්ටර්		
මධ්‍යස්ථාන වෙන්කිරීමේ තැන්පතුව	7,500.00	7,500.00
ඇමරිකන් ප්‍රිමියම් වෝටර් සිස්ටම් (පුද්) සමාගම		
උනුසුම් හා සීතල ජල උපකරණයේ තැන්පතුව	8,000.00	8,000.00
පෝස්ට් මාස්ටර් ජෙනරාල් - ෆ්‍රෑන්කින් මැෂින්	50,000.00	50,000.00
බී.එම්.අයි.සී.එච්. තැන්පතුව	5,000.00	5,000.00
ඩයලොග්	5,000.00	5,000.00
මොබිටෙල්	2,000.00	2,000.00

එම්.ටී.එන් නෙට්වර්ක්	3,000.00	3,000.00
එස්.එල්.ටී. අනුරාධපුර පලාත් කාර්යාලය	4,525.20	4,525.20
එස්.එච්.ඊ. ඉන්ෂුවරන්ස්	1,487.76	1,487.76
සෝඩන්ස් - ගෑස් සිලින්ඩර්	1,500.00	1,500.00
සිලෝන් ඔක්සිජන් ලිමිටඩ් - සිලින්ඩර් තැන්පතු	152,000.00	152,000.00
	696,812.96	**696,812.96**

සටහන 21

ප්‍රාග්ධන WIP නව ගොඩනැගිලි	2023 රු.	2022 රු.
සත්මහල් ගොඩනැගිල්ල	-	556,142.20
වෛද්‍ය තාබුගල - නේවාසිකාගාරය	3,529,450.59	4,500,000.00
UNODC	-	13,000,000.00
	3,529,450.59	**18,056,142.20**

සටහන - 22

දේපළ, පිරියත සහ උපකරණ

පිරිවැය/තක්සේරු අගය	ඉඩම් රු.	ගොඩනැගිලි රු.	කාර්යාල උපකරණ රු.	ලී බඩු උපකරණ රු.	සවිකිරීම් රු.	රථවාහන රු.	මුළු වටිනාකම රු.
2023.01.01 දිනට ආරම්භක ශේෂය	392,685,018.80	209,396,184.71	17,949,084.12	10,628,550.00	6,210,882.77	43,265,362.00	680,135,082.40
එකතු කිරීම්/ ප්‍රත්‍යාගණන	-	8,196,519.83	7,004,150.68	-	4,175,568.82	-	19,376,239.33
ඉවත්කිරීම් සඳහා ගැළපීම්	-	-	223,858.70	263,989.70	-	-	487,848.27
2023.12.31 දිනට අවසාන ශේෂය	392,685,018.80	217,592,704.54	24,729,376.23	10,364,560.30	10,386,451.59	43,265,362.00	699,023,473.46
ක්ෂයවීම්							
2023.01.01 දිනට ආරම්භක ශේෂය	-	58,078,717.94	3,512,954.12	1.062,855.00	1,227,006.69	43,265,362.00	107,146,895.75
2023 සඳහා	-	9,192,133.81	3,655,322.89	1,037,616.02	1,267,688.12	-	15,152,760.84
ප්‍රත්‍යාගණන/ ඉවත්කිරීම්	-	-	53,716.80	51,798.00	-	-	105,514.80
2023.12.31 දිනට ක්ෂය වෙන් කිරීම්	-	67,270,851.75	7,114,560.21	2,047,673.02	2,494,694.81	43,265,362.00	122,194,141.79
2023.12.31 දිනට ලියාහල වටිනාකම	392,685,018.80	150,321,852.79	17,614,816.02	8,315,887.28	7,891,756.78	-	576,829,331.67

පිරිවැය/තක්සේරු අගය	පුස්තකාල පොත්	මුළුතැන්ගේ උපකරණ	උද්‍යාන උපකරණ	විද්‍යාගාර උපකරණ	වෙනත් පිරියත හා උපකරණ	කල්බදු දේපළ	මුළු වටිනාකම
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2023.01.01 දිනට ආරම්භක ශේෂය	1,484,155.67	452,500.00	831,080.00	44,667,000.82	5,667,806.20	1,013,262.20	54,115,804.89
එකතු කිරීම්/ ප්‍රත්‍යාගණන	-	-	-	1,107,813.40	3,552,388.52	-	4,660,201.92
ඉවත්කිරීම් සඳහා ගැළපීම්	-	-	-	65,934.00	-	-	65,934.00
2023.12.31 දිනට අවසාන ශේෂය	1,484,155.67	452,500.00	831,080.00	45,708,880.22	9,220,194.72	1,013,262.20	58,710,072.81
ක්ෂයවීම්							
2023.01.01 දිනට ආරම්භක ශේෂය	1,477,869.19	90,500.00	166,216.00	32,561,717.94	1,073,712.37	918,585.61	36,288,601.11
2023 සඳහා	6,286.48	90,500.00	166,216.01	4,665,940.20	1,158,099.07	21,525.44	6,108,567.20
ප්‍රත්‍යාගණන/ ඉවත්කිරීම්	-	-	-	4,696.67	-	-	4,696.67
2023.12.31 දිනට ක්ෂය වෙන් කිරීම්	1,484,155.67	181,000.00	332,432.01	37,222,961.47	2,231,811.44	940,111.05	42,392,471.64
2023.12.31 දිනට ලියාහල වටිනාකම	-	271,500.00	498,647.99	8,485,918.75	6,988,383.28	73,151.15	16,317,601.17

පිරිවැය/තක්සේරු අගය	මෘදුකාංග රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2023.01.01 දිනට ආරම්භක ශේෂය	928,085.00	-	-	-	-	-	928,085.00
එකතු කිරීම්/ ප්‍රත්‍යාගණන	-	-	-	-	-	-	-
ඉවත්කිරීම් සඳහා ගැළපීම්	-	-	-	-	-	-	-
2023.12.31 දිනට අවසාන ශේෂය	928,085.00	-	-	-	-	-	928,085.00
ක්ෂයවීම්							
ක්ෂයවීම්		-	-	-	-	-	-
2023.01.01 දිනට ආරම්භක ශේෂය	928,085.00	-	-	-	-	-	928,085.00
2023 සඳහා	-	-	-	-	-	-	-
ප්‍රත්‍යාගණන/ ඉවත්කිරීම්	-	-	-	-	-	-	-
2023.12.31 දිනට ක්ෂය වෙන් කිරීම්	928,085.00	-	-	-	-	-	928,085.00
2023.12.31 දිනට ලියාහල වටිනාකම	-	-	-	-	-	-	-

2023 වර්ෂය සඳහා ශුද්ධ වත්කම්	**593,146,932.84**
මුළු ක්ෂයවීම්	**21,261,328.04**

දැන ගැනීම සඳහා

මෘදුකාංග මේවන විටත් ක්ෂය කර අවසන් වී ඇත.

සටහන 23

විවිධ ණයහිමියෝ

	2023 රු.	2022 රු.
සිලෝන් බිස්නස් ඇප්ලයන්සස්	2,220.00	2,220.00
එස්.ඩී.ජී.ආර්.එස් විමලසිංහ	30,000.00	30,000.00
රුක්මල් ජයවර්ධන	2,000.00	2,000.00
ටී.ඩී.ආර්.ඩී. ධර්මරත්න	30,000.00	30,000.00
ටී.ජී.ටී.එස්. සුමනරත්න	10,000.00	10,000.00
එච්.එම්.සි.සි. බණ්ඩාර	-	20,000.00
පී.පී.ඩී.එන්.එස්. මුතුකුමාර	-	30,000.00
එ.පී.පී. ගුණරත්න	30,000.00	30,000.00
එම්.ජී.යූ.කේ චන්ද්‍රසිරි	30,000.00	-
	134,220.00	**154,220.00**

සටහන 24

උපචිත වියදම්

	2023 රු.	2022 රු.
විගණන ගාස්තු	1,000,000.00	1,000,000.00
බැංකු ගාස්තු	-	7,935.00
මත්ද්‍රව්‍ය උපදේශන පාඨමාලා	-	14,000.00
විදුලි බිල්පත්	662,969.58	387,708.10
ඉන්ධන	281,057.70	277,810.00
පාරිතෝෂික ගෙවීම්	1,726,635.00	6,193,135.00
නිවාඩු දින ගෙවීම්	110,782.25	76,314.50
අන්තර්ජාල සේවා	110,203.18	103,833.19
සනීපාරක්ෂක සේවා	206,180.00	188,960.00
මෝටර්රථ අළුත්වැඩියාව	81,490.00	501,440.00
කාර්යාල උපකරණ අළුත්වැඩියාව	-	423,775.00
ගොඩනැඟිලි අළුත්වැඩියාව	-	40,600.00
දෛනික වැටුප්	17,000.00	-
පුවත්පත්, වාරසඟරා හා ප්‍රකාශන	8,540.00	19,530.00
බාහිර සේවා ක්ෂේත්‍ර දීමනා	222,154.74	271,107.13
බාහිර සේවා ජංගම වැඩසටහන් සහ වෙනත්	-	13,730.00
අතිකාල දීමනා	798,042.05	379,435.96
නිවාරණ අධ්‍යාපන ක්ෂේත්‍ර දීමනා	73,404.75	104,428.56
ආරක්ෂක වියදම්	666,400.00	672,000.00
ගෙවිය යුතු මුද්දර ගාස්තු	55,125.00	59,825.00
දුරකථන බිල්පත්	88,299.11	122,116.11

පරිවර්ථන, විමර්ෂණ හා තාක්ෂණික ගාස්තු	162,825.00	4,200.00
ගමන් වියදම් - දේශීය	519,564.50	315,478.00
පසුරැකවරණ වැඩසටහන්	91,040.00	-
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - ආහාර	2,280,025.00	8,418,375.00
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - වෛද්‍ය	7,500.00	6,250.00
ජල සැපයුම්	135,851.32	82,098.45
උපයන විට බදු	8,400.00	600.00
ආපදා ණය	5,037.00	-
වැටුප් හා වේතන	12,800.00	-
වෙනත් වියදම්	-	45,000.00
ගෙවල් කුලී	-	3,788.75
	9,331,326.18	**19,733,473.75**

සටහන 25

රඳවාගත් මුදල්

	2023 රු.	2022 රු.
ගාල්ල හෝජනාගාරය ඉදිකිරීම	169,540.00	169,540.00
හැන්ඩිමෑන් - බිත්ති තීන්ත	26,600.00	26,600.00
කෝට්ටේ යෞවන සමාජය- ප්‍රධාන කාර්යාලය	137,351.15	-
	333,491.15	**196,140.00**

සටහන 26

පාරිතෝෂික

	2023 රු.
මූල්‍ය තත්ව ප්‍රකාශනය තුල හඳුනාගෙන ඇති අගයන් පහත පරිදි වේ.	
වගකීම්වල වර්තමාන අගය	307,076,330.00
මූල්‍ය තත්ව ප්‍රකාශනය තුල හෙළිදරව් කර ඇති මුළු වගකීම්	307,076,330.00

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 "සේවක ප්‍රතිලාභ", මගින් නිර්දේශ කර ඇති, "පුරෝකථනය කල ණය ඒකක ක්‍රමය" භාවිත කොට ප්‍රතිලාභ හඳුනා ගෙන ඇත.

වර්ෂය සඳහා හඳුනාගෙන ඇති ප්‍රතිලාභ වල වෙනස

	රු.
වර්ෂයේ ආරම්භක ශේෂය	63,152,175.00
වර්තමාන සේවා පිරිවැය	2,776,948.34
පොළි පිරිවැය	7,578,261.00
නිවැරදි ලාභය/ (අලාභය)	(24,130,873.90)
	49,376,510.43

වර්ෂය තුළ ගෙවීම්	(6,520,350.00)
වර්ෂයේ අවසාන ශේෂය	42,856,160.43

ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගෙන ඇති අගයන් පහත පරිදි වේ.

	රු.
වර්තමාන සේවා පිරිවැය	2,776,948.34
පොළි පිරිවැය	7,578,261.00
සේවක පිරිවැය තුළ ඇතුලත් මුළු එකතුව	10,355,209.34
නිවැරදි ලාභය/ (අලාභය)	(24,130,873.90)
ආදායම් ප්‍රකාශනය තුළ ඇති මුළු එකතුව	(13,775,664.57)

මෙහිදී කළමනාකරණය විසින් කරන ලද මූලික උපකල්පනයන්

පොළී අනුපාත (බදු රහිත)	12%
අපේක්ෂිත වැටුප් වැඩිවීම	7%
සේවක පිරිවැටුම	5%
විශ්‍රාම වයස	අවු 60
සේවක සංඛ්‍යාව	215

මණ්ඩලයේ මෙහෙයුම් සඳහා අඛණ්ඩ පැවැත්මක් ඇතිබව ලෙස උපකල්පනය කර ඇත.

සටහන 27	**2023**	**2022**
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	**රු.**	**රු.**
ඉදිරියට ගෙන ආ ශේෂය	107,037,946.94	106,737,946.94
ජනවාරි	-	-
පෙබරවාරි	-	-
මාර්තු	-	-
අප්‍රේල්	-	-
මැයි	-	-
ජුනි	-	-
ජූලි	-	-
අගෝස්තු	2,000,000.00	-
සැප්තැම්බර්	-	300,000.00
ඔක්තෝබර්	5,450,000.00	-
නොවැම්බර්	-	-
දෙසැම්බර්	8,358,000.00	-
	122,845,946.94	**107,037,946.94**

සටහන 28

පෙර වසරේ ගැළපුම්

රසායනාගාර උපකරණ ගැළපීම් නිවැරදි කිරීම	61,237.33
ගොඩනැඟිලි ගැළපීම් නිවැරදි කිරීම	556,142.20
පාරිතෝෂික වෙන් කිරීම නිවැරදි කිරීම	(6,209,154.49)
උපචිත වියදම්	(5,073.34)
මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පාඨමාලාව	20,575.00
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - ආහාර	666,975.00
වෙනත් දීමනා	12,712.90
පුවත්පත්, වාරසඟරා හා ප්‍රකාශන	1,520.00
දුරකථන	26,903.47
ආපදා ණය	7,856.30
වැටුප් හා වේතන	30,288.38
මුද්දර ගාස්තු	25.00
වෙනත් වියදම්	30,220.00
විගණන ගාස්තු	18,440.00
	(4,781,332.25)

සටහන 29

අවිනිශ්චිත ගිණුමේ ශේෂය මඟින් නියෝජනය කරනුයේ, 2015 වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත්කර ඇති, එහෙත් මේ දක්වා නොසැසඳූ ශේෂයයි.